
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை
National Child Protection Authority



මුතු වට්ටිය

කතාව සහ චිත්‍ර
කුසලා වෙත්තසිංහ

මුතු වට්ටිය



කතාව සහ චිත්‍ර
කුසලා වෙත්තසිංහ

මුතු වට්ටිය

ළමයා හා නීතිය සම්බන්ධයෙන්
6 සහ 7 යන වසරවල සිසුන් සඳහා රචිත ළමා නවකතාවකි

නීතිය සම්බන්ධ විෂයාත්මක මග පෙන්වීම
සහ තාක්ෂණික තොරතුරු සැපයීම
නීතිය සහ ළමයා පිළිබඳ කමිටුව
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

මූලිකත්වය සහ මගපෙන්වීම
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

කතාව සහ චිත්‍ර
කුසලා වෙත්තසිංහ



ප්‍රකාශනය
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

පටුන

මුතු වට්ටිය..... ii

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිතුමියගේ
පණිවුඩය v

මේ කතාවේ කවුද ඉන්නෙ? 1

පන්තියේ මුල් දවස - සඳුන් කැටේ, සබන් කැටේ 6

අලුත් දවස - පාසල් යන දෙවැනි දවස..... 11

මුතු වට්ටිය ගඟේ ගිහින්.... 16

මුතු වට්ටිය නැති වුණු හැටි..... 20

ගං ඉවුරේ පන්තියක් ද? 25

හඳ මාමාගෙ හොරකම 37

පාරුවේ කතා 49

මුතු වට්ටිය ගෙනාවෝ!..... 64

සඳුන් කැටේ - මැණික් කැටේ..... 70

මුතු වට්ටිය

පළමුවන මුද්‍රණය 2025
© කුසලා වෙත්තසිංහ

ISBN 978-624-6237-01-1

9 786246 237011

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை
National Child Protection Authority

ප්‍රකාශනය
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

පිටු සැලසුම
ආදිත් ප්‍රකාශන (පෞද්ගලික) සමාගම

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිතුමියගේ පණිවුඩය

පුංචි ළමුන් මල් වගේ. මල් පෙත්තක් තරම්වත් නොමේරූ සිත් ඇති දුවා දරුවන් වන ඔබ සරු ඵල දරන ගසක් මෙන් වැඩෙන්නට සුරක්ෂිත ලොවක් තැනීම අපේ වගකීමයි. ඔබ වටා ඇති ආරක්ෂක පවුර ඔබේ පවුල, ඔබේ භාරකරු හෝ ඔබ වටා ඇති සමාජයයි.

ආදරය කරුණාව සිත දරන වැඩිහිටියන් වන්නේ අද දවසේ නීතිගරුකව හැදෙන පුංචි ඔබයි. ප්‍රාථමික අධ්‍යාපනය නිමාකර ද්විතියික අධ්‍යාපනය ආරම්භ කරන පුංචි ඔබට, ඔබේ ආරක්ෂාව වෙනුවෙන් නීතිය පිළිබඳ දැනුම ලබා දීම අද වන විට කාලීන අවශ්‍යතාවක් බවට පත්ව තිබේ.

ඔබ වැනි ළමුන් කායික, මානසික, ලිංගික අපයෝජන සහ නොසලකා හැරීම් යන ළමා අපයෝජනවල ගොදුරක් බවට පත්වීම වැළැක්වීම සහ එසේ අපයෝජනයට පත්වූ ළමුන් ආරක්ෂා කරගැනීම වෙනුවෙන් කුඩා කල සිට වයසට සරිලන නීතිය පිළිබඳ දැනුමක් ලබාගැනීම වැදගත් වේ. ගුණ ධර්මවලින් සුපෝෂිත සංස්කෘතියකට උරුමකම් කියන අප රට තුළ දිනෙන් දින ළමා අපයෝජන වාර්තාවීම් වැඩිවීමට විවිධ සමාජ, ආර්ථික කාරණා බලපාන බව එම සිද්ධි තුළින් අපට පැහැදිලි වී ඇත.

සමාජය තුළ වෙසෙන ඇතැම් මිනිසුන්ගේ වැරදි ක්‍රියාවලට හසුවීමත්, පාසල් වයසේ වැඩිහිටි ළමුන්ගේ පෙළඹවීමත් මත ඔබ වැනි ළමුන් අපරාධවල කොටස්කරුවන් බවට පත් වේ. ශාරීරික දඬුවමට හා මානසික වදහිංසාවලට බඳුන්වීම, සයිබර් අවකාශයේ අපයෝජනයට ලක්වීම, ලිංගික අතවරයට මෙන්ම අපයෝජනයට ලක්වීම තුළින් ළමා මව්වරුන් බවට පත්වීම, මත් උවදුරට ගොදුරුවීම මෙන්ම පාසල් අධ්‍යාපනය අඩාලවන අන්දමේ අපරාධ වැරදිවලට ළමුන් යොමුවීම අපට දක්නට ලැබේ. මෙම වින්දිත ළමුන් බොහෝමයක් දෙනා නොදැනුවත්භාවය නිසා හෝ අන් අයගේ පෙළඹවීම නිසා මෙම අපයෝජනවල ගොදුරු බවට පත්ව තිබේ. තවද, පවත්නා නීතිය අනුව එක් ළමයකුගේ යහපත වෙනුවෙන් තවත් ළමයකුට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට සිදුවන අවස්ථාද දකගත හැක.

නීතිය නොදැන සිටීම නිදහසට කරුණක් නොවේ යන ප්‍රසිද්ධ වැකිය පාදක කරගනිමින් අවුරුදු 12ට වැඩි ඔබ මෙවැනි අපරාධයක වැරදිකරුවකු නොවන්නට නම් ශ්‍රී ලංකාවේ නීතිය ළමුන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ආකාරය ආකර්ශනීය අයුරින් ළමා හිතකාමී ලෙස ඔබ වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය බව ජාතික ළමා

ආරක්ෂක අධිකාරිය විසින් විශ්වාස කරන ලදී. ඒ සඳහා කලක් තිස්සේ දරන ලද වෑයම මල්ඵල ගන්වමින්, ළමයා හා නීතිය විෂය සම්බන්ධයෙන් 6 සහ 7 වසරවල ඉගෙනුම ලබන ඔබ වෙනුවෙන් මුතු වට්ටිය නමින් මෙම ළමා නවකතාව නිර්මාණය කරන ලදී. නීති ක්ෂේත්‍රයේ සහ ළමා ආරක්ෂාවේ ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් දෙන ලද දැනුම කැටිකොට, ප්‍රවීණ ලේඛිකා කුසලා වෙත්තසිංහ මහත්මිය විසින් මෙම නවකතාව නිර්මාණය කර, ඒ තුළ නීතිය පිළිබඳ ඔබ දැනගත යුතු කරුණු මනාව පැහැදිලි කර ඇත.

ජාතික හා ජාත්‍යන්තර නීතිවලට ගරු කරන රටක් වශයෙන් ළමයාගේ උපරිම යහපත තහවුරු කිරීම වෙනුවෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ළමුන්ට මෙන්ම මහජනතාවට දැනුම ලබා දීම වෙනුවෙන් උචිත පියවර ගනිමින් කටයුතු කරන අතර දැයේ දරුවන් ආරක්ෂා කිරීම මූලික කාර්යය ලෙස සලකා කටයුතු කරනු ලැබේ.

ඉදින්, පුංචි ඔබ වෙත නීති විෂයෙහි මූලික දැනුම ගෙන එන අතර, එය ඔබට ඔබව ආරක්ෂා කරගැනීමට අප ලබා දෙන අවියක් ලෙස සිතන්නෙමි. වගකිවයුතු ගුණගරුක වැඩිහිටියෙකු වනු පිණිස මෙම කතාව මැනවින් කියවා දැනුමෙන් පෝෂණය වී අනාගත ළමා පරපුර සුරක්ෂිත කිරීමේ ජාතික කාර්යභාරයට ඔබත් කොටස්කරුවකු වන්න.

ප්‍රීති ඉනෝකා රණසිංහ

සභාපති
ජාතික ළමා ආරක්ෂක අධිකරිය

ළමයා හා නීතිය විෂය සම්බන්ධ 6 සහ 7 යන වසරවල සිසුන් සඳහා රචිත මුතු වට්ටිය ළමා නවකතාව අතිරේක කියවීම් පොතක් ලෙස මෙරට ළමා පරපුර වෙනුවෙන් දායාද කිරීමට තාක්ෂණික සහය හා නන් අයුරින් දායකත්වය ලබා දුන් විවිධ විෂය ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් කමිටුවේ සාමාජිකයන්ගේ නාම ලේඛණය:

මහාචාර්ය මුදිත විදානපතිරණ මහතා - හිටපු සභාපති (ජාතික ළමා ආරක්ෂක අධිකාරිය)

හිටපු මහාධිකරණ විනිසුරු සුජාතා අලහප්පෙරුම මහත්මිය - හිටපු නියෝජ්‍ය සභාපති (ජාතික ළමා ආරක්ෂක අධිකාරිය)

නීතිවේදී ශානිකා මලල්ගොඩ මහත්මිය - අධ්‍යක්ෂ - සැලසුම් හා තොරතුරු (ජාතික ළමා ආරක්ෂක අධිකාරිය)

නීතිඥ ප්‍රීතිකා සකලසූරිය මහත්මිය - අධ්‍යක්ෂ - නීති (ජාතික ළමා ආරක්ෂක අධිකාරිය)

නීතිඥ සජීවනී අබේකෝන් මහත්මිය - අධ්‍යක්ෂ - නීතිය බලාත්මක කිරීම (ජාතික ළමා ආරක්ෂක අධිකාරිය)

ජනාධිපති නීතිඥ ප්‍රසාන්ත ලාල් ද අල්විස් මහතා

ජනාධිපති නීතිඥ යූ. ආර්. ද සිල්වා මහතා

මහාචාර්ය වසන්තා සෙනෙවිරත්න මහත්මිය

මහාචාර්ය පීවා නිරිඇල්ල මහත්මිය

ආචාර්ය රෝස් විජේසේකර මහත්මිය

නීතිඥ ජේ. එම්. විජේ බණ්ඩාර මහතා

ආචාර්ය දර්ශන සුමනදාස මහතා

නීතිඥ සුජීව ලාල් දහනායක මහතා

විශේෂඥ මනෝ වෛද්‍ය ස්වර්ණා විජේතුංග මහත්මිය

කම්කරු කොමසාරිස් ඒ. එම්. ජී. එන්. දීප්ති සුමනසේන මහත්මිය

සායනික මනෝ විද්‍යාඥ ලක්මාල් පොන්නම්පෙරුම මහතා

වෛද්‍ය හේමමාල් ජයවර්ධන මහතා (UNICEF)

නීතිඥ රෙහානා ඩොලේ මහත්මිය (UNICEF)

කුසලා වෙත්තසිංහ මහත්මිය (මනෝසමාජයීය ක්‍රියාකාරි සහ ලේඛිකා)

කථිකාචාර්ය අයෝද්‍යා රත්නායක මෙනෙවිය (ජෙනරාල් ශ්‍රීමත් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය)

කථිකාචාර්ය උමානි ද සිල්වා මහත්මිය (ජාතික අධ්‍යාපන ආයතනය)

රන්ජන් වෙත්තසිංහ මහතා (Save the Children)

නීතිඥ චලනි එල්ලාවල මහත්මිය (කමිටු ලේකම්)

ලක්ෂිකා මැණික්බෝව මහත්මිය - සහකාර අධ්‍යක්ෂ - මාධ්‍ය හා තොරතුරු (ජාතික ළමා ආරක්ෂක අධිකාරිය)

පර්යේෂණ සහකරුවන්

නීතිඥ ඉසුර පණ්ඩිත මහතා

නීතිඥ ධනුක ලක්මාල් මහතා

නීතිඥ අමන්ද පාරමී කල්පශාක මෙනෙවිය

නීතිඥ හෂිනි කහලපආරච්චි මෙනෙවිය

මනිෂා පවනි හෙට්ටිආර්ච්චි මෙනෙවිය

මේ කතාවේ කවුද ඉන්නෙ?



මේ සඳුනි. නම සඳුනි වුණාට අම්මා තාත්තා, ආච්චි අම්මා සීයා තාත්තා කතා කරන්නේ චූටි දූ කියලා. අහල පහළ අයට නෑදෑයන්ට එයා සඳු. තවත් නමකුත් තියෙනවා. කතාව කියාගෙන යන අතරෙ තමයි ඒ ගැන කියන්න වෙන්නේ. සඳුනි නමේ පටලැවිල්ලෙන් තමයි ඔක්කොම පටන්ගත්තේ...



මේ සඳුනිගේ අම්මා මාලතී.
මේ සඳුනිගේ තාත්තා සුමනසිරි.
අම්මයි තාත්තයි රස්සාව කරන්නෙ ගෙදරින් බොහෝම ඈත කර්මාන්ත පුරයක තියෙන කර්මාන්තශාලාවක. ඒ නිසා ගෙදර එන්නෙ මාසයකට සැරයක් විතරයි. සඳුනි ඉන්නේ ආච්චි අම්මයි සීයයි එක්ක, ගමේ.





මේ සඳුනිගේ ආච්චි අම්මා සිරිමලී. ගමේ කවුරුත් ආච්චි අම්මාට කතා කරන්නේ සිරිමල් අක්කා කියලා. ආච්චි අම්මාගේ එක තලේ යාළුවෝ නම් සිරිමා කියලත් කතා කරනවා. සඳුනි නම් ඉතින් කියන්නේ ආච්චි අම්මා කියලනේ. සමහර වෙලාවට ආදරේට මගෙ සූකිරි ආච්චි අම්මා කියලත් කියනවා.



මේ සඳුනිගේ සීයා සාමසේකර. මුළු නම පාලම්ගොඩ සාමසේකර ඉහළගෙදර. ගම පාලම්ගොඩ නිසා නේ නමේ මුලට පාලම්ගොඩ කියලා ආවේ. ගමේ කවුරුත් කතා කරන්නේ ඉහළගෙදර අයියා කියලයි. සඳුනි සීයාට කතා කරන්නේ සීයා තාත්තා කියලා.

ඉතින් සඳුනි ඉන්නේ ආච්චි අම්මායි සීයා තාත්තායි එක්ක පාලම්ගොඩ ගමේ.



තාත්තගෙත් සීයා තාත්තගෙත් ගම පාලම්ගොඩ. ඇත්තටම පාලම් තුනකින් වට වෙලා තියෙන නිසා තමයි මේ ගමට ඒ නම වැටිලා තියෙන්නේ. පාලම්ගොඩ ගම තියෙන කන්ද

වට කරගෙන අතු ගංගා දෙකකුත් දෙළකුත් ගලනවා. දෙළෙන් එගොඩ වෙන්න තියෙන්නේ ඒදඬු පාලමක්. එක අතු ගංගාවකින් එගොඩ වෙන්න පොඩි පාලමක් තියෙනවා කවුරුත් ඒකට කියන්නේ අඩි හතරේ පාලම කියලා. ඒ පටු පාලමෙන් කාර් බස් යන්න බැහැ. බයිසිකලයක්, මෝටර් සයිකලයක්, පොඩි කරත්තයක් එහෙම විතරයි යන්න පුළුවන්. කාර් බස් යන්න පුළුවන් විදිහට හැදූ තවත් පාලමක් තියෙනවා අනිත් අතු ගංගාව හරහා යන්න. ඒත් ඒ පාලම මැද හරියෙන් කැඩිලා. ඉතින් ගමේ අය විහිළුවට කියන්නේ දැන් ගමට තියෙන්නේ පාලම් දෙකහමාරයි කියලා.

කාර් බස් යන පාලම කැඩිලා, පාලම් බාගයක් වුණු නිසා දැන් ලොකු වාහන ගමට එන්නේ නැහැ. මේ නිසා අඩි හතරේ පාලම දිගේ කිලෝ මීටර් බාගයක් විතර ඇවිදගෙන ගිහින් තමයි බස් යන පාරකට සේන්දුවෙන්න පුළුවන්. ඔන්න ඔය කාරණේ මතක තියාගන්න. ඒක අපේ මේ කතාවට වැදගත්.

කතාවේ තවත් කීප දෙනෙක් ඉන්නවා. කතාව කියාගෙන යනකොට ඒ අය හඳුනාගනිමු.

1
මේ දරුවා ඉස්කෝලෙකට දැන්න ඕනෑ නේ ද?

සඳුනි ගෙදර දොරේ, ගෙවත්තේ, අහල පහළ දුව පනිමින් ලේනුන් සමනල්ලුන් එක්ක කතාබහ කරමින්, සුළඟට වැනෙන ගහ කොළ, මල් වැල් එක්ක තාලෙට නටමින් බොහොම විනෝදෙන් හිටියේ.

"මේ දරුවව ඉස්කෝලෙකට දැන්න ඕන නේද? දැන් අවුරුදු හයකටත් කිට්ටු වෙන්න ආව නේ" කියලා ආච්චි අම්මා කිව්වේ සඳුනිගේ අම්මයි තාත්තයි ගෙදර ආ දවසක.

"අමතක වුණා නෙවෙයි අම්මේ. චූටි දූට අවුරුදු පහ පිරුණේ ගිය පෙබරවාරයෙ නේ. ඉතින් ලබන අවුරුද්දේ තමයි යවන්න වෙන්නේ. ඇරත් අම්මටවත් තාත්තටවත් චූටි දූ ඉස්කෝලේ ගෙනියන්න දවස ගාණේ දෙළේතැන්නට යන්න බැහැ නේ... ඒකයි ඉස්කෝලෙ ගමනට හදිස්සියක් නොකළේ. දැන් නම් ටිකක් ලොකු නිසා අර ලොකු ගෙදර පුංචි දූ එක්ක බස් එකේ යවන්න පුළුවන් නේ." කියලා උත්තර දුන්නේ තාත්තා.

"අපි හෙට ආපහු වැඩට යන ගමන් දෙළේතැන්නේ ඉස්කෝලෙට ගිහින් විදුහල්පතිතුමී මුණගැහිලා කතා කරන්නම්කෝ ලබන අවුරුද්දට ඉස්කොලෙට දාගන්න." අම්මාත් කිව්වා.

"මට වාරු තිබුණා නං කවුරුවත් ඕන නෑ, මමයි දරුවා එක්ක ගෙන යන්නෙ උදේ හවා. ඒත් මේ කකුලේ අමාරුවත් එක්ක දැන් කොහොමදෑ එහෙම යන්නෙ එන්නේ" සීයා තාත්තා නම් කිව්වේ කණගාටුවෙන්.



අවරුද්දකට විතර කලින් වැහි දවසක කන්ද නැගගෙන එද්දී පය ලිස්සලා වැටිලා සීයා තාත්තට ඇවිදගන්නවත් බැරි වුණා. පත්තු බැඳලා තෙල් ගාලා බෙහෙත් කරලා දැන් නම් තරමක් සුවයි. ඒත් එක දිගට ඇවිදින්න අමාරුයි.

මේ ලොකු ගෙදර පුංචි දුව. සඳුනිලාගේ ගෙදර තියන පොඩි කඳු ගැටය බැහැලා පොඩි දුරක් යනකොට, අඩි හතරේ පාලමට කිට්ටුව තමයි ලොකු ගෙදර තියෙන්නේ. ඒ ගෙදර දුවලා තුන්දෙනාගෙන් එක්කෙනෙක් වෙන ගමකට දීග ගිහින්. දෙවැනියා රජරට විශ්වවිද්‍යාලයේ. තුන්වැනියා, පුංචි දුව ඉගෙනගන්නේ හතේ පන්තියේ. එයා තමයි ලොකු ගෙදර පුංචි දුව. සඳුනිට නම් ඉතින් ලොකු ගෙදර පුංචි අක්කා.

ආච්චි අම්මා සඳුනිව ලොකු ගෙදරට ගෙනත් ඇරලුවාම පරෙස්සමෙන් බස් එකෙන් පාසලට එක්කගෙන යන්න එන්න ලොකු ගෙදර පුංචි දුව කැමැති වුණා.

'හැබැයි ඔන්න පරක්කු වෙන්න නම් බෑ. මං ඉස්කෝලේ යන වෙලාවට ඇවිත් ඉන්න ඕනෑ' කියලා පුංචි අක්කා ඉල්ලීමකුත් කළා. වේලාව නොවරදවා සඳුනිව උදේට එක්කගෙන එන්නත් පාසල් ඇරිලා ආවාම සඳුනිව ගෙදර එක්කගෙන යන්නත් ආච්චි අම්මා බාරගත්තා.

'වැඩි දුරක් නැහැ නේ, ටික දවසක් ගිහින් පුරුදු වුණාම සඳුට තනියම වුණත් ලොකු ගෙදරට යන්න එන්න පුළුවන් නේ' කියලා තාත්තා කිව්වා.

ඔන්න ඉතින් සඳුනි හා හාපුරා කියලා පාසල් යන දවසත් ආවා. මුලින්ම පාසල් ගිය දවසෙ නම් සඳුනිව එක්කගෙන ගියේ අම්මායි තාත්තායි. කිරිබත් කටක් කවලා සඳුනිව පාසලට එක්කගෙන ගිහින්, පාසලට බාර දීලා, සඳුනි පන්තියකට යන තුරුම අම්මයි තාත්තායි ළඟ හිටියා. ඊට පස්සේ ලොකු ගෙදර පුංචි දුවගේ පන්තියට ගිහින්, 'නංගිව පරෙස්සමෙන් ගෙදර එක්කගෙන යන්න' කියලා ආපහු මතක් කරලා එහෙම තමයි අම්මායි තාත්තායි දෙළේතැන්නේ බස් නැවතුමට ගියේ, වැඩට යන්න.

'නිවාඩු තිබ්බ නං අපට දවසක් දෙකක් නවතින්න තිබුණා චූටි දූට ඉස්කෝලෙ හුරු වෙනකම්.' තාත්තා කියනකොට තාත්තාගෙ ඇස් දෙකට කඳුළුත් ඇවිත්.

'ඔව් මටත් ලෝබයි තනියම ඉස්කෝලේ දාලා යන්න... ඒත් දැන් චූටි දූට යමක් කමක් තනියම කරගන්න පුළුවන් නේ. ඇරත් විදුහල්පතිතුමී හරිම කරුණාවන්තයි නේ. දැක්කෙ නැද්ද, චූටි දූත් එක්ක හරිම ආදරෙන් කතා කරලා නේ පන්ති බාර ගුරුතුමීට බාර දුන්නේ.' අම්මා තමන්ගේ හිත සනසාගන්න ගමන් තාත්තාගෙත් හිත හැදුවා. ඒත් අම්මාගෙ ඇස්වලත් කඳුළු.



'මට වැඩියෙමත් දුක අපට ටෙලිෆෝන් එකෙන් කතා තරලාවත් විස්තරයක් අහගන්න විදිහක්වත් නෑ නේ දරුවගෙ ඉස්කෝලෙ මුල් දවස ගැන. ඒත් කමක් නැහැ. අපේ අම්මා විස්තර දන්නලා ලියුමක් එවයි නේ.' තාත්තා කියනකොටම ඈත බස් එක එනවා. ඉතින් දෙන්නම බස් එකට දිව්වා. බස් තුනකින් යන්න එපායැ වැඩ කරන පළාතට යන්න. දවසම ගත වෙනවා ඒ ගමනට.

තාත්තා කිව්වා වාගේ පාලම්ගොඩ ගමට දුරකතන පහසුකම් නැහැ. ජංගම දුරකතනයක් වුණත් පාවිච්චි කරන්න නම් දෙළේතැන්න කිට්ටුවටම එන්න වෙනවා.

2
පන්තියේ මුල් දවස - සඳුන් කැටේ, සබන් කැටේ

මුල් ගුරුතුමී උපදෙස් දීලා තිබුණේ මුල් වතාවට පාසලට ආ පළමුවැනි ශ්‍රේණියේ දරුවන්ට පාසල හුරුවෙන්නත් එක්ක උදේ වරුවෙ ටික වෙලාවක් සෙල්ලම් කරන්න ඉඩ දෙන්න කියලයි. ඉතින් ළමයි සෙල්ලම් පිට්ටනියේ දුව පැන සෙල්ලම් කළා. පන්ති බාර ගුරුතුමී, මාලිකා ටීචර්, උදව් කළා ළමයින් කාටත් එකතුවෙලා සෙල්ලම් කරන්න. සඳුනිට හරි සතුටුයි. 'ඉස්කෝලෙ හරිම හොඳයි... ඉස්කෝලෙ හරිම හොඳයි... මගෙ ඉස්කෝලේ හොඳයි... හොඳයි..' සඳුනිගෙ හිතේ පුංචි ගී පදයක් නැටුවා.



ඔන්න සෙල්ලම් කරලා ඉවරවෙලා ළමයි පෝලිමක් හැදිලා පිළිවෙලට පන්තියට ගියා. ඊට පස්සේ මාලිකා ටීචර් නම් ලකුණු කරන්න ගත්තා.

'මම නම කියලා කතා කළාම නැගිටලා ඉන්නවා ටීචර් කියලා කියන්න ඕනෑ. එදෑ එදාට පාසල් ආ දරුවන්ගේ නම් අපි ලකුණු කරන්නේ මේ පොතේ තමයි.' ඔහොම කියා දීලා තමයි මාලිකා ටීචර් නම් කියවන්න ගත්තේ. සඳුනි ආසාවෙන් බලා හිටියා තමන්ගේ නම කියැවෙනකම්. 'සඳුනි පාලම්ගොඩ' කීවාම නැගිටලා හරි පැහැදිලි හඬින් ඉන්නවා ටීචර් කියන්න එක පයින් ලෑස්ති වෙලා හිටියේ.

'චමිලා මල්වැන්න .,. නිමේෂ් අමරසිංහ .,. ඩී සී සමන්තිමාලා .,. කසුන් රුවන් පෙරේරා .,. සඳුන් කැටේ පාලම්ගොඩ .,.'

සමහර ළමයි හිනාවෙන්න ගත්තා. නම කියන්න පටන්ගන්කොටම නැගිට්ට සඳුනිගෙ කට ඇරුණා පුදුමයෙන්. සඳුන් කැටේ?

මාලිකා ටීචර්ටත් පුදුම හිතිලා පොත දිහා බලලා, සඳුනි දිහා බැලුවා. 'ඔයාගේ නම මොකක් ද දුව?' කියලා ඇහුවා

'සඳුනි...'

'මේ නම් ලකුණු කරන පොතේ තියෙන්නේ සඳුන් කැටේ කියල නේ' මාලිකා ටීචර් කිව්වා.

'සබන් කැටේ වාගේ' කිව්වේ කටකාර ළමයෙක්.

'සඳුන් කැටේ .,. සබන් කැටේ .,. සඳුන් කැටේ .,. සබන් කැටේ' තවත් ළමයි දෙතුන් දෙනෙක් හිනාවෙමින් කියන්න ගත්තා.

'නවත්තන්න. නවත්තන්න. කවුද මේ කෑ ගහන්නේ? සඳුනිගේ නම මේ පොතේ වැරදිලා ලියැවිලා ඇති. දැන් හරි. වාඩිවෙන්නකො සඳුනි පාලම්ගොඩ දුව.' මාලිකා ටීචර් එහෙම කීවාම ඒ කතාවයි විහිළුවයි එහෙමම යට ගියා. හැබැයි වැඩි වෙලාවකට නෙවෙයි. විවේක කාලෙදි ගුරුතුමී පන්තියෙන් එළියට ගියාම ඔන්න ආයෙත් දෙතුන් දෙනෙක් කෑ ගහන්න ගත්තා 'සඳුන් කැටේ .,. සබන් කැටේ .,. සඳුන් කැටේ .,. සබන් කැටේ' කියලා. තවත් ළමයි ටික දෙනෙක් හිනා වුණා හයියෙන්ම.

සඳුනි සෙල්ලම් පිට්ටනියට දිව්වා. විහිළු කළ ළමයි එතැනටත් ඇවිත් කෑ ගහන්න ගත්තා. 'සඳුන් කැටේ .,. සබන් කැටේ .,. සඳුන් කැටේ .,. සබන් කැටේ' ඒක දැක්ක තුනේ හතරේ පන්තිවල ළමයි ඇහුවා මේ මොකද කියලා. කතාව දැනගත්තාම ඒගොල්ලොත් හිනාවෙන්න ගත්තා, 'සඳුන් කැටේ .,. සබන් කැටේ.'

සඳුනි පිට්ටනියේ සෙල්ලම් කරන ළමයි ගොඩ මැද්දෙන් එහෙට මෙහෙට දුවලා දුවලා, ලොකු ගහකට මුවාවෙලා හැංගුණා. ගුලිවෙලා එතැනම හිටියා. ඇස් දෙකේ කඳුළු. හිතෙත් කඳුළු. විවේක කාලේ ඉවරවෙලා සීනුව ගැහුවත් සඳුනි එතැනම හිටියා. සෙල්ලම් පිට්ටනියේ සිටිය ළමයි ඔක්කොම පෝලිම් හැදිලා පන්ති



කාමරවලට යනවා දැක්කත් සඳුනි හැංගුණු තැනම හිටියා. දැන්නම් සඳුනිගෙ හිත කඩා වැටිලා. පන්තියට ආපහු යන්න බැහැ, බැහැමයි කියලා විතරමයි දැනෙන්නේ.

ගහ මුල ගුලි වෙලා බිම බලාගෙන බයෙන්, ලැජ්ජාවෙන්, තරහින් ඉන්න සඳුනි ළඟට නිල් මල් සාරියක් පාවීගෙන වාගේ ආවා. සඳුනි දන්නවා ඒ කවුද කියලා. ඒ වුණාට බිම බලාගෙනම හිටියා. නිලමල් සාරියේ සාරි පොට සඳුනි වටේ දැවටුණා. ඒත් සඳුනි බිම බලාගෙන.

'චූටි දූ' සඳුනිට එක පාරටම උඩ බැලුණා. අම්මා තාත්තා කතා කරනවා වාගේ. මාලිකා ටීචර් සඳුනිගේ කඳුළු පිහදැම්මා. ඇගේ අතකින් අල්ලාගත්තා. 'අපි පන්තියට යමු චූටි දූ.'

මාලිකා ටීචර් එක්ක සඳුනි පන්තියට ඇතුළු වෙනකොටම 'ඔන්න සබන් කැටේ එනවා' එක ළමයෙක් කිව්වත් ගුරුතුමී හොඳට සැරට රවලා බැලුව නිසා ඒ කතාව එතැනින්ම නතර වුණා එදූ දවසට. බාලාංශ පන්ති වේලාසන ඇරෙනවා නේ. ඒත් මාලිකා ටීචර් පන්තියේම හිටියා ලොකු ඉස්කෝලේ ඉවරවෙන තුරුම. සීනුව ගහලා ඉවරවෙනකොටම ලොකු ගෙදර පුංචි අක්කා පන්තියේ දොර ළඟ. ඉතින් දෙන්නා ගෙදර එන්න බස් එකට දිව්වා.

'කොහොමද නංගි. ඉස්කෝලේ හොඳද?' පුංචි අක්කා ඇහුවාම සඳුනි ඔලුව වනලා හිනාවුණා විතරයි. නමේ අවුල කිව්වේ නැහැ.

ආච්චි අම්මා සඳුනිගෙන් පාසලේ මුල් දවස ගැන ඇහුවා. ගෙට ගොඩවෙනකොටම සීයා තාත්තා ඒ ගැන ඇහුවා. ආච්චි අම්මා සඳුනිට බත් කවන අතරේ ආපහු ඇහුවා, 'කොහොමද චූටි දුවේ ඉස්කෝලෙ?' සඳුනි ඔලුව වනලා යන්තම් හිනා වුණා විතරයි. 'ඉස්කෝලෙ හිතට අල්ලලා නෑ වාගේ.' සීයා තාත්තා හෙමිහිට ආච්චි අම්මාට කිව්වා.

හවස සඳුනි අලිගැට පේර ගහ යට වාඩිවෙලා ඔහේ බලාගෙන හිටියා. දෙමලිච්චො කව කව ගාමින් ලේන්නු ටිං ටිං ගාමින් එකට සෙල්ලම් කරනවා. ඒත් සඳුනි අද කනාවක් නෑ. සීයා තාත්තා මේක දැක්කා. සඳුනි ළඟට ගිහින් වාඩි වුණාත් කතා නැතුවම හිටියා, සඳුනිට කල්පනා කරන්න ඉඩ දීලා.

'සීයා තාත්තේ, මං ඉස්කෝලෙ යන්නෙ නැතුව ගෙදර ඉන්නද?' ටික වේලාවකින් සඳුනි ඇහුවා.

'ඇයි, ඉස්කෝලේ හොඳ නැද්ද චූටි දුවේ?'

'නෑ.. .... නරක නෑ. ඒත් ගෙදර ඉන්නවා වාගේ නෙවෙයි නේ'

'ළමයකුට අවුරුදු පහ සම්පූර්ණ වුණාට පස්සේ ඉස්කෝලෙ යන්න ඕනෑ. අඩුම ගාණේ අවුරුදු 16 වෙනකම්වත් ඉස්කොලෙ යන්න ඕනෑ කියලා රටේ පිළිගත්ත නීතියක් තියෙනව නේ මයෙ දූ[1]. එහෙම නීතියක් හදලා තියෙන්නේ ඔක්කොම ළමයින්ට ඉගෙනගන්න ඉඩක් හදලා දෙන්න නේ. නැතිනම් ලොකු වෙලා රස්සාවක් කරන්න ඕනෑ කාලෙට ලියන්න කියවන්න බැරි වුණොත් ජීවිතේ සෑහෙන්න අමාරු වෙනවා නේ.' සීයා තාත්තා විස්තර කළා. ඒ කිව්ව ඔක්කොම දේවල් නොතේරුණත් සඳුනි ඔලුව වැනුවා.

'සීයා තාත්තේ. ළමයින්ට නම් දන්නේ කොහොමද?' ටික වෙලාවකට පස්සේ සඳුනි ඇහුවා.

'දරුවෙක් ඉපදුණාම මාස තුනක් ගත වෙන්න කලින් ඒ දරුවගේ නම ලියාපදිංචි කරන්න ඕනෑ. ඒ කියන්නේ මෙන්න මේ ලිපිනයේ පදිංචි මෙන්න මේ දෙමාපියන්ට මෙන්න මේ දවසේ, දරුවෙක් ඉපදුණා, ඒ ළමයට මෙන්න මේ නම දැම්මා කියලා දරුවා ඉපදුණු රෝහලේ හරි ඒ පළාතේ තියෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කියන ආණ්ඩුවේ කන්තෝරුවේ හරි ලියන්න ඕනෑ. එතකොට ඒ නම තියෙන ළමයා ඉපදුණු බවට සහතික කරලා කඩදාසියක් දෙනව නේ. ඕකට කියන්නේ උප්පැන්න සහතිකේ කියලා[2] . ඕනෑම කෙනෙකුගේ වයස කීයද කියලා සහතික කරලා කියන්න පුළුවන් උප්පැන්න සහතිකේ බලලා තමයි. දැන් චූටි දූ ඉස්කෝලෙට බාර දෙනකොටත් උප්පැන්න සහතියත් එක්ක තමයි බාරදුන්නේ. ඉස්කෝලෙට ළමයි ගන්නේ අවුරුදු පහ පිරුණාට පස්සේ නිසා චූටි දූට අවුරුදු පහ සම්පූර්ණයි කියලා විදුහල්පතිතුමී දැනගත්තේ උප්පැන්න සහතිකේ බලලා.'

'ඉතින් ඒකේ මගේ නම මොකක්ද කියලා දන්නේ කවුද?'

'හා. තමන්ගේ දරුවට දුන නම තෝරගන්නේ අම්මා තාත්තා. ඉතින් බොහොම වෙලාවට පවුලේ අනිත් වැඩිහිටියොත් උදව් කරනවා දරුඩට හොඳ නමක් තෝරගන්න. චූටි දූ දන්නවද? බොහොම වටින නමක් චූටි දූට දලා තියෙන්නේ. ඔය නම දමු කියලා තේරුවේ මමයි!' සීයා තාත්තා කිව්වේ හරි ආඩම්බරෙන්.

සඳුනි පුදුමවෙලා බැලුවා. හොඳ නමක්! සඳුන් කැටේ!?

'හැමෝටම සැනසුමක් ගෙනෙන, ගුණ සුවඳ හැම අතේම පතුරන සඳුන් කැටයක් කොච්චර වටිනවද? ඒ නිසා අපේ චූටි දූට සඳුන් කැටේ කියලම නම දන්නම

1 ජාතික සහ ජාත්‍යන්තර පිළිගැනීම අනුව ළමයකු යනු වයස අවුරුදු 18ට අඩු තැනැත්තෙකු වේ. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ආඥා පනතට 2015දී පැන වූ රෙගුලාසි අනුව අනිවාර්ය අධ්‍යාපන වයස අවුරුදු 16ක් වේ.

2 පුද්ගලයකුට පිවිත කාලය තුළ වුවමනා වන නීතිමය ලේඛන කීපයක් වේ. ඒ අතර උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම් පත, සහ විදේශ ගමන් බලපත්‍රය වේ. මෙයින් විදෙශ ගමන් බලපත්‍රය සීමිත කාලයකට (වසර 10ක් වැනි) නිකුත් කරන අතර එය අවශ්‍යතාව පරිදි වලංගු කාලයෙන් පසු අලුත් කරගත හැකි වේ.

ඕනැයි කියලා කිව්වේ මම! කාරණාව තෙරුම් ගත්තාම අනිත් හැමෝම කැමැති වුණා. සඳුනි, සඳුනි කියලා ලේසියට කිව්වට දූගෙ හැබෑ නම සඳුන් කැටේ!'

සඳුනි බිම බලාගත්තා. දැන් කොහොමද නම් ලකුණු කරද්දි වුණු කලබලය ගැන සීයා තාත්තටවත් ආච්චි අම්මටවත් කියන්නේ? ළමයි නමට හිනා වුණා කියලා දැනගත්තාම සීයා තාත්තට දුක හිතෙයි නේ කියලා සඳුනිගේ පුංචි හිතට හිතුණා. ඒත් ළමයි හිනාවෙනවා නං හෙට ඉස්කෝලේ යන්නේ කොහොමද? සඳුනි ලොකු නුස්මක් ගත්තා.

'චූටි දූට අද ඉස්කොලෙ ගමන ටිකක් අමාරුවෙලා වාගෙයි. හෙටත් ඉස්කෝලෙ ගිහින් බලන්නකෝ. ටික ටික පුරුදු වෙනකොට ඉස්කෝලෙ හොඳ වෙයි.' සීයා තාත්තා සඳුනිගෙ ඔලුව අතගාලා කිව්වා. සඳුනිගෙ මූණට යන්තම් පොඩි හිනාවක් ආවා. ඔව්. හෙට බලමුකො.

තෝරා බේරාගන්න අමාරු ප්‍රශ්නයක් ආවාම සඳුනිගෙ අම්මා නිතරම කියන්නේ 'හෙට බලමුකො. හෙට අලුත් දවසක් නේ' කියලයි. සඳුනිට ඒක මතක් වුණා.

'හෙට බලමු. හෙට අලුත් දවසක් නේ.'

3
අලුත් දවස - පාසල් යන දෙවැනි දවස

ඔන්න සඳුනි ලොකු ගෙදර පුංචි අක්කත් එක්ක අඩි හතරේ පාලම දිගේ ඇවිදගෙන බස් නැවතුමට යනවා. සඳුනිට පාසල් නොයා ඉන්නමයි හිත. ඒත් ආච්චි අම්මටත් සීයා තාත්තටත් කියන්න බැහැ නේ පාසල් යන්න අකැමැති ඇයි කියලා. ඉතින් ඒකයි පාසල් එන්න පිටත් වුණේ. බස් නැවතුම පේන දුරක සඳුනි නතර වුණා. 'පුංචි අක්කේ. අද මට ඉස්කෝලේ යන්න බැහැ.'

'මොනවා? මේ මගටත් ඇවිත් බෑ කියන්නේ? ළමයෝ ටික දවසක් ගියාම ඉස්කෝලේ පුරුදු වෙනවා. එතකම් විතරයි ඔහොම හිතෙන්නේ. යමු යමු ඉක්මන් කරලා. බස් එකත් දැන් එයි.' පුංචි අක්කා හිනාවෙවි කියලා සඳුනිගේ අතිනුත් ඇදගෙන ඉක්මන් කරලා යන්නයි හැදුවේ.

'බැහැ. බැහැ. අද නං මට ඉස්කෝලේ යන්නම බැහැ.' සඳුනි එතැනම හිටගෙන කිව්වා.

'අනේ මේ සඳු නංගි. විහිළු කරන්න ලෑස්ති වෙන්න එපා. මට දැන් ඔයාව ආපහු ගෙදර එක්කගෙන යන්න විදිහක් නැහැ. එහෙම කළොත් මට බස් එක වරදිනවා. අද උදේම අපට ගණිතය පරීක්ෂණෝකුත් තියනවා. ඉතින් මට නං අද පරක්කු වෙන්න බැහැ.'

'නෑ නෑ පුංචි අක්කා එන්න ඕනැ නෑ. මං තනියම ආපහු යන්නම්'

'එහෙම කරන්නේ කොහොමද? ඔයාව තනියෙන් ගෙදර ඇරියොත් මට හැමෝගෙන්ම බැනුම් අහන්නත් වෙයි.'

'බැනුම් අහන්න වෙන්නේ නෑ. මම පරෙස්සමෙන් යන්නං. ඇයි අක්කට මතක නැද්ද? මම දවසක් තනියමත් පුංචි අක්කලාගේ ගෙදර ආවේ ඔයාලගේ මල් දන්සලට මල් වට්ටියක් ගෙනැත් දෙන්න.'

'අනේ මට මතක නෑ ඕවා. අර බස් එකත් එනවා. දැන් මොකක්ද කරන්නේ? කරදර නොකර යමු නංගි ඉස්කෝලෙ.'

'බෑ බෑ. අද නං ඉස්කෝලෙ යන්න බෑ. මම ගෙදර යනවා.' කියලා සඳුනි තදින්ම කියා හිටියා.

'එහෙනං ඔන්න පරෙස්සමෙන් ඉක්මනටම ගෙදර යන්න. මම මාලිකා ටීචර්ට



කියන්නං ඔයා අද එන්නෙ නෑ කියලා' කියාගෙන පුංචි අක්කා බස් එකට දිව්වා. ඔන්න එතකොට සඳුනිට මතක් වුණා මාලිකා ටීචර් ඊයේ පාසල ඇරුණාම සඳුනිගේ ඔලුව අතගාලා 'හෙටත් එනවා නේද චූටි දූ' කියලා ඇහුව හැටි.

'ඒ තරම් කරුණාවෙන් කතා කරලත් මේ ළමයා ඉස්කෝලේ ආවේ නෑ නේ ද කියලා මාලිකා ටීචර්ට දුක හිතෙයි.' කියලා සඳුනිට එක පාරට කල්පනා වුණා. 'නෑ නෑ කොහොම හරි ඉස්කෝලෙ යන්න ඕනෑ' කියලා ඔන්න ඒ ගමන සඳුනිට හිතුණා. ඉතින් සඳුනි ආපහු හැරිලා බස් එකට දුවන්න ගත්තා. ඒත් ඒ වෙනකොටත් පුංචි අක්කා බස් එකට නැගලා ඉවරයි. බස් එක දුම් දාගෙන කන්ද පහළට ගියා.

'දැන් මොකක්ද කරන්නේ? ආ! කන්ද පහළට බහින්න පුළුවන් නේ.' කියලා සඳුනිට මතක් වුණා. බස් එක වැරදුණොත් ඉක්මනට කන්ද පහළට බැහැලා කන්දේ ඊළඟ රවුමෙන් බස් එක හරවනකොට බස් එකට නගින්න පාලම්ගොඩ ගමේ අය පුරුදු වෙලා ඉන්නවා. ඒකටම කන්ද පහළට බහින්න පොඩි අඩි පාරකුත් ගමේ අය එකතු වෙලා හදාගෙන තියෙනවා. බස් එක ඔය තාර පාරේ එන්නේ මුළු දවසටම හතර සැරයක් විතරයි. ඒ නිසා කොහොම හරි බස් එක ආ වෙලාවට නැග ගන්න ඕනෑ. ඒ නිසයි කන්දෙන් පහළට අඩි පාරකින් බැහැලා, කඳු වළල්ලෙ ළඟ රවුමෙදි හරි බස් එක අල්ලගන්න ගමේ අය උත්සාහ කරන්නේ. අම්මා තාත්තා එක්ක දෙළේතැන්නට ගිය සමහර දට සඳුනිත් ඒ අඩි පාරේ කන්ද බැහැලා තියෙනවා.

ඉතින් අපේ සඳුනි මොකද කළේ? දෙසැරයක් හිතන්නේ නැතුව කන්ද පහළට බහින අඩි පාරේ පහළට බැස්සා. තනියම යන නිසා බොහොම හෙමිහිට පරෙස්සමෙන් තමයි ගියේ. සීයා තාත්තා වැටුණොත් වැස්ස දවසක මේ අඩි පාරේ ලිස්සලා ගිහින් නේ.

ඒත් බස් එක යන තාර පාරට එන්න කලින් ඔය අඩි පාර දෙකට බෙදෙනවා. සඳුනිට ඒ ගැන මතක තිබුණේ නැහැ. තාර පාරට යා ගන්න නම් හැරෙන්න ඕනැ මොන පැත්තටද කියල සඳුනිට මතකත් නැහැ. කල්පනා කර කර ඉන්න වෙලාවකුත් නැහැ. සඳුනි කෝකටත් කියලා යන්න වැඩිය අමාරු නැහැයි කියලා පෙනුණු අඩි පාර දිගේ ඉක්මනට කන්ද බැස්සා. ඔන්න ටික දුරක් ගියාම ඒ අඩි පාර වැටුණා ගුරු පාරකට. ඉතින් සඳුනි යනවා, යනවා, යනවා... ඒත් බස් යන තාර පාර නම් දකින්න ලැබුණේ නැහැ.

කකුල් දෙක රිදෙනකම් දුර ඇවිද්දට පස්සේ සඳුනිට තෙරුණා පාර වැරදුණා කියලා. ගුරු පාර ඒ තරම් බෑවුමක් නැති වුණත් කන්ද පහළටයි යන්නේ. ඈතින් ගඟක් ගලන සද්දයකුත් යාන්තමට ඇහෙනවා. මේ කොහෙද මේ? සඳුනි කවදාවත් මේ පැත්තට ඇවිත් නැහැ! දැන් ගෙදර යන්න පාර සොයාගන්නේ කොහොමද? හොඳටම බය හිතිලා සඳුනිට ඇඬෙන්නත් ආවා.

ඒත් අම්මා කියා දීලා තියෙන්නේ ගොඩක් බය හිතුණොත් පපුව පිරෙන්න ලොකු හුස්මක් ගන්න කියලා. එතකොට බය ටිකක් අඩු වෙනවා කියලා තමයි අම්මා කියන්නේ.

ඉතින් සඳුනි හොඳ ලොකු හුස්මක් ගත්තා. ඇත්තටම බය ටිකක් අඩු වුණා නේ. 'පාර දිගේ ඇවිදගෙන ගිහින් මගදි දකින කාගෙන් හරි ගෙදර යන්න පාර අහගන්නවා.' සඳුනි හිතුවා.

ඔන්න එතකොට එයාට මතක් වුණා තාත්තා කියා දීලා තියෙන දෙයක්. 'මයෙ චූටි දූ කවදවත් තනියම ඉන්න වෙලාවක අඳුරන්නේ නැති අය එක්ක කතා කරන්න යන්න එපා. ඒ අය කොච්චර ආසා හිතෙන රස කෑමක් දුන්නත් කන්නත් එපා. ආච්චි අම්මා නැත්තං සීයා තාත්තා කිව්වොත් මිසක් වෙන කා එක්කවත් එහෙ මෙහෙ යන්නත් එපා.' කියලයි තාත්තා කියා දුන්නේ. ඒ ඇයි කියලා සඳුනි ඇහුවාම තාත්තා කිව්වේ 'හොඳ කරුණාවන්ත අය වාගෙම සමහර වෙලාවට නපුරු නරක වැඩ කරන, ළමයින්ව බය හිතෙන විදිහේ වැරදි වැඩ කරන්න පාවිච්චි කරන අයත් ඉන්නවා නේ. ඒ නිසා පරෙස්සම් වෙන්න ඕනෑ' කියලයි. අම්මා තාත්තා ගෙදර නැති වෙලාවට ආච්චි අම්මා හරි සීයා තාත්තා එක්ක හරි ඇරෙන්න තනියම කොහෙවත්ම යන්නත් එපා කියලයි තාත්තා කියා දුන්නේ.

සඳුනිට හරියට දුක හිතුණා. තනියම මෙහෙම ආ එක හරීම වැරදි වැඩක් නේ ද කියලා දැනුණා. දුකටත් වඩා වැඩියි බය! දැන් ආපහු ගෙදර යන්න පාර හොයා ගන්නේ කොහොමද? නරක නපුරු අයත් පාරේ ඉන්නවා නම් ගෙදර යන්න පාර අහගන්නේ කාගෙන්ද? නරක නපුරු කෙනෙක් නම් වැරදි පාරක් කියා දීලා සඳුනිව හොරෙන් අරන් යයිද? අනේ, ආපහු ගෙදර යන්නේ කොහොමද?

සඳුනි තව සැරයක් ලොකුම ලොකු හුස්මක් ගත්තා.' හා. මම එහෙනම්. පාරේ යන ළමයකුගෙන් පාර අහගන්නවා. දෙළේතැනනේ ඉස්කෝලෙට යන පාර දන්නවා ඇති නේ ළමයි. කොහොම හරි ඉස්කෝලෙට ගියොතින් නම් මාලිකා ටීචර් මාව ගෙදරට යවයි.'

ඔය ඉතින් පුංචි හිතට හිතෙන විදිහට සඳුනි ප්‍රශ්නෙට උත්තරයක් සොයාගත්ත හැටි නේ.

ඉස්කෝලේ යන ළමයින් කවුරු හරි මුණගැහෙයි කියලා හිතාගෙන සඳුනි ගුරු පාර දිගේ ඇවිදගෙන දුර ගියත් ළමයින් කවුරුවත් දක්කේ නැහැ. ඒ පාර පාසලක් කිට්ටුවෙන්වත් යන්නේ නැති නිසා ද කොහෙද සඳුනිට කවුරුවත්ම ළමයින් මුණගැහුණෙ නැහැ. ඔහොම ගුරු පාර දිගේ ගිහින් ගිහින් ගිහින් සඳුනි ආවේ පොඩි ගඟක් ළඟට.

ඒක වැඩිය ලොකු ගඟක් නම් නෙවෙයි. ගං ඉවුර බලන්න ලස්සනයි. සඳුනි එතැන විනාඩියක් විතර රැඳුණා. හීන් හුළඟක් හමාගෙන ගියා. ඈතින් කොකෙක් පියාඹාගෙන ගියා. පහළ අත්තක පිළිහුඩුවෙක් ඉන්නවා ගඟ දිහාම බලාගෙන, ලා ඉර අව්ව වැටිලා ගඟ මතුපිට වතුර දිලිසුණා. ගඟ නිසංසලේ ගලාගෙන යනවා. සඳුනිගෙ හිතට පුංචි සැනසිල්ලක් ආවා.

සඳුනි වටපිට බලනකොට දැක්කා ටිකක් ඈතින් ගඟ පැත්තට නැවිලා පොඩි කඳු ගැටයක් තියෙනවා. එතැන ගෙවල් දෙක තුනක වහළ පේනවා. ටිකක් ලොකු ගෙයක්, ඊට ඈතින් තව පොඩි ගෙවල් දෙකක්... ඔය ගෙදරකට ගිහින් අහගන්නවා අපේ ගෙදරට යන පාර. නැත්තං දෙළේතැන්නේ ඉස්කෝලෙට යන පාර.' සඳුනි හිතුවා. ඒ පැත්තට යන්න හදනකොටම ඔන්න සඳුනිට ඇහෙනවා ළමයි දෙන්නෙක් කෑ ගහනවා.

'බේරගනියෝ! බේරගනියෝ! කවුරුත් උදව් කරන්න එන්නැද්දෝ!?



4
මුතු වට්ටිය ගඟේ ගිහින්....

සඳුනි කෑගැහිල්ල ඇහෙන පැත්තට දුවගෙන යනකොට දැක්කා ගඟ මැද්දේ පෙරළුණු ඔරුවක එල්ලිලා පිරිමි ළමයෙක් කෑගහනවා. දිග කඹයකුත් ඔරුවේ ගැටගහලා තියෙනවා. මෙගොඩ ඉඳන් ගෑනු ළමයෙක් කඹේ ඇදලා ඔරුව මෙගොඩට ගන්නයි හදන්නේ. ලොකු ගෙදර පුංචි අක්කගේ වයසේ විතර ඇති ඒ දෙන්නා.

'මට පිනන්න බැරියෝ. බේරගනියෝ.' පිරිමි ළමයා කෑගහනවා.

'අනේ අපේ අයියා බේරලා දෙන්න කවුරුත් නැද්දෝ.' ගෑනු ළමයා කෑගහනවා.

සඳුනිව දැක්කා විතරයි ගෑනු ළමයා කෑගහන්න ගත්තා, 'අනේ නංගී. මේ, මේ නංගි. අනේ ඇවිත් උදව් කරන්න ඔරුව අදින්න. අනේ ඉක්මනට එන්නකෝ උදව් කරන්න.' කෑගහමින් එයා දිග කඹයේ කොන සඳුනි දිහාට වීසි කළා. සඳුනි මොහොතක් බලා හිටියා. ආපහු හැරිලා දුවන්න ගත්තා.

'අනේ මේ මොන ළමයෙක් ද උදව්වක් ඉල්ලුවාම හැරිලා දුවන්නේ. අපේ අයියා වතුරේ ගිලෙනවා පේන්නැද්ද ළමයෝ' ගෑනු ළමයාට තරහ ගිහින් අඬ අඬා කෑගහන්න ගත්තා.

පිරිමි ළමයත් කෑගහනවා, 'අනේ ආපහු යන්න එපා. අපට උදව් කරන්න. බේරගනියෝ. මට පිනන්න බැරියෝ.'

සඳුනි දිව්වේ නිකම්ම නෙවෙයි, අර කඹයත් ඇදගෙන. එයා දුවලා දුවලා ගිහින් කඹේ ගහක ගැටගැහුවා. ඊට පස්සේ දුවලා ඇවිත් ඔරුව මෙගොඩට අදින්න උදව් කළා.

'මොකටද එහෙම කළේ?' ගෑනු ළමයා පුදුමයෙන් ඇහුවා.

'ඇයි අක්කේ, අපි දෙන්නගෙම අතින් කඹේ අතෑරුණොත් ඔරුව ගහගෙන යනවා නේ.' සඳුනි කිව්වා.

'ඔයාට හරි මොළේ නෙ. කොහොමද ඔහොම දෙයක් කල්පනා වුණේ?'

'අපේ තාත්තා මට ගඟේ පිනන්න උගන්නකොට මං පුංචිම පුංචි කාලේ, හයිය ලීයකට කඹයක් බැඳලා ඒ කඹය ගහක ගැට ගහලා මට ඒක අල්ලගෙන

පිනන්න කියනවා. එතකොට කඹේ දිගට විතරයි නේ ලීය ගඟේ පහළට යන්නේ.' සඳුනි කිව්වේ හිනාවෙවී. අක්කත් හිනා වුණා. ඒත් බේරගනියෝ කියලා කෑගහන අයියට නම් හොඳටම තරහා ගිහින්.

'හිනාව පැත්තක තියලා මාව ගොඩට ගන්නෑ මම තාම ගඟේ. පේන්නැද්දෝ'

අක්කයි නංගියි දෙන්නා බොහොම මහන්සි වෙලා ඔරුව මෙගොඩට ඇද්ද. ඉවුරට ටිකක් ළං වෙනකොට පිරිමි ළමයා ඔරුවත් ඇදගෙනම ආවා. තුන්දෙනාම හති දමමින් ටික වේලාවක් හිටියා මහන්සියටම.

'මම සුහානි. මම ඉන්නේ හයේ පන්තියේ. මේ මගේ අයියා සුරේන්. එයා හතේ. ඔයාගේ නම මොකක්ද නංගි? ඔයා මේ පළාතේ නෙවෙයි නේ ද? ඔයා මොන ඉස්කෝලෙද? මොන පන්තියෙද? ඔයා කොහෙද මේ යන්නේ ඉස්කෝලේ ඇඳුමෙන්ම?' සුහානි අක්කට ප්‍රශ්න ගොඩයි.

'මගේ නම.... මගේ නම... නම....' සඳුනිට ඇත්ත නම කියන්න හිතුණේ නැහැ. නම සඳුන් කැටේ කියලා කියන්නේ කොහොමද? මේ දෙන්නත් හිනාවෙයි නේ ද? සඳුනිට හිතුණා.

'ඇයි ඔයා නම කියන්න බය? හා. හා. ඉස්කෝලෙන් පැනලා යනව නේ ද?' ඒ ඇහුවේ සුරේන්.

සඳුනිට ටිකක් තරහා ගියා ඒ කතාවට.'ඇයි ඕගොල්ලො අද ඉස්කෝලෙ ගිහින් නැත්තේ?' ඒ නිසා සඳුනිත් ආපිට ප්‍රශ්නයක් ඇහුවා.

'අපේ ඉස්කෝලෙ නිර්මාතෘ දිනය අද. ඒ කියන්නේ ඉස්කෝලේ පටන්ගත්ත අය සිහි කරලා ස්තුති කරන දවස. ඒකට අද හවස උත්සවයක් තියෙනවා ඉස්කෝලේ. ඒ නිසා අපට අද උදේ ඉස්කෝලෙ නැහැ. ඒත් අපි දෙන්නට නම් හවස ඉස්කෝලෙ උත්සවේටත් යන්න වෙන්නෙන් නැහැ. හෙට අපේ ගෙදර දානයක් තියෙනවා. ඒ හින්දා ගෙදර වැඩ ගොඩයි.' උත්තර දුන්නේ සුහානි අක්කා.

ඊළඟට සුහානි කිව්වා, 'අපේ මේ අයියාගේ කතාවලට තරහ ගන්න එපා නංගී. එයා ඔහොම තමයි. හිතුණු හැටියෙම හිතුණු දේ කරනවා, කියනවා නේ. ඒක නෙවෙයි, නංගිගේ නම කිව්වේ නැහැ නේ. ඇත්තටම ඔයා තනියම මේ කොහෙද යන්නේ?'

ඔක්කොම කතාව කියන්න ඕනෑ නෑ, සඳුනි හිතාගත්තා. 'මගේ නම සඳුනි. මම ඊයෙමයි ඉස්කොලෙ ගියේ. අද මට ඉස්කෝලෙට යන පාර හොයාගන්න බැරුව

වැරදිලා මේ පැත්තට ආවා. ඕගොල්ලන්ගෙ කෑගැහිල්ල ඇහිලා තමයි මෙතැනට දුවගෙන ආවේ.'

'පීනන්නත් බැරි නම් සුරේන් අයියා ගඟ මැදටම ගියේ ඇයි?' ඔන්න සඳුනි ඊළඟට ඇහුවා.

'මම ඔරුවෙනුයි ගඟ මැදට ගියේ...' සුරේන් පටන්ගන්නකොටම, සුභානි ඉතුරු ටික කිව්වා, 'ඒත් ඔරුවේ හබලක් තියෙනවද බලන්න අමතක වුණා. ඔරුවෙ නැගලා ගඟ පහළට පාවෙලා යනකොටයි දැක්කේ හබලක් නෑ කියලා. එතකොට අයියා කලබලවෙලා හිටගත්තාම ඔරුව පෙරළුණා.' හිනාවෙවී කතාව පටන්ගත්තත් සුභානි කතාව ඉවර කළේ ටිකක් දුකෙන් වාගේ.

'ඉතින් අක්කයි අයියයි කලබලේ ඔරුවෙන් කොහෙද යන්න ගියේ?'

'අපි මුතු වට්ටියක් හොයනවා'

'මුතු වට්ටියක්?'

'ඔව්. ඒක දිග කතාවක්'

'මට කියන්නකෝ ඒ කතාව'


'නංගිට ගෙදර යන්න පරක්කු වෙන්නෙ නැද්ද?'

'නෑ. කතාව අහලා ඔයාලට මුතු වට්ටිය හොයාගන්න උදව් කරලාම යන්නම්.' සඳුනි ගං ඉවුරේ හරි බරි ගැහිලා වාඩි වුණා කතාව අහන්න. දැන් එයාට මුතු වට්ටිය ගැන ඇරෙන්න වෙන මොනවත් මතක නෑ වාගෙයි.


'ඔන්න මේකයි වුණේ ... ...' සුභානියි සුරේනුයි මාරුවෙන් මාරුවට කතාව කියන්න පටන් ගත්තා.

'අපේ ගෙදර හරි වටින මුතු වට්ටියක් තියෙනවා. ඇත්තම ඇත්ත මුතු අල්ලලා, පුංචි බේසමක විතර හැඩේ, හරිම ලස්සන මුතු වට්ටියක්! අපේ තාත්තගේ පරම්පරාවෙන් පරම්පරාවට එන එකක්ලු. හරි වටිනවලු. අපේ සීයගෙන් පස්සේ පවුලේ වැඩිමලා හැටියට ඒක අපේ තාත්තට අයිති වුණා.'

'හැබැයි ඔය මුතු වට්ටිය නිසා අපේ ගෙදර අම්මයි තාත්තයි හැමදාම වාගේ රණ්ඩු ... ... ඔය මුතු වට්ටිය ගැන පටන් ගන්න වාදෙ ඉවරවෙන්නේ අම්මයි තාත්තයි හොඳටම රණ්ඩුවෙලා... ... බැනගෙන .. ... කෑගහගෙන රණ්ඩුවෙලා...' ඒ ගැන කියනකොට සුරේන්ගෙයි සුභානිගෙයි මූණු මැලවුණා.



5
මුතු වට්ටිය නැති වුණු හැටි



'ඉතින් අම්මයි තාත්තයි මුතු වට්ටිය නිසා රණ්ඩු වෙන්නේ ඇයි?' සඳුනි පුදුමවෙලා ඇහුවා.

'මේක නෙ නංගි වැඩේ' ප්‍රශ්නේ විස්තර කළේ සුරේන් අයියා. 'තාත්තා කැමතියි මුතු වට්ටිය ලස්සනට සාලේ මැද්දේ තියන්න. අම්මා එපා කියනවා ඒක කවුරු හරි හොරකම් කරගෙන යයි කියලා. තාත්තා කියනවා ඔච්චර ලස්සන දෙයක් අල්මාරියේ දමලා තියන්නේ නැතුව ඒක දිහා බලලා සතුටු වෙන්න පේන්න තියන්න කියලා. අම්මා කියනවා ඒක මෝඩ වැඩක්, එහෙම කළොත් පරම්පාරාවෙන් ලැබුණු දේ නැතිවෙයි කියලා... .. අම්මා බැන බැන මුතු වට්ටිය අල්මාරියේ හංගනවා. තාත්තා බැන බැන ඒක සාලේ මැද මේසේ තියනවා. ඉවරයක් නෑ .. .. මුතු වට්ටියෙන් පටන් ගන්න කතාවට වෙන වෙන ප්‍රශ්නත් ඇදගෙන මහ ලොකු රණ්ඩුවක් වෙනවා.'

'ඔන්න අද උදේම දැනෙට ගෙවල් අස් කරන්න ගත්තා.' කතාව දිගට කියාගෙන ගියේ සුභානි. 'සාලේ අස් කළාට පස්සේ තාත්තා මුතු වට්ටිය ගෙනැත් සාලේ මැද මේසේ තිබ්බා. අම්මා ඒක ගිහින් අල්මාරියට දැම්මා. තාත්තා ආපහු ගෙනැත් සාලෙන් තිබ්බා. අම්මා ඒක අරගෙන ආපහු අල්මාරියට දැම්මා. තාත්තා බැන බැන ඒක ආයිමත් සාලෙන් තිබ්බා... ඒ පාර දෙන්නාම බැන බැන ගේ පුරාම ඇවිද ඇවිද රණ්ඩු වෙන්න ගත්තා...'

'ඉතින්?'

'අපෙ අයියට හොඳටම තරහා ගියා මේ මුතු වට්ටියක් නිසා අපට තියෙන කරදරේ කියලා. අම්මයි තාත්තායි ඒ වෙලාවේ කුස්සිය පැත්තේ හිටියේ. අයියා මුතු වට්ටිය අරගෙන මිදුලට දුවලා ගිහිල්ලා ඒක කන්දෙන් පහළට වීසි කළා.'

'වීසි කළා? කන්දෙන් පහළට!!??' සඳුනිගේ පුදුමය අහස උසට!

සඳුනිගෙ අම්මා තාත්තාවත් ආච්චි අම්මා සීයා තාත්තාවත් එහෙම කෑ ගහගෙන බැනගෙන රණ්ඩු වෙන්නේ නැති නිසා සඳුනිට සුභානි අක්කයි සුරේන් අයියයි ගැන දුකයි. ඒත් ඔය තරම් වටිනා මුතු වට්ටිය වීසි කරලා දැම්මා කිව්වාම!

'දැන් ප්‍රශ්නේ මුතු වට්ටිය නැති වෙච්චි එක විතරක් නෙවෙයි නේ. ෂිහ්! මං කළ වැඩේ නිසා කාසු අයියයි බැනුම් අහන්නේ. එයාව පොලිසි ගෙනියයිද දන්නෙත් නැහැ.' සුරේන් කිව්වේ හරිම දුකෙන්.

'කාසු අයියා? ඒ කවුද ඒ?'

ඔන්න සුභානි අක්කා ආයිමත් විස්තර කළා. 'කාසු අයියා අපේ ගෙදර වැඩට ඉඳහිට උදව්වට එනවා. එයයි එයාගේ අක්කා සේපාලිකායි දෙන්නම පොඩි පොඩි වැඩ කරලා දීලා කීයක් හරි හොයා ගන්නවා. එයාලගේ තාත්තා නෑ. අම්මා පිටරට රස්සාවකට ගිහින් අතරමං වෙලාලු. එයාලගේ ආච්චිත් එක්ක තමා ඉන්නේ. ඒත් ආච්චි ලෙඩින් නිසා කාසු අයියයි සේපාලිකා අක්කයි තමයි ඉස්කොලේ ඇරිලා ආවාම නැත්තං නිවාඩු දවසට ළඟ පාත වතුපිටිවල පොඩි පොඩි වැඩ කරලා දීලා කීයක් හරි සොයාගන්නේ. අපේ ගෙදර මොනවා හරි උත්සවයක් තියෙනවා නම් ඒ දෙන්නා එනවාමයි වැඩ කරන්න. හා තව පොඩි මල්ලියෙකුත් ඉන්නවා එයාලට හතරේ පන්තියේ විතර. කවුරුත් එයාට කියන්නේ පොඩ්ඩා කියලා.'

'ඒගොල්ලො කොහොමද රස්සාවල් කරන්නේ? ළමයින්ට රස්සාවල් කරන්න තහනම්ලු' සඳුනි කතාව මැදට පැනලා කිව්වා. සුරේන්ටයි සුභානිටයි පුදුමයි.

'ඔයා කොහොමද ඕවා දන්නේ? තවම ඉස්කෝලෙ ගියෙත් එක දවසයි කිව්වා නේ ද?' ඇහුවෙ සුරේන්.

'මම දන්නවා! අපේ ආච්චි අම්මා කියනවා මට ඇහිලා තියෙනවා. අපේ ගෙට උඩහින් ටිකක් ඈත ඉන්නවා ළමයි තුන්දෙනෙක්. එයාලගේ නම් අම්මා තාත්තාත් ඉන්නවා හැබැයි තාත්තා ගෙදරට සල්ලි දෙන්නේ නැතිලු. ඉතින් දවසක් ඒ ගෙදර ළමයි දෙන්නෙක් වැඩ ඉල්ලගෙන අපේ ගෙදරටත් ආවා. කඩේක රස්සාවක් හරි සොයා දෙන්න කියලා කිව්වා. අපේ එළවළු කොරටුවේ හරි ගෙදර හරි වැඩ කරලා දෙන්නං කිව්වා. එතකොට අපේ ආච්චි අම්මා කිව්වා ඉස්කෝලේ යන්න ඕන වයසේ පුංචි ළමයින්ව රස්සාවට ගන්න එක තහනම් කියලා. ආච්චි අම්මයි අපේ අම්මායි ගෙදර තියෙන දේවල් ටිකක් එකතු කරලා ඒ ළමයින්ට දුන්නා කෑම උයාගන්න කියලා. පහළ ලොකු ගෙදර නැන්දට කිව්වාම එයා ඉස්කෝලේ පොත් ගන්න උදව් කළා. එයාලා පොඩි ළමයි නිසා රස්සාවක් දුන්නේ නැතිලු. හැබැයි සීයා තාත්තයි අපේ තාත්තායි පහළ ගෙදර මාමලයි ගිහින් ඒ ළමයින්ගෙ තාත්තා එක්කත් කතා කළාලු ළමයින්ට ඉගෙනගන්න සල්ලි දෙන්න, ගෙදරට සල්ලි දෙන්න කියලා.' සඳුනි මහ දිග විස්තරයක් කළා.

'ඔව් ඒ කතාව හරි. අපේ අම්මාත් නිතරම කියලා තියෙනවා ළමයි වැඩට ගන්න තහනම්, කාසු අයියටයි සේපාලි අක්කටයි වැඩ දීලා අපට කරදරේ වැටෙන්න වෙයි කියලා. පස්සේ තාත්තා කොහෙන්දෝ කන්තෝරුවකින් හොයලා බලලා කිව්වා

ළමයි අවුරුදු 16ට වැඩි නම්, එයාලගේ ඉස්කෝලේ ගමනට බාධා නොවෙන විදිහට, එයාලගේ සෞඛ්‍යයට හානියක් නොවෙන විදිහට ළමයින්ට පරෙස්සමෙන් කරන්න පුළුවන් රස්සාවල් විතරක් කරන්න ඉඩ තියෙනවා කියලා.' සුහානි විස්තර කළා[3].

'ඔව් ඔව්. කාසු අයියා දැන් 11 පන්තියේ. එයාට අවුරුදු දෙසයාමාරක්ලු දැන්. සේපාලි අක්කට නම් දැන් අවුරුදු 18කට කිට්ටු ඇති මගේ හිතේ.' සුරේනුත් විස්තරේට එකතු වුණා.

'ඒත් ඉතින් කාසු අයියට බැන්නේ මොකද සුරේන් අයියා කළ වැරැද්දට?' සඳුනි ඇහුවා.



'අම්මා දැක්කේ නැහැ නේ කවුද මුතු වට්ටිය ගත්තේ කියලා. අම්මා සාලෙට එනකොට මුතු වට්ටිය නෑ. අම්මා කෑගහන්න ගත්තා 'මුතු වට්ටිය නෑ, මුතු වට්ටිය නෑ, කවුද හොරකම් කරලා' කියලා. පිට කවුරුත් ගෙදරට ඇවිත් හිටියේ නෑ, කාසු අයියා තමයි ඉස්සරහා කාමරේ සුද්ද කර කර හිටියේ. ඉතින් කාසු අයියා ඒක ගත්ත කියලමයි අම්මයි තාත්තයි හිතන්නේ.

'තාත්තත් බැන්නද?'

'තාත්තා බැන්නේ නැහැ. ඒත් කාසු අයියට කිව්වා පුතේ ඔයාට කරදරයක් වෙන්නේ නැහැ හැංගුව තැනකින් මුතු වට්ටිය දෙන්න කියලා. කාසු අයියා බයවෙලා කෑගහන්න ගත්තා එයා ගත්තේ නෑ නෑ ම යි කියලා. එතකොට තාත්තා සේපාලි අක්කට කිව්වා මල්ලිට ඇත්ත කියන්නෙයි කියන්න. නැත්නං පොලිසිත් යන්න තමයි වෙන්නේ කියලා. අනේ පව්. සේපාලි අක්කා හොඳටම අඬන්න ගත්තා 'අපි හොරකම් කරන්නේ නෑ කියලා.'

'ඇයි ඉතින් ඔය දෙන්නා ඇත්ත කිව්වේ නැත්තේ? මුතු වට්ටිය වීසි කළේ සුරේන් අයියයි කිව්වා නං කාසු අයියා බැනුම් අහන්නේ නැහැ නේ' සඳුනි කිව්වේ ටිකක් තරහින් වාගේ.

3 නීතියෙන් අවසර දී ඇති විශේෂ අවස්ථාවල හැරෙන්නට ශ්‍රී ලංකාවේ නීතියට අනුව අවුරුදු 16ට අඩු කිසිම තැනැත්තෙකු සේවයේ යෙදවීම තහනම් වේ. අවුරුදු 16ට අඩු ළමයින් පාසල් ආරම්භ වීමට නියමිත වේලාවට කලින් හෝ පාසල් අවසන් වූ පසු, පවුලේ සාමාජිකයන් විසින් පමණක් කරගෙන යන සැහැල්ලු කෘෂිකාර්මික කටයුතුවල පමණක් යෙදවිය හැක. තවද පුණ්‍යාධාර කටයුත්තකට හෝ රජයේ පාසල්වල හෝ ආධුනික නාට්‍ය සංගමයක් විසින් ඉදිරිපත් කරන ගාස්තු අය නොකරන නාට්‍ය සංදර්ශන යන විශේෂ අවස්ථාවල යෙදවීම ළමා ශ්‍රමය යටතට නොගැනේ. අවුරුදු 16ත් 18ත් අතර ළමයින්ගේ ජීවිතයට හෝ සෞඛ්‍යයට අහතුරුදායක නොවන රැකියාවල යෙදවිය හැකි නමුත් අනාරක්ෂිත රැකියාවල යෙදවීම තහනම් වේ. ළමා ශ්‍රමයට අදාළ නීති ක්‍රියාත්මක කරන්නේ කම්කරු දෙපාර්තමේන්තුවයි.

සුරේනුයි සුහානියි මූණට මූණ බලාගත්තා. 'එහෙම කිව්වා නං අයියට ගහයි හොඳටම' සුහානි කිව්වේ ඇහෙන නෑහෙන හඬින්.

'නිකම් නෙවෙයි ගස් බැඳලා ගහයි' සුරේන් කිව්වා.

ගස් බැඳලා ගහනවා කියන කතාව සඳුනිට තේරුණේ නැහැ. එයාගේ ගෙදර එහෙම කවුරුවත් කාටවත් ගහන්නේ නැහැ නේ. සඳුනි දඟ වැඩක් කළත් 'ආයි එහෙම නං කරනවා නෙවෙයි මෙහෙම වැඩ' කියලා සීයා තාත්තා සැරෙන් කියනවා. ආච්චි අම්මට තරහා ගියත් මගේ සූකිරි ආච්චි අම්මා කිව්වාම තරහා නිවිලා යනවා. අම්මායි තාත්තායි නම් ගහන්නෙවත් බනින්නෙවත් නැහැ නේ. ළඟට අරගෙන වැරැද්ද මොකක්ද කියලා කියා දෙනවා නේ. ඔන්න එතකොට තමයි සඳුනිට දුක හිතිලා ඇඬෙන්නේ වැරදි වැඩක් කරලා අම්මාගෙයි තාත්තාගෙයි හිත රිද්දුවා නේද කියලා. ඒ වෙලාවට තාත්තා සඳුනිව හිනස්සන්න මොනවා හරි කියනවා. නැත්නං පිටේ තියාගෙන 'ලුණු, ලුණු, කාටද මේ ලුණු මල්ල ඕනෑ. කාටද මේ දඟ මල්ල ඕනෑ' කිය කියා හිනාවෙනවා.

සඳුනිගේ ගෙදර එහෙම වුණාට, බලාගෙන ගියාම එක එක ගෙවල් එක එක විදිහයි නේ.

'නංගි හරි.' සුහානි කිව්වා, 'අපිට කියන්න තමයි තිබුණේ මුතු වට්ටිය විසි කළේ අපි කියලා. ඒත් ගුටිකන්න වෙයි කියලා ඒ වෙලාවේ බය හිතුණා. අපි හිතුවේ ඉක්මනට පහළට ඇවිත් මුතු වට්ටිය අරගෙන ගෙදර ගිහින් ආපහු තියෙනවා කියලා. අපි ඒ වෙලාවෙම දුවගෙන ඇවිත් මේ හරියේ හැම තැනම හෙව්වා, ඒත් මුතු වට්ටිය කොහෙවත් නෑ.'

'මේ හරියට කවුරුවත් වැඩිය එන්නෙත් නැති නිසා මම හිතුවා ඒක ගඟට වැටිලා පහළට පාවෙලා යන්න ඇති කියලා. ඒකයි ඔරුවෙ නැගලා සොයන්න යන්න හිතුවේ.' සුරේන් කතාව ඉවර කළා.

'ඉතින් දැන් මොකද අපි කරන්නේ?' සුහානි ඇහුවා.

'අපිට කොහොම හරි මුතු වට්ටිය සොයාගන්න වෙනවා නේ.' සඳුනි කිව්වා.

'අපිට? ඔයා එන්නද හදන්නේ මුතු වට්ටිය සොයන්න?' සුහානියි සුරේනුයි පුදුමයෙන් ඇහුවා.

'නැතුව? මං කොහොමද ගෙදර යන්නේ මුතු වට්ටියට මොකද වුණේ දන්නේ නැතුව? ඉක්මන් කරලා යමු.' සඳුනි ඉස්සර වුණේ ලොක්කා වාගේ. මොන තරම් බයෙන් හිටියත් සුහානිටයි සුරේන්ටයි හිනා. 'හරිම පණ්ඩිත නංගියෙක් නේ ඔයා.

යමු. යමු එහෙනම් ඉක්මනට.'

'හා අපි ගොඩ පැත්ත බලන්නං අයියා බලන්න ගඟ පැත්ත' සුභානි යන ගමන් යෝජනා කළා.

'ඔන්න සුරේන් අයියේ ඒත් ගඟට නම් බැහැගන්න එපා, මට පීනන්න බැරියෝ බේරගනියෝ කියලා කෑගහන්න වෙයි.' සඳුනි කිව්වාම අයියටයි නංගිටයි හිනා.

සෑහෙන දුරක් ආවත් ළමයි තුන්දෙනා මුතු වට්ටියක් නම් දැක්කේ නැහැ.

'දැන් මොකද කරන්නේ? අම්මලා අපව හොයනවද දන්නෙත් නෑ' සුභානි කිව්වා. 'මෙච්චර වෙලා කොහෙද ගියේ කියලා බැනුම් අහන්නත් වෙයි. ගුටිකන්නත් වෙයිද දන්නේ නෑ. අපි ආපහු යමු අයියේ.'

'මුතු වට්ටිය නැතුව ගිහින් ඇත්ත කිව්වොත් කොහොමත් බැනුම් අහන්නයි ගුටිකන්නයි වෙනවාම නේ. ඒ මදිවට කාසු අයියටත් තරහා යයි අපි නිසා එයත් බැනුම් ඇහුවා කියලා. ඒ නිසා අපි තව ටිකක් බලමු. බැරි වෙලාවත් මුතු වට්ටිය සොයාගන්න පුළුවන් වුණොත් අපට ගුටි නොකා බේරෙන්න පුළුවන් වේවි.' ඒ සුරේන්ගෙ අදහස.

ඉතින් තුන්දෙනාම තව ටිකක් දුර ගියා. ඈතින් ගං ඉවුරෙ මොකක්දෝ ලොකු කලබලයක් ඇහෙනවා. කවුදෝ කාටදෝ බනිනවා. 'රණ්ඩුවක් ද කොහෙද? ඔතැනට යන්න එපා. මොන කලබලයක් ද දන්නේ නැහැ නේ.' සුරේන් යෝජනා කළේ වැඩි පරෙස්සමට.

'ඒක ඇත්ත. ඒත් රණ්ඩුව මුතු වට්ටිය ගැනද දන්නෙ නෑ. කවුරු හරි ඒක ඇහිඳගෙන අයිතිකාරයා සොයාගන්න බැරුව රණ්ඩු වෙනවද දන්නෙ නැහැ නේ. ඒ නිසා අපි මේ හරියෙන් හැංගිලා අහගෙන ඉඳිමු.' සුභානි කිව්වාම තුන්දෙනාම ගස් වදුලකට මුවා වෙලා අහගෙන හිටියා.

6
ගං ඉවුරේ පන්තියක් ද?

ගං ඉවුරේ කීප දෙනෙක්ම රැස්වෙලා හිටියා. තරමක් මැදි වයසේ පිරිමි දෙන්නෙක් තමයි හයියෙන්ම කෑ ගහමින් බනින්නේ. ගං ඉවුරේ තරමක ලොකු ප්ලාස්ටික් පීප්ප කීපයක් තියෙනවා. අර බනින එක්කෙනෙක් බැන බැනම ඒ පීප්ප සෝදනවා ගඟේ දමාගෙන. පීප්පවල ගෑවිලා තිබුණු පාට පාට තීන්ත ගඟේ වතුරේ දිය වෙවී යනවා. මේ කරන වැඩේට රැස්වෙලා ඉන්න අය විරුද්ධවෙලා තමයි මෙතැන මේ කලබලය!

'අපි කවුරුත් වතුර ගන්න ගඟට ඔය තීන්ත වතුර දමන්න එපා. කී දවසක් කීවද? මේකෙන් ගමේ කාටත් වෙන හිරිහැරේ තේරුම් ගන්නෙ නැත්තේ මොකද අමරපාල.' වයසක සීයා කෙනෙක් කියනවා.

'බොරුවට කෑ ගහන්න එපා පිටර් මාමේ. ගමේ ගෙවල්වල වැඩි දෙනා දැන් කාලේ කෑමට බීමට වතුර ගන්නේ තම තමන්ගේ වත්තෙ පිටියෙ තියෙන ළිඳකින්. නාන්න තමයි ගඟට එන්නේ. මේ බැරල් එකේ ගෑවිච්ච තීන්ත ටිකක් වතුරට කළවං වුණා කියලා මහ ලොකු කරදරයක් වෙනවයැ? නිකං මේ බොරුවට කෑගහනවා අපේ මේ තීන්ත බිස්නස් එක කඩාකප්පල් කරන්න. අපි කීයක් හරි සොයාගන්නවට ඉරිසියාවෙද කොහෙද.' අමරපාල කියන එක්කෙනා ආ පිට කෑගහනවා.

'ඇරත් මේ හරක් හිටං නාවන ගඟේ? අපි තීන්ත ටිකක් ගඟට හැලුවම තමයි කෑගහන්නේ ලෝකෙ කඩා වැටුණා වාගේ.' අමරපාලත් එක්ක තීන්ත පීප්ප සෝදන අනිත් එක්කෙනා කියනවා. 'ඔහෙලට වගේම අපටත් අයිතියක් තියෙනවා නේ මේ ගඟ පාවිච්චියට ගන්න. ඉතින් අපට බැරි මොකද අපට ඕනෑ දෙයක් කරන්න?'

'පියසිරි මාමේ' ඒ ගමන හරිම සන්සුන් හඬකින් කතා කළේ සුරේන්ට වඩා ටිකක් ලොකු පිරිමි ළමයෙක්. 'කාටත් පොදු දේවල්, කවුරුත් ප්‍රයෝජන ගන්න දේවල් එහෙම එක එක්කෙනාගේ තනි කැමැත්තට, අනික් අයට කරදරයක් වෙන විදිහට පාවිච්චි කරන්න බැහැ. මේ ගඟේ වතුර කීප දෙනෙක්ම ගෙදර දොරේ වැඩට ගන්නවා, බීමට ගන්නවා. අපි හැමෝම වාගේ නාන්න එන්නේ මේ ගඟට. තව එළවළු කොරටුවලටත් ගඟෙන් තමයි වැඩි දෙනා වතුර ගන්නේ. ඔය තීන්තවල තියෙන රසායනික දේවල් නිසා මේ වතුර අපිරිසිදු වෙනවා. වතුරට විස එකතු වෙනවා. ඉතින් එහෙම කවුරු කවුරුත් ප්‍රයෝජනයට ගන්න දේවල්වලට හිතුමතේට හානිකරන්න කාටවත් බැහැ කියලා නීති තියෙනවා[4].' ඒ ළමයා පැහැදිලි කළා.

'නීති? නීති? කවුද ඔය නීති හදන්නේ? මං මොකටද නීතියට බයවෙන්නේ?

4 ජල සම්පත මිනිස් අවශ්‍යතාවන් රාශියකට යොදාගන්නා ප්‍රධාන පරිසර සම්පතකි. හිතකර සේ භාවිතයට ගැනීමට නොහැකි වන ආකාරයට මිනිසුන් විසින් කරන ක්‍රියාකාරකමක් හරහා ජලයේ ගුණාත්මකභාවය පහත හෙළීම පරිසර දූෂණයක් ලෙස සැලකිය හැකිය. එවැනි අහිතකර ක්‍රියාකාරකම් සඳහා උදාහරණ වන්නේ කර්මාන්තශාලා හරහා සෘජුවම අපද්‍රව්‍ය ජලයට බැහැර කිරීම සහ කෘෂිකර්මාන්තයේදී භාවිත කරන රසායනික පොහොර සහ කෘමිනාශක ජලයට හෙළීමයි.



මොකෝ අපි
හොරකමක්
කරලයෑ? ආං
එහෙම කළා නං
නීතියට යටයි.
මේ තීන්ත ගෑවුණු
පිප්පයක් දෙකක්
ගඟේ තියාගෙන
හෝදන එක
වළක්වන්න කොහෙද
නීති තියෙන්නේ?
නිකං මුසාවාද
කියන්න එපා
ළමයෝ' අමරපාල
කෑගැහුවා. පියසිරි
මහ හයියෙන්
හිනාවුණා.

'මං මොකටද
මාමලට බොරු
කියන්නේ. එහෙම
නීති තියෙනවා.
පරිසරයේ තියෙන
ගංගාවල් ඇළදොළ,
එතකොට මේ අපි
හුස්මගන්න වාතය
වුණත් කාටවත්
හිරිහැර වෙන
විදිහට අපිරිසිදු කරන්න තහනම් කියලා නීති තියෙනවා මේ රටේ. දැන් මාමාලා දෙන්නා මාසයක් දෙකක් තිස්සේ කවුරු කිව්වත් අහන්නේ නැතුව මේ ගඟට තීන්ත සෝදන වතුර එකතු කරනවා නේ. ඉතින් ඕක කිව්වට අහලා නවත්තගන්න බැරි නම් මේ ගමේ අඩුම ගානේ පස් දෙනෙකුටවත් එකතුවෙලා ඔය කරන වැඩේ නිසා මහජන පීඩාවක් වෙනවා කියලා පොලිසියේ පැමිණිල්ලක් දාන්න පුළුවන්.' ඒ ළමයා පැහැදිලි කරලා දුන්නා.

'හැබෑටම එහෙම පැමිණිල්ලක් කරලා මේ වාගේ හිරිහැර නවත්තන්න පුළුවන් කියලා නීතියෙන් ඉඩකඩ හදලා තියෙනවද දසුන් පුතේ? එතකොට එහෙම මහජන පීඩාවකට විරුද්ධව පැමිණිලි කරන්න පස් දෙනෙක්වත් එකතුවෙන්න ඕනෑ?'

පීටර් සීයයි තවත් වැඩිහිටි කීප දෙනෙකුයි දසුන්ගේ කතාව ගැන ලොකු උනන්දුවක් ගත්තා.

'මං හිතන්නේ ඔය කියන්නෙ පොදුවේ කාටත් කරදරයක් වෙනවා නං පැමිණිලි කරන හැටි නේ ද පුතා?' ඒ කිව්වේ ගඟට වතුර ගන්න ආ නැන්ද කෙනෙක්. 'ඒ ඇරෙන්න පවුල් දෙකක් හරි, දෙන්නෙක් අතර ප්‍රශ්නයක් නම් ඒ කරදරය විඳින පැත්තේ කෙනෙකුට පුළුවනි තනියම ගිහින් පැමිණිල්ලක් දාන්න. ඒකට පස් දෙනෙක් ඕනැ නෑ, එහෙම නේ ද දසුන් පුතා?'

'ඔව් ඔව් ලක්ෂ්මි නැන්දේ. ඒක තමයි හරි' කිව්වේ දසුන්

'හෝ! හෝ! අපේ ලක්ෂ්මි නඟත් පෙරකදෙරු විහාගෙ අරගෙන නේ! කවද්දෑ උසාවියේ කතා කරන්න යන්නේ?' ඒක විහිළුවකට ගන්න හැදුවේ පියසිරි.

'ඔය කාරණාව මං දන්නේ අපේ අක්කලාගේ ගෙදරයි එයාලගේ අල්ලපු ගෙදරයි අතර වෙච්චි ප්‍රශ්නයක් නිසා.' ඒ සමච්චලේ ගණන් නොගෙන ලක්ෂ්මි නැන්ද විස්තර කරන්න ගත්තා. 'අක්කලාගේ අල්ලපු ගෙදර කාණ්ඩෙ වහිනකොට ඒ ගෙදර පිල්ලෙන් එන වතුර අක්කලගෙ ගෙදර මිදුලට වැටෙන විදිහටයි හදලා තිබුණේ. ඒකෙන් හරි කරදරයි. එතකොට ග්‍රාම සේවක නෝනට කිව්වාම උපදෙස් දුන්නා කියලා බේරුමක් කරගන්න බැරි නිසා පොලිසියේ පැමිණිල්ලක් දාන්නය කියලා. අක්කා පොලිසි යන්න අකැමැති වුණාම අක්කා වෙනුවට ඉස්සරහ ගෙදර ඉන්න නැන්ද ඉදිරිපත් වුණා ගිහින් පැමිණිල්ල කරන්න. ඒත් ග්‍රාම සේවක නෝනා කිව්වා එහෙම බෑ ඒ වාගේ පොදුවේ පීඩාවක් නොවන සිවිල් ප්‍රශ්නයකදී ඒකට මූණ දෙන එක්කෙනාම හරි ඒකෙන් කෙලින්ම කරදරයට පත් වෙන කෙනෙකුට හරි විතරයි ඒ ප්‍රශ්නය ගැන පැමිණිලි කරන්න පුළුවන් කියලා.' ලක්ෂ්මි නැන්ද විස්තර කළා[5].

'ලක්ෂ්මි දුව ඒ කාරණාව කියාදුන්නු එක හොඳයි. ඒකෙන් අපි දැනගත්තා කෙලින්ම කාණ්ඩ දෙකක් අතරෙ තියෙන පරිසර ආරාවුලක් දුර දිග ගියොත් ඒ කරදරේ විඳින පැත්තේ කෙනෙකුට කෙලින්ම ගිහින් පැමිණිල්ලක් දාන්න පුළුවන් වග. ඒකට තවත් පිරිසත් එකතු කරගන්නෙ නැතුව පැමිණිලි කරන්න පුළුවනි. දැන් මේ අමරපාලලා කරන වැඩේ පොදුවේ කාටත් හිරිහැරයක් වෙන මහජන පීඩාවක් නේ[6]. ඉතින් ඒ යටතේ තමයි මේ ගැන අපි කටයුතු කරනවා නම් කරන්න වෙන්නේ. එහෙම නේද දසුන් පුතේ?' කාරණාව තවත් පැහැදිලි කරගන්න ඇහුවේ පීටර් සීයා. දසුන් ඉතින් පරිසරයට හානි කිරීම වළක්වන්න තියෙන නීති ගැන තවත් විස්තර ටිකක් කියන්නයි සූදානම් වුණේ.

අමරපාලට තේරුණා දැන් නම් වැඩේ දුර දිග යනවා කියලා. ඉතින් එයා

5 මහජනයාට පොදු පාඩුවක්, අන්තරායක් හෝ අප්‍රසන්නතාවක් ඇති කරන නැතහොත් යම් පොදු අයිතිවාසිකමක් සම්බන්ධයෙන් ජනයාට පාඩුවක්, බාධාවක් හෝ අන්තරායක් හෝ අප්‍රසන්නතාවක් ඇති වන ආකාරයෙන් කටයුතු කිරීම හෝ එවැනි නීති විරෝධී නොකරහැරීමක් සිදු කරන අයෙක් මහජන කරදරයක් කිරීමේ වරදට වැරදිකරුවකු වේ.

6 එවැනි මහජන පීඩා ඉවත්කිරීම සඳහා අධිකරණ නියෝග ලබා ගත හැක.

කෑගහලා දසුන්ට බනින්න විතරක් නෙවෙයි ලැජ්ජා කරන්නත් ගත්තා නොයෙකුත් කතන්දර කිය කියා. 'හා මෙන්න ඇවිත් ශත වර්ෂෙට පහළ වෙච්ච පණ්ඩිතයා... තාත්තා හැමදම තැබෑරුම් ගාණේ... පුතා එනවා අපට නීතිය කියා දෙන්න. යනවා. යනවා. ගෙදර ගිහින් තාත්තව හදගන්නවා අපට නීතිය කියාදෙන්න කලින්.' කාටත් කලින් ඒ කතාවට විරද්ධ වුණේ එතැන හිටිය ආච්චි අම්මා කෙනෙක්.

'තාත්තා හැමදම තැබෑරුම් ගණේ වුණාට ඒ ගෙදර දරුවෝ ඔක්කොම දවස ගාණේ ඉස්කෝලේ....



නොවරදවා ඉස්කෝලේ යන යහපත් දරුවො. ඒ කාරණාවල් දැනගෙන කතා කරන්න! ඇරත් මේ දරුවා ඉස්කෝලේ ශිෂ්‍ය නායකයෙක්. ඉගෙනගන්නවා නම් රටේ තොටේ අපි නොදන්න කරණු කාරණා ගැන යහපත් දරුවන්ගෙනුත් ඉගෙනගන්න පුළුවන්.' ඒ ආච්චි අම්මා කාටත් ඇහෙන්න හයියෙන්ම කිව්වා. කීප දෙනෙක්ම ඒ කතාවට එකහෙළා එකඟවෙලා හිස වැනුවා.

අමරපාල ඊළඟට කතා කළේ සමච්චලේට. 'හා. ඕං මං ලෑස්තියි ඉගෙනගන්න. ඕං මං වාඩි වුණා' කියලා පීප්පයක් උඩ වාඩි වුණා. පියසිරිටත් වාඩි වෙන්න කිව්වා. 'දැන් කියමු බලන්න. මොකක්ද නීතිය කියන්නේ? කවුද ඔය නීති හැදුවේ? ඔහේද? පුළුවන් නම් තේරුම් කරලා දෙනවකො බලන්න, මොකක්ද නීතිය කියන්නේ?'

ඒ ප්‍රශ්නෙට දසුන්ට උත්තර දෙන්න බැරි වේවි කියලා හිතුව පීටර් සීයා,'මේ කතාවල පැටලි පැටලි ඉන්නෙ නැතුව දසුන් පුතා දැන් ගෙදර යන්න.' කියලා කිව්වා.

දසුන් යන්තමට හිනාවුණා. 'අමරපාල මාමා මෙච්චර උනන්දුවෙන් අහන එකේ ඔය ප්‍රශ්නෙට උත්තර දීලම යන්නං පීටර් සීයේ. මේ මම හිතලා කියන දේවල් නෙවෙයි නේ. අපට ඉස්කෝලේ හයේ හතේ පන්තිවලදි පුරවැසි අධ්‍යාපන විෂයට ඉගැන්නුව දේවල් මම මේ කියන්නේ.'

'ශත වර්ෂෙට පහළ වෙච්ච පණ්ඩිතයා! කතාව විතරයි. තාම මගේ ප්‍රශ්නෙට උත්තර නෑ.' අමරපාල පියසිරිට කියලා ඔලොක්කුවට හිනාවුණා. 'හරියකට පිළිගන්න පුළුවන් විදිහකට උත්තරේ ලැබුණොත් මං අහනවා. නැත්තං ගොයියෝ අදත් හෙටත් අනිද්දත් හැමදමත් මේ ගඟේ මෙතැනම තමයි අපි තීන්ත පීප්ප හෝදන්නේ!'

'මොකක්ද නීතිය? මොකක්ද නීතිය?' අමරපාල කියන කියන හැම එකටම ඔව්, ඔව් කියලා ඔලුව වනන පියසිරිත් හිරවෙක් වාගේ කෑගහනවා.

'නීතිය ගැන සරලම කිව්වොත් මෙහෙමයි.' දසුන් විස්තර කරන්න ගත්තා, 'අපි තනියම ඉන්න වෙලාවට අර අමරපාල මාමා කිව්වා වාගේ තමන්ට ඕනෑ දේ තමන්ට හිතුමතේ කරන්න පුළුවන්. හැබැයි දෙන්නෙක් හරි ඊට වැඩි ගණනක් ඉන්න තැනක අපි හැසිරෙන්න ඕනෑ අනෙක් අයට හිරිහැරයක් කරදරයක් නොවෙන විදිහටයි. ඒ කියන්නේ අනෙක් අයට බාධාවක් කරදරයක් වෙන විදිහට මහ හයියෙන් ශබ්ද කරන්න, කවුරුත් පොදුවේ පාවිච්චි කරන දේවල්වලට හානි වෙන විදිහට ඒවා නාස්ති කරන්න, කාටවත් හිරිහැර කරන්න බැහැ. අපි අනෙක් අය ගැන හිතලා අනෙක් අයට කරදරයක් නොවෙන විදිහට හැසිරෙන්න ඕනෑ. ඒකට හදලා තියෙන ක්‍රමය තමයි නීතිය කියන්නේ[7].'

'ඉතින් අයියේ එතකොටත් එක එක්කෙනාට හිතෙන හැටියට එක එක දේවල් කරන්න පුළුවන් නේ. තමන් මෙහෙම හැසිරෙන එක අනිත් අයට කරදරයක් කියලා කවුරු හරි කෙනෙක් නොහිතන්න පුළුවන් නේ ද? දැන් අපට හිතුණාට ගඟේ වතුරට තීන්ත මිශ්‍ර කරන එකෙන් වතුර අපිරිසිදු වෙනවා, ඒක හානියක් කියලා අමරපාල මාමාලාට හිතෙන්න පුළුවන් ඒක ලොකු හානියක් නෙවෙයි කියලා. ඒගොල්ලන්ට තීන්ත පීප්ප හොඳන්න වෙන තැනක් නැති නිසා මෙහෙම කළාට කමක් නෑ කියලා එයාලට හිතෙන්න පුළුවන්. කොහොමද තීරණය කරන්නේ කවුරු හිතන එකද හරි කියලා?' ඒ ප්‍රශ්නේ ඇහුවේ දසුන්ගේ නංගි සුමාලි. එයා නම් සුභානි ගේ සුරේන්ගේ වයසේ වාගේ. කවුරු කවුරුත් උනන්දු වුණා ඒකට උත්තරේ දැනගන්න. අමරපාල මාමාටත් සමච්චලේ අමතක වෙලා බොහොම වුවමනාවෙන් කතාව අහන්න ගත්තා.

'ඒක හරියටම හරි නංගි. ඒ හින්ද තමයි මෙන්න මේවාගේ තැනකදි මෙන්න මේ වාගේ හැසිරෙන්න තහනම්, මේ වාගේ දේවල් කරන්න ඉඩ තියෙනවා, මේ වාගේ දේවල් තහනම් කියලා හැමෝම පිළිපදින්න ඕනෑ විදිහට නීති හදලා තියෙන්නේ. උදාහරණයක් කිව්වොත්, කවුරු හරි වැඩිහිටියෙක් එයාගේ තනි කැමැත්තට එයාගෙ ගෙදරදි දුම් බොනවා කියලා හිතමු, ඒකෙන් එයාගේ සෞඛ්‍යයට වෙන හානිය ගැන හිතන්නේ නැතුව ඒක කරන්න එයාට නිදහස තියෙනවා. හැබැයි බස් එකක යනකොට නැත්නම් වෙනත් පොදු තැනක දී දුම් බොන්න තහනම්. මොකද එයාට අයිතියක් නෑ එයාගෙ දුම් ඕම නිසා අවට වාතයට එකතු වෙන දුමෙන් අනෙක් අයගේ සෞඛ්‍යයට

7 සරලව නීතිය යනුවෙන් හඳුන්වනු ලබන්නේ දෙදෙනෙකු හෝ වැඩි පිරිසක් සිටින තැනක කරන කටයුතු සියලු දෙනාගේම ආරක්ෂාව පිණිස පාලනය කරන ක්‍රමවේදයයි. නීතිය කිසියම් බලධාරී ආයතනයකින් පණවා බොහෝ විට ලිඛිතව සකස් කරන රීති සමුදායකි. එවැනි රීතියක් උල්ලංඝනය කළහොත් එම බලධාරී ආයතනය මැදිහත් වීමෙන් දඬුවම් කිරීමට අත් අඩංගුවට ගැනීමට හෝ ඇතැම් විට සිරගත කිරීමට පවා හැකියාව පවතී.



හානියක් වෙන්න ඉඩ තියන්න... ඉතින් බස් එකේ යනකොට දුම් බොන්න තහනම් කියලා නීතියක් හදලා තියනවා. ඒ ගැන බස් එකේ ප්‍රදර්ශනය කරලත් තියනවා. එතකොට කවුරු හරි බස් එකේ දුම් බිව්වොත් අනෙක් අයට පුළුවන් ඒකට විරුද්ධ වෙන්න... එහෙම බැලුවාම නීතිය කියලා කියන්නේ දෙන්නෙක් නැත්නම් ඊට වැඩි පිරිසක් ඉන්න තැනක දි හැමදෙනාටම ආරක්ෂාවක් ලැබෙන විදිහට අපි හැසිරෙන්න ඕනෑ ආකාරය පාලනය කරන ක්‍රමයක් කියලා කියන්න පුළුවන්...' කට්ටියම හා හුම් නැතුව අහන් ඉන්නවා.

දසුන් තවත් ටිකක් එකතු කළා ඒ විස්තරේට, 'එහෙම අණ පනත්වලිනුත් රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙනුත් පිළිඅරගෙන හදලා තියෙන නීති කැඩුවොත් ඒ ගැන මිනිස්සුන්ට පැමිණිලි කරන්න අයිතියකුත් දීලා තියෙනවා නීතියෙන්. ඒ ගැන පරීක්ෂා කරලා ඇත්තටම එහෙම වරදක් නීතියට අනුව වෙලා තියෙනවා නම් උසාවියකින් දඩුවම් නියම කරන්නත් බලයක් තියනවා. ඒ ඒ නීතිවල හැටියට ඒ ඒ වැරදිවලට දෙන දඩුවම් වෙනස්වෙනවා[8]'.

'ඉතින් ඔය නීති ගැන නොදන්න අය තම තමන්ට කැමති විදිහට හැසිරෙන්නත් ඉඩ තියෙනවා නේ දසුන් පුතේ. දැනගෙන කළා වුණත් අපොයි අපි දන්නෙ නැහැ ඔහොම නීතියක් ගැන කියලා කාට හරි ගැලවිල්ලට කියන්නත් පුළුවන් නේ.' ඒ ඇහුවේ පීටර් සීයා.

'ආං හරි, ඒක නේන්නං, කවුද දන්නේ ඔහොම නීති තියෙනවා කියලා. අපි දන්නෑ ඔහොම නීති ගැන. මෙයා මෙතන කිව්වට අපි දන්නවද ඕවා ඇත්තම ද කියලා.' ඔන්න ඒ පාර අමරපාල මාමා පොටක් පාදගෙන කෑගහන්න ගත්තා.

ඒත් දසුන් නෙවෙයි කලබල වුණේ. 'ඒ කතාවෙන් ඒ තරම් වැඩක් වෙන්නේ නැහැ අමරපාල මාමේ. එහෙම දැනගෙන හිටියෙ නෑ කියලා නීතියෙන් ගැලවෙන්න බැහැ. නීතියක් ගැන නොදැන සිටීම වැරැද්දකින් නිදහස් වෙන්න හේතුවක්

8 නීතියේ සුවිශේෂ ලක්ෂණයක් වන්නේ සෑම විටම අපගේ අසල්වැසියාගේ අයිතිවාසිකම්වලට සහ නිදහසට බාධාවක් නොවන ප්‍රමාණයට අපට නීතිය මඟින් නිදහස නිමි වීමයි එවැනි නීති කඩකිරීම දඩුවම් ලැබීමට හේතු වන අතර අප කැමැති වුවත් අකැමැති වුවත් නීතිය කඩකළහොත් දඩුවම් ලැබීමකට හෝ වන්දි ගෙවීමකට අනිවාර්යයෙනම යටත්වීමට සිදු වේ එය නීතියේ පවතින තවත් ප්‍රධානතම ලක්ෂණයකි

නෙවෙයි. ඒ හින්දා අපේ ජීවිතවලට නිතර බලපාන නීති ගැන අපි කවුරු කවුරුත් දැනුවත්වෙලා ඉන්න එක වැදගත්. විශේෂයෙන් අපි කවුරුත් හවුලේ පාවිච්චි කරන සම්පත්, ඒ කියන්නේ මේ ගඟ, ගං ඉවුර, මේ අවට කැලෑවයි කන්දයි වාගේ සම්පත් ආරක්ෂා කරගන්න, ඒවා කාට කාටත් ප්‍රයෝජනයක් වෙන විදිහට පරෙස්සමෙන් පාවිච්චි කරන්න අපට මග පෙන්වන නීති ගැන අපි දැනගෙන ඉන්න ඕනෑ. ඒ වාගේම අපි කාටත් පොදුවේ ඕනෑ වෙන පාරවල් එහෙම පාවිච්චි කරද්දී අපට කරන්න ඉඩ තියෙන දේවල් මොනවද, නීතියෙන් තහනම් කරලා තියෙන්නේ මොනවද කියලා කියාදෙන නීති ගැන අපි දැනගෙන ඉන්න ඕනෑ. යම් තරමක්වත් ඒවා ගැන දැනගෙන හිටියාම කාට කාටත් ලේසියි.' දසුන් තවත් විස්තර කළා.

'ඉතින් කවුදෑ ඔය නීති හදන්නේ?' ඒ ඇහුවේ පියසිරි මාමා

'ඒ ඒ වැඩ ගැන සොයන්න බලයක් තියෙන ආයතන මුල් තැන ගන්නවා ඒ ඒ වැඩවලට අදාළ නීති හදන්න[9]. ඉතින් ඒකට ඕනෑ කරන දැනුම තියෙන වෙනත් අයවත් හවුල් කරගෙන තමයි නීති හදන්නේ. ඒ කියන්නේ ඔන්න අපි හිතමු මුහුදු වෙරළ ආරක්ෂා කරගෙන පාවිච්චි කරන්නේ මෙහෙමයි කියලා තියෙන නීති හදන්නේ, ඒ නීති ක්‍රියාත්මක කරන්නේ වෙරළ සංරක්ෂණ අධිකාරිය කියන කාර්යාලය. එතකොට මේ වනාන්තර, වන සතුන් ආරක්ෂා කරන්නේ පරිසර අමාත්‍යාංශය යටතේ. ඒවට බලපාන අණ පනත් පාර්ලිමේන්තුවෙන් සම්මතවෙලා තියෙනවා. ඒවා ගැන සොයාබලන්න වෙන වෙනම දෙපාර්තමේන්තු තියෙනවා.'

'පුදුම වැඩක් නේ. එතකොට අපට කිසි නිදහසක් නෑ. හතර අතේ නීතිවලින් වටවෙලාද අපි ජීවත් වෙන්න ඕනෑ?' ඔන්න අමරපාලට ආයිමත් තරහා ගිහින්. හැබැයි එතැන හිටිය තවත් කීප දෙනෙකුත් අමරපාලගේ පැත්තට ඒ වෙලාවේ කතා කරන්න ගත්තා.

'ඇත්ත නේන්නං. මනුස්සයන්ට තමන්ට ඕනෑ හැටියකට ජීවත්වෙන්න සතුටෙන් විනෝදෙන් තමන් කැමැති දෙයක් කරන්න එතකොට ඉඩක් නෑ? හැමවෙලාවෙම නීතියට බයවෙලා ඉන්න ඕනෑ?' එතැන හිටිය තරුණ පිරිමි කීප දෙනෙක් කියන්න ගත්තා.

'නීතියට බයවෙලා නෙවෙයි... නීතියට ගරු කරලා කිව්වොත් තමයි හරි. මේ නීති තියෙන්නේ අපේම ආරක්ෂාවට නේ. ඔන්න හිතන්නකෝ අපි පිට්ටනියේ ක්‍රිකට් සෙල්ලම් කරනවා කියලා. ඉතින් එතැන අපට ඕනෑ හැටියට විනෝදෙන් සෙල්ලම් කරන්න පුළුවන්. හැබැයි හැමෝම ගමන් බිමන් යන පාරේ අපි සෙල්ලම් කළොත්

9 බලධාරියකු විසින් නීතිය පණවා නිබිමත් එහි කළ යුතු කුමක් ද නොකළ යුතු කුමක්ද යන්න නිශ්චිතව දක්වා නිබිමත් දක්නට ලැබේ. නීතියට පටහැනිව ක්‍රියා කළ අයෙකු නීතියේ රැහැනට හසු කරගැනීමට රජයේ ආයතන පද්ධතියක් ඇත. ග්‍රාම නිලධාරි, පොලිස් ස්ථානාධිපති, වනාන්තර සම්බන්ධයෙන් නම් වන ආරක්ෂක නිලධාරීන්, වන ජීවී නිලධාරීන්, පාරිසරික දූෂණයන්ගෙන් ආරක්ෂා කරගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය සහ ඒ යටතේ පාරිසරික පොලිසිය වැනි බලධාරී ආයතන ඇත. ළමා අපයෝජනයක් නම් ළමා ආරක්ෂක අධිකාරිය සහ ළමා රැකවරණය සම්බන්ධයෙන් කටයුතු කරන වෙනත් රජයේ ආයතනද පාසලක නම් විදුහල්පතිවරු සහ විනය පාලනය කිරීමේ ගුරුවරුද එයට ඉහළින් කලාප අධ්‍යාපන කාර්යාලයේ අදාළ නිලධාරිනුද වෙති.

පාරේ යන අය ගැන වගේ වගක් නැතුව, බැට් එකක් බෝලයක් වැදිලා ඒ අයට තුවාල වුණොත් අන්න අපි වැරැද්දක් කළා වෙනවා... නැත්තං හිතන්නකො අපි මොකක් හරි වාහනයකින් ගමනක් යනවා කියලා. හැබැයි හිතුමතේට මගේ වාහනේ මට ඕනෑ විදිහට මං යන්නේ කියලා පරෙස්සමක් නැතුව ගියොත් පාරේ යන අනෙක් අයටත් පාර දෙපැත්තේ තියෙන ගෙවල්වලටත් කඩසාප්පුවලටත් හානියක් වෙනවා නේ. ඒ හින්ද පාරේ වාහන පදවන්න පුළුවන් මෙන්න මෙහෙමයි කියලා මහාමාර්ග නීති හදලා තියෙනවා. වාහන එළවන්න ලයිසන් ගන්න කලින් අපිට මාර්ග නීති ගැන උගන්නන්නේ ඒකයි. මාර්ග නීති කැඩුවොත්, කාට හරි අනතුරක් වෙන විදිහට පාරේ ගියොත් මාර්ග නීති යටතේ දඩුවම් කරන්න පුළුවන්... අනෙක් අයට හිරිහැරයක් කරදරයක් නොවෙන විදිහට හැසිරෙන එක අපේ යුතුකමක්. ඒකට අපට උදව් කරන්නේ නීතිය තමයි.' දසුන් තේරුම් කරලා දෙන්න මහන්සි ගත්තා.

ඒ මහන්සිය අපතේ ගියේ නෑ. ඒ බව තෙරුණෝ අර තරුණ කට්ටියගේ කතාවෙන්. 'හරි. හරි. එතකොට මල්ලි කියන්නේ අපට නිදහස තියනවා අපිට කැමති දෙයක් කරන්න. ඒ වුණාට වගකීමෙන් ඒ නිදහස පාවිච්චි කරන්න අපට යුතුකමකුත් තියනවා කියල නේ?'[10]

'හරියටම හරි අයියේ. නිදහසයි යුතුකමයි හරියට කාසියක දෙපැත්ත වාගේ. එකක් නැතුව අනෙක ආරක්ෂා වෙන්නේ නැහැ.' දසුන් කිව්වා.

'හෝ! හෝ! දැන් නේ මේ කතාව ඔලුවට ගියේ.' තරුණ කාණ්ඩෙ තව එක්කෙනෙක් කිව්වා. 'අපේ යුතුකම අපි කළේ නැත්තං, ඒ යුතුකම් අනුව වැඩ කරන්න අපට මග පෙන්වන නීති පිළිපදින්නේ නැත්තං ඒකෙන් තවත් කෙනෙකුගේ නිදහස නැති වෙනවා. පාරේ අපි අනතුරුදායක විදිහට හැසිරුණොත් අනෙක් අයට නිදහසේ පාරේ යන්න තියෙන ඉඩකඩ නැතිවෙනවා. එහෙම අනෙක් අයට හිරිහැරයක් වෙන විදිහට පොදු තැනක හැසිරුණොත්, පොදු දේවල්වලට හානි කළොත් ඒක මහජන පීඩාවක් වෙනවා. මං හරි ද මල්ලි?' එයා දසුන්ගෙන් ඇහුවා.'

දසුන් සතුටෙන් ඔලුව වැනුවා. 'ඒක හරි අයියේ. අපේ අසල්වැසියන්ගේ නිදහසට බාධා නොවෙන විදිහට අපේ වැඩ කරගන්න අපට නිදහසක් තියෙනවා. ඒ විදිහට වගකීමෙන් හැසිරෙන එක අපේ යුතුකම. නීතියේදි මිනිස්සුන්ගේ නිදහසයි යුතුකමයි කියන කාරණා දෙකම එක වාගේ වැදගත් වෙනවා.'

'ඔන්න ආයේ පැටලුණා' ඒ ගමන නැගිටලා දසුන් ළඟට එමින් කිව්වේ පියසිරි. 'මං පාරේ තොටේ යනකොට හරි මම ටවුමට යනකොට හරි මගේ අසල්වැසියෝ මා එක්ක යනවා එනවයෑ? ගෙදරින් පිටත කොහේ හරි යන තැනකදී මං කොහොමද මගේ අසල්වැසියන්ගේ නිදහස රකින්නේ. එතකොට මං මගේ ගෙදර අහල පහළ ඉන්න අසල්වැසියන් ගැන හැම තැනකදිම හිතන්න වෙනව ද? මට ඒ කාරණාව කොහොමටවත්ම තේරුණේ නෑ.' පියසිරි මාමා නොරිස්සුමෙන් කිව්වා.


10 නීතිය මගින් පුද්ගලයන්ගේ මානව අයිතිවාසිකම් ආරක්ෂා කර දෙනු ලබයි. අපට මූලික වශයෙන් මිනිසකු ලෙස උපත ලැබීම නිසා හිමිවන්නා වූ අයිතිවාසිකම් මානව අයිතිවාසිකම් වේ. එය රජයට, පොලිසියට, කිසියම් බලධාරියකුට අහිමි කිරීමට හෝ උදුරාගැනීමට හෝ නොහැක.

තවත් කීප දෙනෙකුටම ඒ ප්‍රශ්නයම තියෙනවා කියලා එයාලාගෙ මූණුවලින් පෙනුණා.

'පියසිරි මාමේ. අපි සාමාන්‍යයෙන් අසල්වැසියෝ කියන්නේ අපේ ගෙවල් අහල පහළ ඉන්න අයට තමයි. ඒත් නීතිය ගැන කතා කරද්දි අසල්වැසියෝ කියන්නේ ඒ වෙලාවට තමන් අසල ඉන්න අයට. ඒ කියන්නේ මම බස් එකේ යනකොට මාත් එක්ක එකට ඒ බස් එකේ යන අය මගේ අසල්වැසියෝ. මම ටවුමේ සමුපකාරෙට, පොළට ගියාම එතැන ඉන්න අනෙක් අය මගේ අසල්වැසියෝ, ඉස්කොලෙට ගියාම පාසලේ ඉන්න ඔක්කොම මගේ අසල්වැසියෝ. එතකොට මෙතැන මේ ගමේ දි මේ ගඟ හවුලේ පාවිච්චි කරන අපි කවුරුත් ඒ අසල්වැසිකමෙන් බැඳුණු අය.' දසුන් විස්තර කළා.

'හ්ම්. හ්ම්. හ්ම්.' පියසිරි මාමා හෙමිහිට ආපහු ගිහින් තීන්ත පීප්පෙ උඩ වාඩි වුණා. අමරපාල මාමා දිහා බැලුවා. අමරපාල මාමා මොකුත්ම නොකියා ගඟ දිහා බැලුවා.

දැන් අමරපාල මාමා
මොනවා හරි කියයි කියලා
කවුරුත් බලාගෙන හිටියට
අමරපාල මාමා නිශ්ශබ්දයි.
මොකුත්ම කිව්වෙත් නෑ,
අනිත් කවුරුවත් දිහා
බැලුවෙත් නෑ.



'මට පේන්නේ අපේ ජීවිතවලට නිතර බලපාන නීති ගැන අපි තව ටිකක් දැනගත්තොත් හරිම වටිනවා' ඒ කිව්වේ අර කලින් කතා කළ තරුණ කාණ්ඩෙ එක්කෙනෙක්. 'මල්ලිට බැරි ද අපේ ගෙවන සමාජෙට ඇවිත් ටිකක් අපිව දැනුවත් කරන්න. අපි දවසක් ලෑස්ති කරලා කියන්නම්.[11]'

11 මානව අයිතිවාසිකම් ලෙස හඳුන්වනු ලබන්නේ සිතීමේ නිදහස, යමක් රැසවිදීමේ නිදහස, යම් යම් දේ මෙනෙහි කිරීමේ නිදහස, තමන් කැමති ආගමක් ඇදහීමේ නිදහස, ගැහැනු පිරිමි හෝ අබාධ සහිත වීම නොවීම යනාදි කරුණු නිසා වෙනස් කොට සලකනු ලැබීමකට ලක් නොවීම, තමන් කැමැති ප්‍රදේශයක ජීවත් වීම, පාසලක ඉගෙනීම ලැබීම, කෲර සහ අවමන් සහගත සැලකීම්වලට භාජනය නොවී සිටීම ඇතුළු තවත් අයිතිවාසිකම් සමූහයක් වේ. එවැනි සැලකීමක් රාජ්‍ය නිලධාරීන් විසින් සිදුකළහොත් අයිතිවාසිකම් කඩකිරීම යටතේ නීතිය ක්‍රියාත්මක වේ. රජයේ නිලධාරියෙක් යම් පුරවැසියකු එසේ කෲර අමානුෂික අවමන් සහගත සැලකීමකට ලක්කළහොත් එය මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු ලබයි.

ආං හොඳ වැඩේ කියලා කවුරුත් ඒ අදහස පිළිගත්තා. ඒත් දසුන්ට නම් තිබුණේ වෙනත් යෝජනාවක්.

'ඒක ඇත්ත අයියේ. අපි ඔක්කොම නීතිය ගැන දැනගෙන ඉන්න එක වටිනවා. වැඩියෙන්ම අපි ළමයි, තරුණ අය එහෙම නීතිය ගැන දැනගෙන වැඩ කළාම අපිට පාර වරද්දගන්නේ නැතුව ජීවිතේ ඉස්සරහට යන්න පුළුවන් කියලයි ඉස්කෝලෙදි අපට මේවා කියා දුන්නු පුරවැසි අධ්‍යාපන ටීචර් සමන්ති මැඩම් නිතරම කියන්නේ. මට වඩා හොඳයි අයියේ අපි සමන්ති මැඩම්ට ආරාධනා කළොත් ගමට ඇවිත් අපේ තරුණ සමිතියට නීතිය ගැන දැනුවත් කරන්න කියලා.' දසුන් යෝජනා කළා. 'ළමයින් ආරක්ෂා වෙන්න ඕන හැටි වාගේ තව ගොඩක් නීති කාරණා තියෙනවා නේ අපට වැදගත් වෙන. සමන්ති ටීචර් අපි කාටත් ඒ දේවල් හොඳට තේරුම් කරලා දෙයි.'

ඒ යෝජනාව හරි කියලා කවුරුත් පිළිගත්තා. 'හැබැයි පුතාලා එහෙම වැඩක් යෞවන සමාජෙන් කරන දවසකට මේ නාකි උදවිය කියලා අපව අයින් කරන්න එහෙම එපා. අපටත් කියන්න ඕනෑ. හැරමිටියෙන් යන වයසේ ඉන්න අපටත් නීතිය ගැන දැනගන්න එක වැදගත්.' පීටර් සීයා කිව්වේ හිනාවෙවී.[12] අනිත් අයටත් හිනා.

'කියනවා කියනවා සීයේ. කාටත් ආරාධනා කරනවා. ඉක්මනටම ඒ වැඩේ ලෑස්ති කරමු' කියලා එතැන හිටිය යෞවන සමාජෙ කට්ටිය කිව්වා.

ඔන්න ඉතින් ගං ඉවුරේ පන්තිය විසිරිලා යන්නයි ලෑස්තිය. කවුරු කවුරුත් දසුන් කියා දුන්නු කාරණා විතරක් නෙවෙයි, ඉවසීමෙන් ඒ කාරණා කියා දුන්නු විදිහත් අගේ කළා.

'අයියේ අද අපිට උත්සවේ වැඩ ගොඩයි නේ ඉස්කෝලේ. දැන් නොගියොත් පරක්කු වෙනවා.' සුමාලි දසුන්ට මතක් කළා.

දසුන් නංගිත් එක්ක ආපහු ගෙදර යන්න හැරුණා. අනෙක් අයත් නීතිය ගැන අලුතෙන් දැනගත්ත කාරණා ගැන එකිනෙකා එක්ක කතා කරමින් තම තමන්ගේ වැඩට ගියා. ගං ඉවුර හිස් වුණා. අමරපාල මාමයි පියසිරි මාමයි හිස් තීන්ත පීප්පත් ළඟ තියාගෙන ඔහේ බලා හිටියා. දැන් මොකද කරන්නේ කියන ප්‍රශ්නය දෙන්නගෙම හිතේ තිබුණත් දෙන්නම කතාවක් නෑ.

හිටිගමන් අමරපාල මාමා 'ඔහොම ඉන්න! ඔහොම ඉන්න!' කියලා කෑගහගෙන දසුන් පස්සෙන් එළවන්න ගත්තා. ඒක දැක්ක පීටර් සීයාත් එතැනට දුවගෙන ආවා. දසුනුත් සුමාලිත් නැවතිලා හැරිලා බැලුවේ ටිකක් බයෙන්.

12 නීතිය සහ සමාජයේ සිරිත් විරිත් අතර වෙනසක් තිබේ. අපේ එදිනෙදා පොද්ගලික හා සමාජමය කටයුතු අපට කැමති පරිදි සහ හුරුපුරුදු සිරිත් විරිත් අනුව කළ හැක. එයට අපට නිදහස තිබේ. එහෙත් එම චාරිත්‍ර පිළිපැදීමේදී හෝ අපගේ එදිනෙදා කටයුතු කිරීමේදී අනෙක් අයගේ නිදහසට බාධාවක් නොවන සේ එය කළ යුතු වේ. උදාහරණයක් සේ, අපට අවුරුදු චාරිත්‍ර ඉටු කරන විට කැමැති නම් ගිතිකෙළි භාවිත කළ හැක. එහෙත් එයින් යමෙකුට හෝ යම් දේපලකට හානියක් වන ආකාරයෙන් ඒවා භාවිත කළ නොහැක. එසේ නොකිරීමට අපට යුතුකමක් තිබේ. අපට නිදහස භුක්ති විඳීමට හැකි වන්නේ එය තවත් අයෙකුට හානියක් නොවන තාක් පමණි.

'ඇයි අමරපාල මාමා?' දසුන් ඇහුවා.

'එතකොට තීන්ත පීප්ප හෝදන්න තැනක් නැත්තං අපි කොහොමද තීන්ත බිස්නස් එක කරන්නේ? ... අපි දෙන්නා හරි අමාරුවෙන් පොඩියට වුණත් මේ ව්‍යාපාරෙ පටන්ගත්තේ. දැන් මේක නවත්තලා දාන්න කියලද කවුරු කවුරුත් කියන්නේ?' අමරපාල මාමා ඇහුවේ කණගාටුවෙන්.

'අනේ නැහැ මාමෙ. එහෙම දෙයක් නෙවෙයි කිව්වේ. මේ වාගේ තීන්ත ව්‍යාපාරයක් පරිසරයට හානියක් නොකර කරන්නේ කොහොමද කියලා කාගෙන් හරි උපදේසයක් ගන්න පුළුවන්ද? ඒ ගැන අහලා දැනගන්න කෙනෙක් ඉන්නවද?' දසුන් ඇහුවේ බොහොම කරුණාවෙන්. එයාටත් දුකයි අමරපාල මාමා ගැන. ඒත් එහෙමයි කියලා ඊට වැඩි පාඩුවක් හැමෝටම සිද්ධ වෙන විදිහේ පරිසර හානියකට යන්නත් ගමේ අයට බැහැ නේ.

'මාමාලාට ඔය තීන්ත බිස්නස් එක කරන්න කියාදුන්නු අයගෙන් අහල බලන්න පුළුවන් වේවිද මේ ගැන?' ඒ සුමාලි.

අමරපාල මාමා කල්පනා කරනවා. උත්තරයක් නැහැ.

'හා, මාමේ! ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් තියනවා ටවුමේ මාමා දන්නවා නේ ද?' ඒ ඇහුවෙත් සුමාලි.

'ඔව් ඔව් ඔය මෝටර් සයිකලේට බලපත්තරේ ගන්නයි, වෙන වෙන ආණ්ඩුවේ ලියකියවිලි ගන්නයි අපි යන්නේ එහාට. මං දන්නවා.'

'ආං එතැන ඉන්නවා ව්‍යවසායක සංවර්ධන නිලධාරී කියලා කෙනෙක්. ගම්වල කරන පුංචි ව්‍යාපාර ගැන සොයලා බලලා උදවි කරනවා. අපේ ග්‍රාම නිලධාරි නෝනගෙන් ඇහුවොත් මාමාට හරියටම කියයි ඒ ගැන. ගිහින් එයාට හරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වෙනත් ඒ වැඩ ගැන දන්න කෙනෙකුට හරි කිව්වොත් එයාලා උපදෙස් දෙයි මගේ හිතේ... හා. මාමේ. තවත් තියෙනවා කාර්මික සංවර්ධන මණ්ඩලය කියලා ආණ්ඩුවේ කන්තෝරුවක් ඔය වාගේ අලුතෙන් ව්‍යාපාර පොඩියට වුණත් පටන් ගන්න අයට ඒවා කරන හැටි, ඒකට ඕනෑ කරන තාක්ෂණය ගැන එහෙම කියා දීලා උදවි කරන. මාමා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඇහුවොත් ඒ ගැන දැනගන්න පුළුවන් වේවි.' සුමාලි තමන් දන්න දන්න දේ විස්තර කළා.

අමරපාල මාමා පුදුමයෙන් බලාහිටියේ 'මේ දරුවෝ කොපමණ දේවල් දන්නවද? දන්නෙ නැත්තං කාගෙන් හරි ඒ ගැන අහගන්න විදිහක් දන්න එකත්

කොපමණ වටිනවද' කියලා හිතමින්. කලින් දසුන්ට බැන වැදුණු විදිහ ගැන දැන් අමරපාල මාමාට දුකයි. ඒත් වැරැද්දට සමාවෙන්න කියන්න අමරපාල මාමාගෙ දිව නැවෙන්නේ නැහැ නේ. ඒ නිසා මොනවා කියන්නද කියලා වචන සොයාගන්න බැරුව ඔලුව වැනුවා.

'අපි ගිහින් එන්නං මාමේ. අපි යනවා පීටර් සීයේ.' කියලා දසුනුත් සුමාලිත් ගෙදර යන්න පිටත් වුණා. ටික දුරයි ගියේ. මෙන්න, 'ඉන්න! ළමයිනේ ඔහොම ඉන්න!' කියාගෙන අමරපාල මාමා ආයිමත් දුවගෙන එනවා. අයියයි නංගියි ඉතින් ආ පිට හැරිලා ආවා.

'කරුණු කාරණා ගමකට කියාදෙන්න සමත්කමක් තියෙන දූලා පුතාලා වාගේ දරුවො හරිම වටිනවා පුතේ.' අමරපාල මාමා කිව්වා.

දසුන් සන්සුන් විදිහට අමරපාල මාමා දිහා බැලුවා.

'හැම දරුවම වටිනවා මාමේ. සමත්කමක් තිබුණත් නැතත් හරි පාරේ ගියත් වැරදි පාරකට වැටුණත් හැම දරුවෙක්ම වටිනවා. දරුවන්ට තමන්ගේ වටිනාකම ගැන දැනෙන විදිහට වැඩිහිටියෝ හැමෝම වගකීමෙන්, කරුණාවෙන් දරුවන්ට සලකනවා නම්.....!' ඉතුරු ටික නොකියා දසුන් ලොකු හුස්මක් හෙළුවා.

අමරපාල මාමාගේ ඇස්වලට කඳුළු ඉනුවා. 'මට දැනෙනවා පුතේ... ඒ කාරණාවත් දැන් මට තේරුම් ගියා. මගේ අතින් ඉස්සෙල්ලා පුතාට වැරැදි වචනයක් කියවුණා. මං ඒ විදිහට, පුතාලගෙ හිත රිදෙන විදිහට කතා කළ එක වැරදියි කියලා දැන් මට තේරෙනවා. ඒ ගැන... ඒ ගැන... මට සමාවෙන්න දරුවනේ.'

'මාමා ඒක තේරුම් ගත්තා නං ඒ ඇති මාමේ.... අපි ගිහින් එන්නං.' දසුන් පුරුදු සන්සුන් හඬින් කිව්වා.

7
හඳ මාමාගෙ හොරකම

ගං ඉවුරේ කලබලය බලාගෙන ඉඳලා ඉගෙනගත්ත දේවල් ගැන අපේ සුභානිටයි සුරේන්ටයි සතුටුයි. 'ඉස්කෝලෙදි මම දසුන් අයියව දැකල තිබුණට කතා කරලා නැහැ නේ' සුරේන් කිව්වා.

'සුමාලිව නම් මම ටිකක් දන්නවා, මම හයේ ඒ පන්තියේ, එයා හය බී පන්තියෙ නේ.' ඒ සුභානි.

ඔන්න ඒ කතාව ඉවරවෙනකොටයි අයියටයි නංගිටයි සඳුනි ගැන මතක් වුණේ. සඳුනි නෑ!

'අයියෝ! කොහේ ගියා ද මේ ළමයා? ගඟ පැත්තටවත් ගියාද? ගඟට වැටුණාද?' සුරේන් කලබල වුණා.

'නෑ නෑ. එයා බට්ටා වාගේ හිටියට හොඳට මොළේ කල්පනා කරලා වැඩ කරන ළමයෙක්. අර තීන්තයි නීතියයි ගැන කතාව එයාට තේරෙන්නෙ නැති නිසා කම්මැලි හිතිලා යන්න ඇති පාර පැත්තටවත්. අපි උඩහට ගිහින් බලමු අයියේ.' සුභානි කිව්වා.

එහෙම කියලා ඉවරවෙන්න ලැබුණේ නෑ මෙන්න සඳුනි දුවගෙන එනවා, 'අන්න අරහෙ පාරේ දෙන්නෙක් මුතු වට්ටිය ගැන කතා කරනවා. එන්න එන්න යමු.' කියාගෙන.



'කවුද කවුද මුතු වට්ටිය හොයන්නේ? කවුරුවත් ඇහිඳගෙන ද?' අහගෙනම සුරේන් පාරට දිව්වා. සුභානිත් සඳුනිත් ඒත් එක්කම ආවා. පාරට ගොඩවෙන්න පය තිබ්බ සුරේන් ඉද්දි ගැහුවා වාගේ එතැනම නැවතුණා. කාසු අයියා! එතකොටම කාසු අයියත් සුරේන්වයි සුභානිවයි දැක්කා.

'කාසු අයියට යන්න දුන්නද අපේ අම්මයි තාත්තයි. අනේ ඒක කොච්චර දෙයක්ද?' සුභානි කිව්වා.

කාසු අයියා උත්තර දුන්නේ තරහෙන් 'මට යන්න දුන්නා?? මට යන්න දුන්නා නෙවෙයි මම ගඟට බැහැලා හරි මුතු වට්ටිය සොයාගෙන එන්නම් කියලා ආවා!'

'මේ... මේ.... මුතු වට්ටිය ගඟට වැටුණා කියලා කාසු අයියා දන්නේ කොහොමද?' සුරේන් බයෙන් බයෙන් ඇහුවා.

'දන්නේ? දන්නේ අපේ පොඩ්ඩා මෝඩකමට එහෙම දෙයක් කිව්ව නිසා!'

'පොඩ්ඩා කිව්වා? එයා දැකලද කවුරුවත් මුතු වට්ටිය .... මුතු වට්ටිය ... ගඟට වීසි කරනවා?' සුරේන්ට වචන පැටලෙනවා බයට.

'පොඩ්ඩා ඔයාලගේ මිදුලේ කන්ද පහළ හරියේ සෙල්ලම් කර කර ඉඳලා තියෙන්නේ මොන යකෙක් හරි ඇවිත් මුතු වට්ටිය අරන් ගිය වෙලාවේ. මට බනිනවා ඇහිලා පොඩ්ඩා දුවගෙන ආවා. එතකොට තමයි පොඩ්ඩා කිව්වේ එයා සෙල්ලම් කරනකොට දිලිසෙන බේසමක් එයාගේ ඔලුවට උඩින් පාවෙලා ගඟට ගියා කියලා.'

'ඉනින් එහෙනම් දැන් ඔයාට කරදරයක් නැහැ නේ? ඒක ලොකු දෙයක්' සුරේන් ලොකු සැනසිල්ලකින් වාගේ කිව්වා.

'කරදරයක් නෑ? එහෙම වෙන්න තිබුණා ඔයාලගේ අම්මයි තාත්තයි සාධාරණේට හිතුවා නම්! එයාලා ඒ පාර පොඩ්ඩාව අල්ලගත්තා පොඩ්ඩා මුතු වට්ටිය හංගලා බොරු කියනවා කියලා.' ඒක කියනකොට නම් කාසු අයියට ඇඬුම් ආවා. 'අනේ මගේ අසරණ පොඩි මල්ලියි අක්කයි! එයාලා බයවෙලා අඬන දිහා බලා ඉන්න බැරුව මම ආවා කොහෙන් හරි ඔය මුතු හට්ටිය මුට්ටිය වට්ටිය මොක වුණත් ඒක හොයලා ගෙනැත් දෙනවා කියලා.'

පොඩ්ඩට වුණු දේ ගැන ඇහුවම හැමෝටම දුකයි. සුරේන් හරිම අසරණ බැල්මකින් සුභානි දිහා බැලුවා. 'දැන් මොකද කරන්නේ? දැන් කොහොමටවත් කාසු අයියට කියන්න නම් බැහැ මුතු වට්ටිය වීසි කළේ කවුද කියලා.' දෙන්නටම හිතුණේ එහෙම. ඒත් මේ තරම් දෙයක් වෙලා තියෙද්දි ඇත්ත නොකියා ඉන්නේ කොහොමද? කරන්නේ මොකක්ද කියලා ඒ දෙන්නට හිතාගන්න බැහැ.

සඳුනිත් කතා නැහැ. පුංචි වුණත් එයාට දැනුණා මේ පරෙස්සමෙන් කතා තරන්න ඕනෑ වෙලාවක් කියලා. 'අම්මා ළඟක හිටිය නං අහන්න තිබුණා මොකක්ද කරන්න හොඳ කියලා.' එහෙම හිතුණාම සඳුනිට මතක් වුණා එයා ගෙදරින් ඈත

නේ ද ඉන්නේ කියලා. 'අනේ අම්මා හරි තාත්තා හරි ළඟ ඉන්නවා නම් දැන්' කියලා හිතුණාම සඳුනිට මොන තරම් දුක හිතුණාද කිව්වොත් හුස්ම ගන්නත් මෙහොතකට අමතක වුණා. මීට පස්සෙ නං කිසිම කිසි දුක මේ වාගේ තනියම කොහෙවත් යන්නේ නෑ. ආච්චි අම්මටවත් සීයා තාත්තටවත් කියන්නේ නැතුව කොහෙවත් යන්නේ නෑ නෑ නෑ ම යි කියලා සඳුනි තදින්ම හිතාගත්තා.

'මේ කවුද මේ නංගි? හදිස්සියෙම කාසු අයියා ඇහුවා.

'අපි මුතු වට්ටිය හොයන්න ගඟ පැත්තට ආ වෙලාවේ මේ නංගිව දැක්කේ. එයාට ඉස්කෝලෙ යන පාර වැරදිලා ඇවිත්.' සුරේන් කිව්වා. සුභානිගේ බය වුණු මූණ දැක්කාමයි සුරේන්ට මතක් වුණේ ගඟ දිහාට ආ කාරණාව නොකියා ඉන්න තිබුණා නේ ද කියලා.

කාසු අයියත් එක සැරේටම ඇහුවා, 'ඔයාලා කොහොමද මුතු වට්ටිය ගඟට වැටුණා කියලා දන්නේ?' පොඩ්ඩා ඒක කියනකොට ඔයාලා එතැන හිටියේ නෑ නේ.'

'අපි.... අපිට ... අපි නිකමට වාගේ ... ඇවිත් බැලුවේ ...' සුරේන් වචන ගලපා ගත්තේ අමාරුවෙන්. කාසු අයියට බොරුව තේරේවිද?

ඒත් කාසු අයියා කතා කළේ හරිම ලෙන්ගතුකමකින් 'ඔය දෙන්නා කොච්චර හොඳද? බොරුවට මං හොරෙක් කියලා කියන්නෙ නැතුව මුතු වට්ටිය හොයා ගන්න ආව නේ' කාසු අයියා එහෙම කිව්වාම තමන් කරන බොරුව ගැන සුරේන්ටයි සුභානිටයි හරිම ලැජ්ජාවක් ඇති වුණා. දෙන්නගෙම මූණු මැලවුණා. 'ඇත්ත කියමු අයියේ දැන්වත්.' සුභානි සුරේන්ට හොරෙන් කිව්වා. ඇත්ත කියන්න! ඇත්ත කියන්න!! සුරේන්ගේ හිත මොරගෑවාට කට ඇරුණේ නෑ.

ඔය අතරේ කාසු අයියා එක්ක හිටිය අනෙක් ළමයා කාසුට කතා කළා, 'දැන් මෙතන බලාගෙන ඉන්නෙ නැතුව ඉක්මනට ඔය කියන මුතු වට්ටිය හොයාගන්න බලමු'. සුරේන් එයා දිහා හොඳට බැලුවා.

'ඔයා කෝලිත නේ ද?' සුරේන් ඇහුවා. 'මාව මතක නැද්ද? අපි එකට නේ පහේ පන්තියෙ හිටියේ.'

කෝලිත නම් ඒ අඳුනාගැනීම ගැන ඒ තරම් සතුටු වුණු බවක් පෙනුණේ නැහැ. ඔව් කියන්න ද නෑ කියන්න ද වාගේ බලාගෙන ඉඳලා අන්තිමට ඔලුව වැනුවා.

'ඔයා පහේ පන්තියෙන් පස්සේ ඉස්කෝලෙ ආවෙ නැහැ නේ ද? ඔයා ඉස්කෝලෙ එන එක නවත්තලාද?' සුරේන් ඇහුවා. කෝලිතගෙ මූණ කළු වුණා.

'මම මේ පොඩ්ඩාව බේරගන්න විදිහක් නැතුව ඔලුව ගිනි අරගෙන ඉන්නවා. ඔයාල මෙතන වෙන වෙන කතා. අපේ පොඩ්ඩව පොලිසියට ගෙනියයිද? එයා මුතු වට්ටිය ගත්ත කියල බොරුවක් හදාගෙන එයාව හිරේ දමයිද?' කාසු අයිය හොඳටම කලබල වෙලා. 'එහෙම වුණොත් මම බොරුවට කියනවා මමයි මුතු වට්ටිය ගත්තේ කියලා. පොඩ්ඩට හිරේට යන්න දෙන්නේ නෑ. මමයි හිරේ යන්නේ!' කාසු අයියා සැරෙන් කිව්වා.

සුරේන්ගෙ කකුල් දෙකත් පණ නැති වුණා වගේ. එයා ඉක්මනට බිම වාඩි වුණා. 'මං දැන් ඇත්ත කියනවා. ඕන දෙයක් වෙන්න කියලා ඇත්තම කියනවා.' එයා හිතා ගත්තට උගුර කට වේලිලා වාගෙයි.

එතකොටම කෝලිත කතා කළා, 'කාසු අයියා බය වෙන්න එපා. පොඩ්ඩා තාම හතරේ පන්තියේ කිව්වා නේ ද? එහෙම නං එයා ව හිරේ දාන්නේ නෑ. ඒක මම හොඳටම දන්නවා.'

ඔක්කොමලා කෝලිත දිහා බැලුවා. 'ඔයා කොහොමද ඒක දන්නේ?' සුභානි ඇහුවා.

'කොහොම දැනගත්තත් ඒක තමයි ඇත්ත. අවුරුදු 12ට අඩු ළමයෙක් කරන වරදක් අපරාධයක් හැටියට ගණන් අරගෙන හිර දඩුවම් දෙන්න බැහැ කියලා නීතියක් තියෙනවලු.[13]'

'ඒ ඇයි?' සුභානි ඇහුවේ පොඩ්ඩා වැරදිලාවත් හිරේට දාන්නේ නෑ කියන හිතේ සැනසීමත් එක්කයි.

'ඒ කියන්නේ තමන් කරන කියන දේවල්වල බරපතලකම, ඒවායින් ලැබෙන ප්‍රතිපල ගැන හරියකට තේරෙන තරම් වයසක නැති නිසාලු. අවුරුදු 12ට අඩු ළමයින්ට විරුද්ධව උසාවියට දලා ලොකු අයට වාගේ නඩු අහන්නේ නෑ.'[14] කෝලිත තෙරුම් කළා.

'එහෙම කොහොමද වෙන්නේ?' සුභානිට කෝලිතගෙ කතාව විශ්වාස නෑ වාගේ.

'වැරැද්දක් කළා කියලා පැමිණිල්ලක් ලැබුණොත් ඒක සොයලා බලලා සාමාන්‍ය වැරැද්දක් නම් අවවාද කරලා ගෙදර යන්න දෙනවාලු. ලොකු වරදක් නම් නඩුකාරතුමා ළඟ ඒක වෙනම විභාග කරනවා. අවවාද කරලා යන්න දෙන්න බැරි තරමේ ලොකු වැරැද්දක් කළා කියලා තීරණය වුණොත් එයාව යවනවා

13 දණ්ඩ නීති සංග්‍රහයට අනුව අවුරුදු 12ට අඩු දරුවන්ට අපරාධ වගකීමක් නොපැවරේ.
14 වයස අවුරුදු 12ත් 18ත් අතර ළමයින් අපරාධ වරදක් සිදු කළහොත් ඒ ළමයින්ට විරුද්ධව රටේ අපරාධ නීතියක් ක්‍රියාත්මක කෙරේ. උදා: සොරකමක් කළහොත් තවත් ළමයකුට අපයෝජනයක් හෝ පහරදීමක් කළහොත් හෝ තාක්ෂණය භාවිත කරමින් හිරුවත් රූප නිර්මාණය කළහොත් හෝ බෙදා හැරියොත් එවැනි ළමයින් අපරාධ සැකකරුවන් ලෙස චෝදනා ලබන්න පුළුවනි.

පුනරුත්ථාපන නිවාසයක් කියලා තැනකට. එහෙම යවන්නේ එයාව ළමයෙක් වාගේ බලාගන්න අතරේ එයාට කළ වැරැද්ද තේරුම් අරගෙන හැදෙන්නලු.[15]' කෝලිත විස්තර කළා.

'එතැන ඔක්කොමලා එකට ඉස්කොලෙක නේවාසිකාගාර වාගෙ ඉන්න තැනක්ද?' සුරේන් ඇහුවා.

'එහෙමත් නෑ. කන්න බොන්න දීලා ඉස්කොලේ යන්න දෙනවා. ඒ වුණාට කොච්චර වුණත් වැරැද්දක් කරලා නේ ආවේ, එතැන ඉන්න කියලා නියම කළ කාලෙට කලින් ගෙදර යන්න බෑ කියලා දන්නවා නේ. ඒක මහ දුකක්... මං කියන්නේ ... මේ .... එහෙම යන ළමයින්ට ඒක දුකක් වෙන්න ඇති.'

කෝලිත ඉක්මනට ඒ කතාව නවත්තලා කාසු අයියට කතා කළා. 'යමු යමු. කාසු. මුතු වට්ටිය දැක්කද කියලා හඳ මාමාගෙන් අහමු.'

හඳ මාමා!! සඳුනිට නම් හයියෙන්ම හිනා ගියා. සුරේන්ටත් සුභානිටත් විනාඩියකට බය අමතක වුණා හිනාව නිසා. කාසු අයියගෙ මූණොත් යාන්තමට හිනාවක් ගෑවුණා.

'හඳ මාමාගෙන් අහන්න හඳට යන්න එපැයි?' සඳුනිට කියැවුණා.

' මං කියන්නේ ඇත්ත හඳ ගැන නෙවෙයි. අර ගඟ පහළ කෑල්ලේ ඉන්න හඳපාන්ගොඩ මාමා ගැන. ළමයි හැමෝම එයාට කියන්නේ හඳ මාමා කියලයි. එහෙම කියනවට එයා හරිම ආසයි.'

'ඉතින් හඳ මාමා දන්නේ කොහොමද මුතු වට්ටිය තියෙන තැන?' සඳුනිගෙන් තවත් ප්‍රශ්නයක්.

'හඳ මාමා හැම වෙලාවෙම ඔය ගඟ පහළ හරියේ තමයි ඉන්නේ. ගඟේ ලස්සන බල බලා ගං ඉවුරේ කාලේ ගෙවන්න හඳ මාමා හරිම කැමැතියි. ඉතින් ගඟේ පාවෙලා ගිය දෙයක් ගැන අහන්න හොඳම අපේ හඳ මාමාගෙන් තමයි. එයා කාටත් උදව් කරනවා.'

ඔන්න ළමයි කට්ටියම ඉක්මනට පාරෙන් ගං ඉවුරට බැහැලා පහළට ඇවිදගෙන යන්න ගත්තා.

'අන්න හඳ මාමා!' කෝලිත එක පාරටම කැගැහුවා. 'හඳ මාමේ! හඳ මාමේ! අපි එනකං ඉන්න! අපි මාමා හම්බවෙන්න එන්නේ.'

15 වරදකරුවන් පරිවාසභාරයේ තැබීමේ ආඥාපනත අනුව ක්‍රියාත්මක වේ.



හඳ මාමා බාගෙට හැරිලා බැලුවා. ළමයි ටික දැක්කා විතරයි දෙකට නැවීගෙන දුවන්න ගත්තා.

'හඳ මාමේ ඉන්න! ඉන්න!' කියලා කෝලිත කෑගැහුවත් හඳ මාමා නෙවෙයි නැවතුණේ.

'කතා කළා ඇහුණේ නැද්ද? මාව දැක්කෙ නැද්ද?' කෝලිත පුදුමෙන් කිව්වා.

'ඇහිලා දැකලා තමයි දුවන්නේ. ඔයාට පේන්නේ නැද්ද? අර බේසමක් වාගේ මොනවදෝ සරමෙන් ඔතාගෙන දුවන්නේ.' කාසු වෙර අරගෙන වේගෙන් දුවන ගමන් කිව්වා. සුරේනුත් කෝලිතත් ඒ පෙළට වැටුණාත් සුභානි හෙමින් ගියේ සඳුනිත් එක්කගෙනම යන්නයි.

කොපමණ වේගෙන් දිව්වත් හඳ මාමා අල්ලගන්න බැරි වුණා. ළමයින්ව දැක දැකම හඳ මාමා ගෙට පැනලා දොර වහගත්තා.

'උදව් කරනවා කියලා නේ ද කිව්වෙ කාටත්? යස උදව්ව! ඇහුවෙවත් නෑ ඇයි කතා කළේ කියලා' කාසු කිව්වෙ තරහෙන් වාගේ.

'එයා දිව්වේ හංගාගෙන හිටිය දේ අපි දකියි කියලා. අනුමානයක් නෑ මුතු වට්ටිය වෙන්නම ඕනෑ.' ඒ කිව්වේ සුරේන්.

'මටත් හිතෙන්නේ ඒකමයි.' කාසුත් එකඟ වුණා.

'අපි ඔක්කොම ගිහින් කතා කළාට දැන් හඳ මාමා දොර අරින්නේ නැහැ. අපි අර ගේ පිටිපස්සේ තියන සියඹලා ගහ ළඟ හැංගිලා ඉඳිමු. ටිකක් වෙලා ගියාට පස්සේ මම තනියම ගිහින් හීන් සීරුවේ අහලා බලන්නං.' කෝලිතගෙ යෝජනාවයි ඒ. කවුරුත් ඒකට කැමති වුණු නිසා ගස් වදුලු අස්සෙන් රිංගලා ගිහින් සියඹලා ගහ යටට යාගත්තා. ටික වෙලාවක් ගියා. ඉස්සරහා දොර අරින සද්දයක් ඇහුණා.

'කෝලිත. ඔයා හඳ මාමාව ඉස්සරහා දොර කිට්ටුව තියාගන්න. අර කාමරේ ජනේලෙ ඇරලා තියනවා නේ. මම හෙමිහිට කාමරේට එබිලා බලන්නං මුතු වට්ටිය පේන්න තියනවද කියලා.' කාසු යෝජනාව අලුත් කළා.

කෝලිත ගියාට පස්සේ කාසු හෙමිහිට ජනේලෙන් එබිලා බැලුවා. අත වනලා සියඹලා ගහ මුල හිටි අයට ඉක්මනට එන්න කියලා කතා කළා. 'අර! අර බලන්න. අර ඇඳ යට කමිසයකින් ඔතලා නවලා තියෙන්නේ බේසම වාගේ!' කාසු රහසෙන් අනෙක් අයට කිව්වා.

ඇත්තම නේන්නං! ඔය තියෙන්නේ මුතු වට්ටිය කමිසෙන් ඔතලා හංගලා! තවත් ප්‍රමාද නොවී ළමයි කට්ටියම ගේ ඉස්සරහට ගියා. 'මේ මොකද මේ ළමයි මෙතන? යන්නයි කිව්වේ! යන්නයි කිව්වේ!' හඳ මාමා කලබල වෙලා කෑගහන්න ගත්තා.'

'අර ඇඳ යට හංගලා තියෙන මුතු වට්ටිය ගෙනියන්නයි අපි ආවේ. ඒක අපේ! ඒක දුන්නාම අපි යන්නං.' කිව්වේ සුරේන්.'

හඳ මාමා පුදුම වෙලා බලා ඉන්න අතරේ කාසු දොර ඇරගෙන ගෙට ගියා. කාමරයටම ගියා. අනෙක් ඔක්කොමලත් දුවගෙන ආවා. කාසු ඇඳ යටින් ඇදලා ගත්තේ... තාරකා ඉබ්බෙක්!! හඳ මාමාට හිනා ගියා. ඒත් ළමයින්ට නම් හිනා ගියේ නැහැ. තාරකා ඉබ්බා දිහාම බලාගෙන හිටියා.

'එයා හරිම ලස්සන ඉබ්බෙක්. ලස්සන නිසාද මාමා ගෙදර ගෙනාවේ?' ඇහුවෙ සඳුනි.

'ඔව් දරුවෝ. දැක්කමත් ආසා හිතෙනව නේ ද? අපි පොඩි කාලෙ නම් මේ පැත්තේ තාරකා ඉබ්බො නිතර දකින්න ලැබුණා. ඒත් දැන් කාලේ උන්ව ලේසියකින් දකින්න ලැබෙන්නෙ නෑ. ඒ හින්දා මම අරං ආවා හදාගන්න. ඔය කන්කුන් වාගේ පළා කොළ කන්න දීලා හදාගන්න පුළුවන් මට.'

'මාමා දන්නේ නැද්ද තාරකා ඉබ්බා නීතියෙන් ආරක්ෂා කරන සතෙක්, උන්ට හානි කරන්න තහනම් කියලා? තාරකා ඉබ්බො, කිරි ඉබ්බො දෙවර්ගයම නීතියෙන් ආරක්ෂා කරලා තියෙන සත්තු.' සුහානි කිව්වා.

'දන්නවා. දන්නවා.මොකෝ මං නොදන්නේ? ඒක නේ මම ඒකව හංගාගෙන දුවගෙන ආවේ. ඒ වුණාට මං උට හිරිහැරයක් කරන්න නෙවෙයි නේ. රැකබලාගෙන හදාගන්න නේ අරගෙන ආවේ. ඒකට නීතිය බාධාවක් කරගන්න ඕනෑ නෑ.' හඳ මාමා තර්ක කළා.

'මාමා එහෙම හිතනවා නං ඒක වැරදියි. සමහර ගස්, පැළැටි වාගේම සමහර වන සත්තුනුත් වඳවෙලා යන්න ඉඩ තියෙන නිසා ඒවා ආරක්ෂා කරන්න නීතියක් තියෙනවා. අපට ඉස්කෝලෙදි ඒ ගැන ඉගැන්නුවා. ඒකට කියන්නේ වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ පනත කියලා. ඒකෙ තියෙන හැටියට තාරකා ඉබ්බා වාගේම කිරි ඉබ්බත් නීතියෙන් ආරක්ෂා කරන සත්තු. උන් ගෙවල්වල ඇති කරන්න තහනම්.' සුහානි කිව්වා.[16]

'මට නෙවෙයි ඔය ළමයටයි වැරදිලා තියෙන්නේ. ඔහොම සමහර ගහකොළ වන සත්තුන් රකින්න නීති තියෙනවා කියලා මමත් දන්නවා. හැබැයි ගෙවල්වල තියාගන්න බැහැ කියන කාරණාව නං වැරදිම වැරදියි.' හඳ මාමා එකහෙළාම කියා හිටියා.

දැන් කොහොමද හඳ මාමා හිතාගෙන ඉන්න හැටි වැරදියි කියලා තේරුම් කරලා දෙන්නේ? සුහානි කල්පනා කළා. එයා මොකුත් කියන්න කලින් හඳ මාමාම ආපහු කතා කළා.

'මං ඒ කාරණාව හොඳට දන්නේ මගේ අත්දැකීමෙන්මයි. ඉස්සර මං තරුණ කාලේ රත්නපුරේ පැත්තේ කඩයක වැඩ කළා නේ. ඒ කඩේ අයිති ඇත්තන්ගෙ ඉඩමක තිබුණා දෝතලු ගහක්. හැම තැනකම දකින්න නැති බොහොම දුර්ලභ ගහක් නේ. පුවක් ගහ වාගේ හීන් ගහක්. රතුපාටින් කඩා හැලෙන, පුවක් මල වාගේ හරි

16ශාක හා සත්ත්ව වර්ග ආරක්ෂා කිරීම සඳහා පවතින අණ පනත් වන්නේ වන සංරක්ෂණ ආඥ පනත, ශාක ආරක්ෂණ පනත, සහ වන සත්ත්ව සහ වෘක්ෂලතා ආරක්ෂණ ආඥ පනතයි.
ජාතික රක්ෂිත සහ අභය භූමිː ජාතික රක්ෂිත ලෙස හඳුනාගත් ප්‍රදේශවලට බලපත්‍ර නැතිව ඇතුළු වීම සහ ඒ තුළ සතුන් අල්ලාගැනීම, දඩයම් කිරීම සහ මරණයට පත්කිරීම තහනම් වේ.



ලස්සන මලක් පිපෙනවා. දැකලා තියෙනවාද දෝතලු මල්? බලන්න ලස්සනේ බෑ.' මුලින්ම දෝතලු මල් වරුණේ කියලයි හඳ මාමා නීතියේ කාරණාවට ආවේ.[17]

'ඔය දෝතලු ගහ ගැන ආරංචි වෙලා ඒ පළාතේ වන සංරක්ෂණ අධිකාරි කන්තෝරුවේ නෝනා කෙනෙක් ඇවිත් උපදෙස් දුන්නා ඒ ගහ රැකබලා ගන්න විදිහ ගැන. ඒක නීතියෙන් ආරක්ෂා කරන ශාකයක් නිසා ගහ තමන්ගේ ඉඩමේ වැවුණාට ඒක කපන්නවත්, කාටවත් ඒ ගහ විකුණාන්නවත් තහනම් කියලා කිව්වා. ඒත් ඒක තමන්ගේ ඉඩමෙම තියාගෙන රැකබලාගන්න තහනමක් නෑ කියලා හොඳට පැහැදිලි කරලා කිව්වා... ඉතින් ඒ වාගේ මමත් මේ ලස්සන තාරකා ඉබ්බා ප්‍රවේසමෙන් රැක බලාගන්නවා.' සඳුනිගෙ ළඟ හිටිය තාරකා ඉබ්බා තමන්ගේ අතට ගන්න ගමන් හඳ මාමා කිව්වා.

දැන් සුහානිට වැටහෙනවා හඳ මාමාට නීතිය පැටලුණේ ඇයි කියලා. ඉතින් එයා තේරුම් කරලා දුන්නා, 'මාමේ, නීතියෙන් ආරක්ෂා කරන පැලයක් ඒක වැවිලා තියෙන තැනම තියාගෙන රකින්න ඕනෑ කියලා තමයි නීතියේ තියෙන්නේ. ඒක

17 ආරක්ෂිත ශාක සඳහා උදාහරණාː මහ හැඩයා, කුඩා හැඩයා, මීමන, වැරැල්ල, මධු, මහ මධු, නෙළු, බදුල්ල, කුකුල් කඳුරු, වල් කඳුරු, වස කඳුරු, දෝතලු සහ ගිංපොල් යනාදිය. මෙම ශාක විනාශ කිරීම, හානි කිරීම, උගුල්ලා දැමීම, ඉවත් කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම තහනම් වේ. එම වැරදි සිදු කරනු ලබන පුද්ගලයන්ට දඩයකට ලක් වීමට හෝ අවු 2 - 5 අතර සිර දඬුවමකට ලක්වීම හෝ එම දඬුවම් දෙකටම ලක්වීමට සිදු විය හැක.

කාගෙ හරි පෞද්ගලික ඉඩමක් නැත්තං ආණ්ඩුවට අයිති පොදු ඉඩමක් වෙන්න පුළුවන්. කොතැන තිබුණත්, මොනම හේතුවකටවත් ඒවාගෙ ගහක් හරි පැළයක් හරි හිතාමතා විනාශ කරන්න බැහැ. හැබැයි නීතියෙන් ආරක්ෂා කරන වන සතුන් එහෙම නෑ. උන්ව ගෙවල්වල ඇති කරන්න තහනම්, කොයි තරම් හොඳින් බලාගත්තත්.'

'එතකොට ඔය අලි ඇතුන් ඕනෑ තරම් ගෙවල්වල පන්සල්වල එහෙම තියාගෙන ඉන්නෙ?' ඒ ඇහුවෙ කාසු අයියා.

'අලි ඇතුන්ට වෙනම නීතියක් තියෙනවා නේ, වන සතෙක් වුණත්. උන්ව හිලෑ කරලා මිනිස්සු එක එක වැඩවලට ගන්නවා නේ. පෙරහැර වාගේ සංස්කෘතික උත්සවවලට ඕනෑ වෙනවා නේ. ඉතින් හිලෑ කළ අලි ඇතුන් නීතියේ හැටියට බලපත්‍රයක් අරගෙන ඇති කරන්න ඉඩ දීලා තියෙනවා. හැබැයි උන්ව රැකබලා ගන්න තරම් ඉඩකඩ, ආදායමක් එහෙම තියෙන්න ඕනෑ උන්ට පීඩාවක් නොවී බලාගන්න.'

'හ්ම්...' හඳ මාමා හුස්මක් හෙළලා තාරකා ඉබ්බාට කතා කළේ දුකෙන්, 'ඒකත් එහෙමයි එහෙනං. මක්කරන්නද ඉබි පැටියෝ. එහෙම නං ගඟටම ආපහු ගිහින් දැන්න වෙනව නේ.'

'වෙන මොන සත්තුද ඔහොම නීතියෙන් ආරක්ෂා කරන්නේ?' කෝලිත ඇහුවේ දුක තුනී වෙනකම් හඳ මාමාට තව ටික වෙලාවක් තාරකා ඉබ්බාව තියාගන්න ඉඩ හදා දෙන්නයි.

'සත්තු වර්ග කීපයක්ම එහෙම ආරක්ෂා කරලා තියෙනවා. මතක හැටියට ටිකක් කියන්නම්.... උණහපුළුවා, කොළ දිවියා, හඳුන් දිවියා, වලහා, ඕලු මුවා, මුහුදු උරා වාගේ ක්ෂීරපායින් ...'

ඒක කියලා ඉවරකරන්න කලින් සඳුනි ඇහුවා, 'ක්ෂීරපායින් කියන්නේ කාටද?'

'උපන් අලුත පැටවුන් අම්මාගෙන් කිරි බීලා හැදෙනවා නම් ඒ සත්තුන්ට කියන්නේ ක්ෂීරපායි සත්තුන් කියලයි' කෝලිත කියා දුන්නා.

සුභානි ආරක්ෂා කරලා තියෙන අනෙක් සත්තුන් ගැනත් කියන්න ගත්තා, 'එතකොට.... මහ දියකාවා, අලි මානාවා, කොණ්ඩ රාජාලියා වාගේ කුරුල්ලෝ... ඊළඟට ගොඩයා, ආලෝක පෙතියා, කොළ කනයා, වැලිගොව්වා වාගෙ මාළු ... එතැනින් ගියාම හෙළ කිඹුලා, ගැට කිඹුලා, තාරකා ඉබ්බා, කිරි ඉබ්බා, කැස්බෑවා වාගේ උභයජීවීන්.[18]'

18 මෙම ආරක්ෂිත සතුන් අල්ලාගැනීම. හානිකිරීම හෝ තුවාල සිදුකිරීම, හානියට පත් කිරීම, මරණයට පත් කිරීම තහනම් වන අතර එම වැරදි සිදු කරනු ලබන පුද්ගලයන්ට දඩයකට ලක් වීමට හෝ අවු 2 - 5 අතර සිර දඬුවමකට ලක්වීම හෝ එම දඬුවම් දෙකටම ලක්වීමට සිදු විය හැක.

'උභයජීවි කියන්නේ කවුද?' ඒ ප්‍රශ්නෙත් සඳුනිගෙන්.

'ඒ, දිය ගොඩ දෙකේම ජීවත් වෙන්න පුළුවන් සත්තු නේ නංගි.' ඒ ගමනත් කියා දුන්නේ කෝලිත.

'අනේ දැන් මේ කතාව නවත්තලා යමු මුතු වට්ටිය හොයන්න. අපේ පොඩ්ඩව දැනටමත් පොලිසි ගෙනිහින්ද දන්නෙත් නැහැ. යමු යමු දැන්' කාසු අයියා බොහොම ඉවසීමෙන් ඉඳලා, බැරිම තැන තමයි හදිස්සි කළේ.

'මොකක්ද ඔය මුතු වට්ටියයි පොඩ්ඩයි ගැන කතාව?' හඳ මාමා ඇහුව නිසා කාසුට ඉස්සෙල්ලාම ඒ ගැන කියන්න සිද්ධ වුණා.

ඔන්න එතකොට හඳ මාමා කිව්වා, 'ඕක ගැන නං ඉතින් අහන්න තියෙන්නේ අමිතගෙන් තමයි.'

ඒ කතාවට කෝලිතට හොඳටම තරහා ගියා. 'මේ මාමේ! අපේ අයියා හොරෙක් නෙවෙයි. එන්න එපා එයාට එක එක නරක නාම ගාවන්න. අපේ අයියා මං වාගේ නෙවෙයි, වැරදි වැඩ කරන්නේ නැහැ.' තරහටද කොහෙද කෝලිතගෙ මූණත් රතුම රතු වෙලා.

'කවුදෑ දරුවෝ හොරකමක් කළා කිව්වේ? අමිත පුතා පාරුව අරගෙන උදේ හවා ඔය ගඟේ පහළ කෑල්ලේ එහා මෙහා යන නිසයි මං එහෙම කිව්වේ', කියලා පැහැදිලි කරලා හඳ මාමා අනෙක් අය දිහාට හැරිලා කිව්වා, 'මේ අපේ ගඟ දිගේ පහළටම ගියාම සංචාරක හෝටලයක් තියෙනවා නේ. ඒකට එන කාණ්ඩේ විනෝදෙට පාරුවෙන් යන්න කැමැති වුණාම එයාලව ගෙනියන්නේ අමිත පුතා තමයි. ඒකට හෝටලෙන් ඒ දරුවට පොඩි ගාණක් ගෙවනවා. හැබෑ හපනා පාරු පදින්න. පිනන්නත් එහෙමයි'.

'බෑ! බෑ! අපේ අයියව කොහොමටවත් මේකට ගාවන්න බෑ! ඒකමයි මම නිකමටවත් එයා ගැන මතක් කළේ නැත්තේ.' කෝලිත එහෙට මෙහෙට ඇවිද ඇවිද කෑගහන්න ගත්තා. 'එයාටත් මට වාගේ ප්‍රශ්නයක් වුණොත්?? අපේ අයියා මාව විතරක් නෙවෙයි ලෙඩ වෙලා ඉන්න අපේ තාත්තාවත් බලාගන්නේ හරියට තාත්තා කෙනෙක් වාගේ. අයියා ඔය රස්සාවට ගියෙත් තාත්තා ලෙඩ වුණාට පස්සේ, තාත්තගේ බෙහෙත්වලට සල්ලි ගොඩක් ඕනෑ නිසා.... නැත්තං එයාට තව සැරයක් විහාගෙ කළා නං විශ්වවිද්‍යාලෙට වුණත් යන්න තිබ්බා කියලයි අපේ තාත්තා කියන්නේ... අයියට කරදරයක් වෙන දෙයක් කරන්න කොහොමටවත් බැහැ. කොටින්ම මටත් බැහැ ආයිත් පොලිසි යන්න වෙන ප්‍රමාරවල පැටලෙන්න' කෝලිත තදින්ම විරුද්ධ වුණා.

මොකක්ද ඔයාට වුණ ප්‍රශ්නය කියලා කවුරුවත් ඒ වෙලාවේ ඇහුවේ නැහැ.

මේ ඒකට වෙලාව නෙවෙයි කියලා කාටත් ඉවෙන් වාගේ තේරුණා. 'එහෙම නෙවෙයි පුතේ. මෙතැනත් පොඩි දරුවෙක් කරදරේ වැටිලා නේ ඉන්නේ. අපි උදව්වක් කළේ නැත්තං නොකළ වරදකට ඒ දරුවා පොලිසි ගෙනියන්න ඉඩ තියෙනවා නේ. ඒ හින්දා මමයි මේ කාසු දරුවයි ගිහින් අමිත මුණගැහිලා විපරම් කරලා බලන්නං. පුතා මේ අනෙක් කාණ්ඩේ එක්ක මෙහාටම වෙලා ඉන්න. පුතා හරි. මේවට පුතා පැටලෙන්න එපා' හඳ මාමා කිව්වාම, පොඩ්ඩා ගැන හිතලා කෝලිත ඒකට කැමැති වුණා.

ඉතින් කට්ටියම ගඟ ළඟට ආපහු ගියා. මුලින්ම හඳ මාමා තාරකා ඉබ්බා ආපහු ගඟට දැම්මා. ඉබ්බා ස්තූතියි කියන්න වාගේ එක සැරයක් ආපහු හැරිලා බලලා, පිනාගෙන ගඟ පහළට ගියා. අනිත් ළමයි ටික ගං ඉවුරේ ගස් සෙවණේ ඉන්න අතරෙ කාසු අයියා හඳ මාමා එක්ක ගියා අමිත අයියා සොයන්න.

'හරි බඩගිනියි මට නං දැන්.' සුරේන්ට කියවුණා.

සඳුනි කලබලෙන් එයාගේ ඉස්කෝලෙ බෑග් එක අවුස්සලා කෑම පෙට්ටියක් ගත්තා.

'ආච්චි අම්මා ඉස්කෝලෙදි කන්න කියලා හදලා දුන්නේ' කියමින් සඳුනි කෑම පෙට්ටිය ඇරියා. ලැවරියා! හතරක්ම තියෙනවා! ළමයි හතරදෙනා එයින් දෙකක් බෙදුගෙන කාලා ඉතුරු ලැවරියා දෙක තිබ්බා කාසු අයියටයි හඳ මාමාටයි දෙන්න.



8
පාරුවේ කතා


අමිතට උදේම පාරු ගමන් දෙකක්ම ලැබුණා. හෝටලයට එන සමහර අය විතරයි පාරුවේ යන්න කැමැති වෙන්නෙ. හෝටලෙන් ටිකට් ගත්තාම තමයි පාරුවට නගින්න දෙන්නේ. ඒගොල්ලන්ව හෝටලේ ඉඳලා කිලෝමීටරයක් විතර දුර පාරුවෙන් එක්කගෙන ගිහින් ආපහු එනවා. ගමනේ ආසාව වැඩි වෙන්න අමිත ලස්සනට පාරු කවියක් දෙකකුත් කියනවා.

සූරිය උදා වෙන තුරු පිණී	බෑවිල්ල
පාරුව පදින තුරු සයුරේ	සෙලවිල්ල
මාරුව බල බලා සිත යට	කැරකිල්ල
කාරිය කෙරෙන තුරු කාගෙත්	රැවටිල්ල

අමිතගේ කවි ගායනයට සතුටුවෙලා සමහරු වැඩිපුර මුදලක් අමිතට දෙනවා, සන්තෝසෙට. හැබැයි හෝටලෙන් අමිතට තදින්ම කියලා තියෙන්නේ වැඩිපුර සල්ලි හරි තෑගි බෝග හරි දෙන්න ඕනෑ නම් ඒක හෝටලේ මැනේජර්ට දෙන්න කියන්න කියලා. එහෙම දුන්නොත් එයා ඒක අමිතට දෙනවා. මැනේජර් කිව්වේ ඒක කරන්නේ අමිතගෙම හොඳටයි කියලයි. නැත්නම් ඕනෑ නැති තෑගි අරගෙන අමිත කරදරේ වැටෙන්න පුළුවන් කියලා මැනේජර් අමිතට තේරුම් කරලා දීලා තිබුණේ. ඒ කතාවෙත් ඇත්තක් නැතුවාම නෙවෙයි. හැබැයි ඉතින් පාරු ගමන ඉවරවෙලා ආපහු එනකොට ගොඩක් අමුත්තන්ට අමතක වෙනවා අමිතට දෙන්න කියලා අමතර කීයක් හරි මැනේජර්ට දෙන්න. ඉතින් අමිතට අමතර මුදල් ලැබෙනවා අඩුයි. ඒත් කමක් නෑ මාසේ වියදම අමාරුවෙන් හරි පිරිමහගෙන තාත්තගේ බෙහෙත් ටික ගන්නයි මල්ලිට ආසා කරන කෑමක් ඉඳහිට අරන් දෙන්නයි තරමට සල්ලි ලැබෙනවා නේ කියලා අමිත හිත හදාගෙන ඉන්නවා.

ඔන්න එදත් අමිත උදේ පාරු ගමනෙන් තමන්ට අයිති ගාස්තුව හොටලෙන් ඉල්ලගෙන පාරු නොටුපලේ වාඩි වෙලා ඉන්නවා තවත් ගමනක් වැටෙනකම්. ටිකක් මැදි වයසේ නැන්දෑ කෙනෙක් දුවගෙන ඇවිත් පාරුවට නැග්ගා. 'යමු ළමයෝ ඉක්මනට උඩහට. මම යනවා පොලිසි මගේ දරුවා බය කරලා කප්පම් ගන්න හදනවට. මේ දරුවත් මෝඩකමට පැටලුණු කරදරේක හැටි!' ඒ නැන්දෑ බනිනවා. හැබැයි එයා එක්ක කවුරුවත් තව පාරුවට නැග්ගේ නැහැ.

ඒ ගමන ඒ නැන්දෑ අමිතට කෑගහන්න ගත්තා, 'ඔය ළමයට ඇහෙන්නෙ නැද්ද? ඉක්මනට මාව උඩහට ගෙනියන්න. මොකද ළමයෝ බලා ඉන්නේ. එන්න බැරිද ඉක්මනට කිව්වාම?? අනේ මන්ද මේ ඔක්කොම එකයි. මෙයත් අරුන්ගෙම එකෙක් ද දන්නේ නැහැ.'



අමිතට නොරිස්සුමක් හිතුණත් එයා කතා කළේ ඉවසීමෙන්. හෝටලේ මැනේජර් කියලා තියෙන්නේ කිසිම සංචාරකයකුට බනින්න යන්න එපා, ප්‍රශ්නයක් වුණොත් මැනේජර්ට කියන්න කියලයි. ඒත් මේ නැන්ද නම් සංචාරකයෙක් වෙන්න බෑ. ඇඳුමෙන් පැළඳුමෙන් තරමක සරුසාර බවක් පෙනුණට එයා ඇවිත් ඉන්නේ සංචාරක ගමනකට නෙවෙයි කියලා අමිතට තේරුණා එයාගෙ කතාවෙන්.

'පාරුවේ යන්න ටිකට් ගන්න ඕනෑ නේ. මැඩම් ටිකට් එකක් ගත්තද?'

'මොන ටිකට් එකක් ද? මෙන්න මෙහෙ මාව උඩහට එක්කගෙන යන්න. මම සල්ලි දෙන්නං. මගේ මේ ඔලුව ගිනි අරගෙන ඉන්නවා මෙයා මේ ටිකට් ගැන කතා කරනවා. යං ළමයෝ, යං'

'මට එහෙම ටිකට් නැති අය ගෙනියන්න බැහැ නේ. උඩහතැන්නට නම් යන්න ඕනෑ ඔහොම ගුරු පාරෙන් උඩහට නැග්ගාම බස් එකේ යන්න පුළුවන්.' අමිත ඉවසීමෙන් තේරුම් කරලා දුන්නා.

මෙන්න! ඒ ගමන ඒ නැන්ද අඬන්න ගත්තා. 'බස් එක එන්න තව පැයක් විතර තියෙනවාලු. ටිකට් ගන්න ආපහු හෝටලේට ගියොත් අර මිනිස්සු මා පස්සේ පන්නාවි. මගේ දරුවට කරන කරදරේට මම පොලිසි යනවා කියලා බැනලා ආවේ. උන් මට තර්ජනය කළා ගියොත් බලාගමු කියලා. අනේ දරුවෝ මේ පාරුවෙන් උඩහ පාරට ගියොත් මට ඉක්මනට උඩහතැන්නේ ටවුමට යා ගන්න පුළුවන්. අපිට ලොකු කරදරයක් වෙලා. මගේ දරුවා නොවෙන්නං මම මේ වාගේ තැන්වලට එන්නේ නෑ'.

'අමිතට තේරුම් ගියා මොකක් හරි ලොකු ප්‍රශ්නයක් කියලා. තමන්ට මහන්සි නිවාගන්න පාරුව තනියම අරගෙන යන්න හෝටලෙන් තහනමක් නෑ නේ. හෝටලෙන් ටිකට් ගන්නේ නැතුව සංචාරකයෝ ගෙනියන්න නේ තහනම්. මේ එහෙම ගමනක් නෙවෙයි නේ' කියලා හිතලා අමිත පාරුවට නැග්ගා.

ටික දුරක් ගියාම ඒ නැන්ද අමිතගෙන් අහනවා, 'ඔය දරුවට නංගිලා මල්ලිලා එහෙම ඉන්නවද?'

'ඉන්නවා. මල්ලි කෙනෙක් ඉන්නවා.'

'හොඳ පරෙස්සමෙන් බලාගන්න. පොඩි දරුවෝ මුලා කරගෙන කැත ජාවාරම් කරන දුෂ්ට මිනිස්සුත් ඉන්නවා මේ රටේ ලෝකෙ.'

අමිත මොකුත් නොකියා ඔලුව වැනුවා. මේ නැන්දගේ දරුවෙකුට මොකක් හරි ලොකු කරදරයක් වෙලා කියලා හිතුණාට අමිත ඇහුවේ නෑ විස්තර.

'ඔය දරුවා මොකද ඉස්කෝලේ නොගියෙ අද? ඉස්කෝලෙ ගමන නවත්තලා මෙතන වැඩ කරනවද? ඒක මෝඩකමක්. තේරුණා ද? මෝඩකමක්' ඒ ගමන ඒ නැන්ද සැරෙන් කිව්වා.

'නැන්දේ මම ඉස්කෝලෙ ගිහින් ඉවරයි. මම උසස් පෙළටත් ලියලා ඉස්කෝලෙන් අස්වුණේ. දැන් මට අවුරුදු දහනවයයි නේ. ඉතින් රස්සාවක් කරන්න පුළුවන්. මේ හොටලේ අවුරුදු දහඅටට අඩු අයයි ඉස්කෝලේ යන අයයි වැඩට ගන්නේ නැහැ කොහොමත්.' අමිත තේරුම් කළා.

'හා, ඒක හොඳයි. දරුවන්ට බොරු වළවල් කපන අය එමටයි.' ඒ නැන්ද කිව්වා. 'මල්ලි ගැන ඇහැ ගහගෙනම ඉන්න. ආස්සරේ කරන්නේ කවුද, යාළු මිත්‍රයෝ කවුද කියලා හොඳ විපරමෙන් ඉන්න. තේරුණාද?' ඒ ගමන ඒ නැන්ද කියනවා. අමිතට ඉබේම ලොකු හුස්මක් වැටුණා.

'හ්ම්, ඔය ළමයටත් ලොකු ප්‍රශ්නයක් වෙලා වාගෙයි මට පේන්නේ.' කිව්ව ඒ නැන්ද ඊළඟට එයාගේ කතාව කියන්න ගත්තා. 'මට දුවෙක් ඉන්නවා. අවුරුදු දහතරයි. ඇහැක් වාගේ අපි බලාගත්තේ. කොහොම හරි අපිට නොදැනෙන්න පිරිමි ළමයෙක් එක්ක යාළුකමක් පටන් අරගෙන. අවුරුදු දහතරට මොන ආදර සම්බන්ධකම් ද ළමයෝ.'[19]



'ඒක හරි' අමිත කිව්වා.

'අපි ඔය ජංගම දුරකතන ඒවා මේවා දූට අරන් දුන්නෙත් නෑ ඉල්ලුවට. ටියුෂන් පන්තියටත් මමයි එක්කගෙන ආවේ ගියේ. මට යන්න බැරි වෙලාවට මගේ ගෙවල් කිට්ටුව හිටිය අපේ දුර නෑ කෙනෙක්, එයා එක්ක තමයි යැව්වේ. ඔය මනුස්සයා තමයි මගේ දරුවා මේ බොරු වළට තල්ලු කළේ[20]. අපි එයාව විස්වාස කරල නිතර ගෙදර ගෙන්න ගත්තා. දරුවන්ට..., මට තව පොඩි පුතෙකුත් ඉන්නවා නේ, ... දරුවන්ට එයා එක්ක ගමන් බිමන් යන්න දුන්නා. ඒ උන්දෑ තමයි අපට නොකියා ඔය පිරිමි ළමයව සම්බන්ධ කරලා තියෙන්නේ. මොකක්ද ලොකු ඉස්කෝලෙක නමක් කියලා, ඒකේ ඉගෙන ගත්තේ දැන් විශ්වවිද්‍යාලේ කියලා බොරු කියලා තියෙනවා. ඉතින් මගේ මෝඩ කෙල්ල හා, ඉගෙනගත්ත අයියා කෙනෙක් නේ කියලා බයක් නැතුව යාළුවෙලා. මුලින් හරි ආදරෙන් කරුණාවෙන් සලකලා තියෙන නිසා අපේ

19 අවුරුදු 16ට අඩු දරුවන් සමඟ ඔවුන්ගේ කැමැත්ත ඇතිව හෝ නැතිව ලිංගික කටයුතුවල යෙදවීම ළමා ලිංගික අපයෝජනයක් වන අතර එය දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඩුවම් ලැබිය හැකි අපරාධයක් වේ.

20 ළමා අපයෝජනයේ තවත් ස්වරූප: ළමයින් සිතාකෑමේ යෙදවීම සහ ලිංගික කටයුතු සඳහා පුද්ගලයන් පොළඹවාගැනීම සඳහා ළමයින් යොදවාගැනීම දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඩුවම් ලැබිය හැකි වරදක් වේ. මෙහිදී සිතාකෑමේ හෝ දන්දීමේ හෝ දන්දීමට පෙළඹවීමේ කාර්යයන් සඳහා ළමයකු යෙදවීම, ඒ සඳහා සිංදු කීම, ක්‍රීඩා කිරීම, රංගනයේ යෙදීම, විදි වෙළෙඳාමේ ළමයින් යෙදවීම, යම් දෙයක් විකිණීමට යම් විදියක, ස්ථානයක සිටීමට ළමයකුට සලස්වන කවර හෝ තැනැත්තෙකු වරදකරුවකු වේ. ඒ සඳහා වසර 5ක් දක්වා සිර දඩුවමක් ලබාදිය හැකි අතර දඩයකටද යටත් වේ.
ලිංගික කටයුතු සඳහා ළමයින් පොළඹවාගැනීම, ළමයින් යොදවාගැනීමේ වරද යටතේ ඒ සඳහා ළමයින් දැන දැනම කුලියට ගැනීම. රඳවාගැනීම, එවැනි ළමයින් සේවයේ යෙදවීම, එවැනි දේ කිරීමට බලකිරීම යනාදිය අයත් වේ. මෙවැනි අපරාධ සඳහා අවුරුදු 5ත් 20ත් අතර සිර දඩුවමක් හෝ වන්දියක් යන දඩුවම් නියම කෙරේ.

දරුවත් එයාව හොඳටම විශ්වාස කරන්න පටන් අරගෙන. පස්සෙන් පහු අපි දන්නේ, එහෙ මෙහෙ විනෝදගමන් එහෙමත් ගිහින් තියෙනවා.' ඒ නැන්ද කතාව නවත්තලා සාරි පොටෙන් කඳුළු පිහිදැම්මා.

'ඒ ගිය ගමන්වලදි මගේ දරුවගේ එක එක තාලේ පින්තූර අරගෙන තියෙනවා. මගේ දූ අඬ අඬා මට කිව්වේ මුලදි මුල දි එහෙම පින්තූර ගන්නවට දුව අකැමැති වුණාලු, ඒත් අර නෑදෑයා කියලා තියෙනවා ඔහොම තමයි ආදරේ කරනකොට, ආදරේ කරන එක්කෙනාගේ නොයෙක් විදිහේ පින්තූර තියාගන්න ආසයි කියලා.[21] මට මුණගැහුණොත් ඒ උන්දැව මම ඉතුරු කරන්නේ නෑ. මගේ දූ මේවා අපිත් එක්ක කිව්වා කියලා දැනගත්ත හැටියේ ඒ ගෑනු මනුස්සයා කුලියට හිටි ගේත් බාර දීලා එදම යන්න ගිහින්.'

'ඉතින් කොහොමද ඔය කතාව එළියට ආවේ?' අමිතට ඇහුණා.

'ඒ පිරිමි මනුස්සයා, මං හිතන්නේ තරුණ ළමයෙක් වාගේ රඟපෑවට ළාබාල කෙනෙකුත් නෙවෙයි. ඉතින් ඒ මනුස්සයා අපේ දූට අඬගහලා තියෙනවා එයාගේ යාළුවොත් එක්ක දවසක්ම විනෝදෙන් ඉන්න හෝටලේකට යන්න එන්න කියලා. ඒත් අපේ දූ එහෙම දවසම ගෙදරින් පිට ඉන්න දුර ගමන් තනියම ගිහින් නැති නිසා බය හිතිලා බෑ කිව්වාම අර මිනිහට තරහ ගිහින් අපේ දූට තර්ජනය කළාලු ආවේ නැත්තං අර ගත්තු පින්තූර ඔය ෆේස් බුක් කියලා තියෙන්නේ ආං ඒකෙයි වෙන වෙන අන්තර්ජාලෙ සමාජවලටයි දානවා කියලා. දුව හොඳටම බය වෙලා ඉන් පස්සේ ඒ මිනිහගෙ ටෙලිෆෝන් නොම්මරේට උත්තර දුන්නේ නැහැලු. ඕක වෙලා තියෙන්නේ සුමානෙකටත් කලින්. දූ තනියම අඬ අඬා හිටියා මිසක් මට කිව්වෙත් නැහැ. ඔන්න පෙරේදා ඉඳන් අඳුනන්නේ නැති නොම්මරවලින් පිරිමි කට්ටිය කතා කරනවාලු ඔයාගෙ ජාති පින්තූරයක් දැක්කා ෆේස් බුක් එකේ. හම්බවෙන්න ආසයි ඒක මේක කියලා. ඒ පාර දුව අර යාළුවෙලා හිටි මිනිහට කතා කරලා ඉල්ලුවලු මේ වැඩේ කරන්න එපා කියලා. ඒකත් මට නොකියා කරලා තිබුණේ. ඒ මිනිහා කිව්වලු අද එන්න කියන තැනට ආවොත් ඒ පින්තූර මකලා දානවා. නැත්තං ඉතින් තව තව හැමතැනටම යවනවා කියලා... ටෙලිෆෝන් එකේ කියන්නං කිව්වලු එන්න ඕනෑ තැන. ඔන්න එතකොටයි දරුවට මේ ප්‍රශ්නේ තනියම බේරගන්න බෑ කියලා දැනිලා අඬාගෙන ඇවිත් මට කිව්වේ. තාත්තට නං කියන්න එපා කිව්වා ගහයි කියලා. මම ඉතින් කිව්වෙත් නෑ...' ඒ නැන්ද හුස්මක් ගන්න කතාව නැවැත්තුව වෙලාවේ අමිත ප්‍රශ්නයක් ඇහුවා.

'නැන්ද කිව්ව නේ ද දුවට ටෙලිෆෝන් එකක් අරන් දුන්නේ නැහැ කියලා.'

'අපි අරගෙන දුන්නේ නෑ. අර මිනිහා නේ අරන් දීලා තියෙන්නේ. ගෙදර ඉන්නකොට ෆෝන් එක හංගලා තියාගන්න කියලා.... මේ දරුවන්ගේ ආරක්ෂාවට

21 වයස අවුරුදු 18ට අඩු ළමයකු අසභ්‍ය හෝ අශ්ලීල ප්‍රදර්ශනයක හෝ දර්ශනයක පෙනී සිටීමට හෝ රඟපෑමට හෝ එවැනි ජායාරූපයක හෝ වීඩියෝවක නිරූපණය කිරීමට, පෙනී සිටීමට යම් ළමයකු පොළඹවාගන්නා, කැමති කරගන්නා, බලකරන හෝ එවැනි ජායාරූපයක් හෝ වීඩියෝවක් බෙදහරින හෝ තමා සන්තකයේ තබාගන්නා කවර තැනැත්තෙකුට වුවද අවුරුදු 2ත් 10ත් අතර සිර දඩුවම් ලබා දිය හැකි අතර දඩයකටද යටත් කළ හැකිය.



අපි කොයි තරම් වැට කඩුළු බැන්දත් වැඩක් තියෙනවාද, දරුවෝ දෙමාපියන් විස්වාස නොකර තැන තැන මුණගැහෙන ප්‍රාණකාරයන්ව විස්වාස කරනවා නං!

'තරහා නිවෙනකම් ටිකක් වෙලා ඉඳලා ඒ නැන්දෑ ආයෙමත් කතාව පටන්ගත්තා.

'මම මොකද කළේ? දුවගේ ෆෝන් එක අරගෙන මම ආවා. එයා කෙටි පණිවිඩවලින් තමයි යන එන තැන් කියන්නේ. ඉතින් මං ඒ ඔස්සේ හොයාගෙන හොයාගෙන ආවා. මේං මේ හෝටලේට තමයි එන්න කියලා තිබුණේ. ඒ මිනිහා පාටි එකක් තියෙනවා කියලා පොඩි සාලාවක් වෙන් කරවාගෙන. එතැනට ගියාම මට දෙලෝ රත්වුණා. එතැන තව පිරිමි කාණ්ඩේ කීප දෙනෙක්. නා නා ප්‍රකාර විකාර ඇඳුම් ඇඳගත්ත ගෑනු කීපදෙනක් හිටියා. පැත්තක කැමරාවක් අටවලා. දුව වෙනුවට මම ගියාම අර මිනිහට හොඳටම තරහා ගියා. කැමරාව තියාගෙන උන්නු මිනිහා කෑගහන්න ගත්තා තමුසේ අපේ කාලේ නාස්ති කළා, කෝ කෙල්ල කියලා.... බැලින්නං මේ ජරා පින්තූර අරගෙන අන්තර්ජාලෙට දෑන ජරා ජාවාරමක්. මම බැනලා බැනලා කිව්වා පොලිසි යනවා කියලා. ඒ මිනිහා තර්ජනය කළා පොලිසියට කිව්වොත් ඉතුරු කරන්නේ නැහැ කියලා. ඒ මදිවට මා පස්සෙන් පන්නාගෙන ඇවිත් දූට දීලා තිබුණු ටෙලිෆෝන් එකත් උදුරාගත්තා. දැන් අපට සාක්කිත් නැහැ මේ මිනිහා කතා කළා කියලා ඔප්පු කරන්න. පොලිසි ගිහින් වැඩක් වෙයිද මන්ද හරියකට සාක්කියක්වත් නැතුව.... ඇරත් පොලිසියේ අය මගේ දරුවා ගැන මොනවා නොහිතාවිද අර වාගේ පින්තූර ගන්න ඉඩ දුන්නා කිව්වාම? කටක් ඇරලා මේවා පොලිසියකටවත් කියන්න පුළුවන්ද? මේ දරුවන්ගේ නාත්තට කොහොමද මේ සිද්ධ වෙච්චි දේවල් මං කියන්නේ?.. අපි හරි වැදගත් විදිහට ජීවත් වෙන මිනිස්සු! අනේ! අපට ඇයි මෙහෙම දෙයක් සිද්ධ වුණේ!!!' ඒ නැන්දෑ අඬන්න ගත්තා.

අමිත නිශ්ශබ්දවම පාරුව පැදගෙන ගියා, නැන්දාට අඬන්න ඉඩ දීලා. හිතට ලොකු කණගාටුවක් ආවාම අඬන එක හොඳයි හිතේ බර අඩු වෙන්න. මල්ලි නිසා අමිතත් නාත්තත් ඔහොම ඇඬූ දවස් නම් කොතෙක් ද?

ඒ නැන්දාගෙ ඇඬීම අඩු වුණාම අමිත කතා කළා.

'නැන්දෑ සාක්කි නැති එක ගැන බය නොවී පොලිසියට යන්න. නැත්තං අර තියෙනවා නේ අර **1929** කියලා ළමා හදිසි උපකාරක සේවාවක්[22]. ඒක ළමා ආරක්ෂක අධිකාරිය කියන කන්තෝරුවෙන් කරන ළමා උපකාරක දුරකතන සේවාවක්. ඒකට කතා කරලා කියන්න.' අමිත මේ විස්තර දන්නේ මොකක් හෝ එයාටත් සිද්ධ වුණු දෙයක් නිසා කියලා දැනුණත් ඒ නැන්දෑ විස්තර ඇහුවෙ නෑ. අමිත දිහා නිශ්ශබ්ව බලාගෙන හිටියා.

'පුතා තව දන්න දෙයක් තියෙනවා නං මේ වාගේ ප්‍රශ්නෙකට උදව් ගන්න ක්‍රම ගැන මට කියන්න.' ඊළඟට ඒ නැන්දෑ අමිතගෙන් ඉල්ලුවා.

'නැන්දාගේ දුව ඔය යාළුවෙලා හිටිය මනුස්සයා මිනිස් වෙළෙඳාමක හවුල්කාරයෙක් වෙන්න ඇති.' අමිත කිව්වා.

'මිනිස් වෙළෙඳාමක් ???'

'ඔව් විශේෂයෙන් ළමයින්වයි කාන්තාවන්වයි එක එක විදිහට රවටලා හරි තර්ජනය කරලා බලෙන් හරි අරගෙන ගිහින් ඔහොම නීති විරෝධී නරක වැඩවලට පාවිච්චි කරන එක ජාවාරමක් කරගත්තු කල්ලි ඉන්නවා. ඒවයේ ඉන්න සමහර අය ඔහොම ළමයි එක්ක බොරුවට යාළුකම් හදාගෙන ඊට පස්සේ අර වාගේ ජාවාරම්වලට පාවිච්චි කරනවා. එක්කෝ එයාලගේ නරක පින්තූර ගන්නවා වාගෙ දේවල් කරලා ඊට පස්සේ කියන කියන දේවල් කළේ නැත්නම් අර පින්තූර හැමෝටම පෙන්නවා කියලා බය කරනවාලු. ඉතින් සමහරු එහෙම පින්තූර පෙන්නුවොත් සමාජේ ඉස්සරහ ලැජ්ජා වෙන්න වෙයි කියලා බයට කියන දෙයක් කරන්න හිත හදාගන්නවා. එහෙම දේවල්වලට ළමයින්ව හොයලා දෙන අයට සල්ලි ගෙවනවාලු.[23]'

අමිත කියනකොට අර නැන්දෑ කිව්වා, 'ඔව් ඔව් ඒක ඇත්ත. මං ආපහු දුවගෙන එනකොට අර කැමරාකාරයා කියනවා ඇහුණා පින්තූරවලින් පෙන්නුව කෙල්ල ආවෙ නැත්තං තමුසේ අපෙන් සල්ලි බලපොරොත්තු වෙන්න එපා කියලා.'

'ඔහොම වැරදි වැඩවලට ළමයි සපයන එකට කියන්නේ කුට්ටනය කියලා.' අමිත තමන් දන්න තවත් විස්තර එකතු කළා. ඔහොම ළමයින් වැරදි වැඩවලටට පාවිච්චි කරන එකත් ළමා අපයෝජනයක්. ඉතින් ළමයින් රවටලා එහෙම අපයෝජනය කරන්න කාට හරි ළමයින් සපයන එක, ඒ වාගේ වැඩකට ගෙනා

22 මෙවැනි හිංසාවකට හෝ අපරාධයකට දරුවකු ලක්වුවහොත් හෝ එවැනි අවදානමකදී ඒ සම්බන්ධයෙන් පැමිණිලි කළ හැකි ස්ථාන: 1929 ළමා හදිසි උපකාරක සේවය ඇමතීමෙන්, ළමා ආරක්ෂක අධිකාරියට හෝ එහි ප්‍රාදේශීය නිලධාරියකුට හෝ පරිවාස දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හරහා, ළඟම පිහිටි පොලිසියේ ළමා හා කාන්තා ඒකකයට පැමිණිලි කිරීමෙන්, ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය හෝ රෝහල මඟින්, හෝ පාසලේ විදුහල්පති හෝ ගුරුවරුන් හරහා පැමිණිලි කිරීමෙන් මේ සඳහා සහය ලබා ගත හැකි වේ.

23 ලිංගික අපයෝජනය සඳහා ළමයකු රැගෙන යාම හෝ සැපයීම, ඒ සඳහා ළමයින් වෙළෙඳාම් කිරීම ළමයින් කුට්ටනය කිරීමේ වරදට අයත් වේ. ලිංගික හෝ වෙනත් අපයෝජනයන්, දස හෝ වහල්භාවයේ තබා සේවය ගැනීම, ණයකට හිලව්වක් සේ ළමයකු රැගෙන යාම යනාදිය නැතැත්තන් වෙළෙඳාම් කිරීමේ වරද යටතේ ළමයින්ට අඳුළ අපරාධ වැරදි වේ. ළමයකුගෙන් බලහත්කාරයෙන් වැඩ ගැනීම, ශරීරයේ අවයව ඉවත් කිරීම, ගණිකා වෘත්තියේ යෙදවීම හෝ වෙනත් නීතියක් යටතේ වරදක් වන ක්‍රියාවක් සඳහා ළමයකුගේ කැමැත්ත ඇතිව හෝ නැතිව රැගෙන යාම/ප්‍රවාහනය/ භාරගැනීම/ සේවයට බඳවාගැනීම යනාදි වරදක් සඳහා වසර 3 සිට 20 දක්වා සිර දඬුවමක් හා දඩයක් නියම කළ හැක. (අවුරුදු 18ට වැඩි අයෙකු මෙවැනි වෙළෙඳාම් කිරීමකට ලක් කිරීමේ වරද සඳහා අවු 2 සිට 20 දක්වා දඬුවමක් හා දඩයක් නියම කෙරේ.



ළමයින් රැඳවලා තියා
ගන්න එක වාගේම
මෙහෙම ළමන්ගේ නරක
පින්තූර තැන් තැන්වල
පළ කරලා ඒවා ගැන
දැන්වීම් දැන එක... මේවා
ඔක්කොම බරපතල වැරදි
ගාණට තමයි වැටෙන්නේ.
මෙහෙම අපයෝජන
ළමයින්ට විරුද්ධව කරන
අපරාධ හැටියට සලකලා
අපරාධ නීතිය යටතේ
නඩු දැන්න පුළුවන්ලු. ...
පොලිසියයි උසාවියයි
මේවාගේ දේවල් ගැන
දැන්න නිසා ඒ ගැන
පැමිණිලි කරන්න බය
වෙන්න ඕනෑ නැහැ. මේ
වාගේ උගුල්වලට අහු වුණු
'ළමයින් බේරගන්න තමයි
ඒ අයත් බලන්නේ.'

'අනේ මන්ද ළමයෝ.....
දෙමාපියෝ හැටියට අපි
මේවා සෙව්වේ බැලුවේ
නැත්තේ ඇයි කියලා අපටත් දෙස් අහන්න වෙයි. එහෙමෙයි කියලා පැමිණිලි
නොකරත් බෑ. මේ දරුවගේ නරක පින්තූර හැම තැනම දැම්මොත්?? අපොයි
දෙයියනේ! ඒ මදිවට අර මිනිහගෙනුයි ඒ ජාවාරම් කල්ලිවලිනුයි අපට කරදර
වෙන්නත් ඉඩ තියෙනවා නේ. අනේ අපි මොකද කරන්නේ දැන්'.

'නැන්දේ. හොඳම දේ තමයි මේ ගැන නීතියෙන් යමක් කරන්න බලයක්
තියෙන පොලිසිය හරි ළමා ආරක්ෂක අධිකාරියට හරි මේ ගැන කියන එක.
ලැජ්ජාවට කියලා මේවා හංගාගෙන හිටියොත් ළමයින්ට ආරක්ෂා වෙන්න ක්‍රමයක්
හදලා දෙන්නයි, කරදරේ වැටුණු ළමයින්ට ගොඩ එන්න උදව් කරන්නයි ඒ
ආයතනවලට ඉඩක් ලැබෙන්නේ නැහැ නේ... මං කලිනුත් කිව්වේ අර ළමා ආරක්ෂක
අධිකාරිය කියලා කන්තෝරුවක්. නැන්දෑ අහලා ඇති නේ?'

'ඔව්. ඔව්. මං අහලා තියෙනවා. ඔය ළමයින්ව මෙහෙකාරකමට ගන්නවා
කියලා තොරතුරක් දන්නවා නං ඕනෑ කෙනෙකුට කතා කරලා ඒ ආයතනයට පැමිණිලි
කරන්න පුළුවන් නේ.' ඒ නැන්දෑ කිව්වා.

'ළමා මෙහෙකාරකම විතරක් නෙවෙයි නැන්දේ මේ වාගේ ළමයින්ට සිද්ධවෙන
ඕනෑම අපයෝජනයකදි හරි එහෙම සිද්ධ වෙන්න ලොකු අවදානමක් තියෙනවා නම්
හරි ඒ ගැන ළමා ආරක්ෂක අධිකාරියට පැමිණිලි කරන්න පුළුවන්...' ඒ නැන්දට මේ
වෙලාවේ ප්‍රයෝජනයක් වේවි කියලා හිතුව හැම දෙයක්ම අමිත කිව්වා.

ඒ කතාව ඉවරවෙනකොට පාරුව උඩහතැන්නේ බස් පාරට නගින තැනටත්
ඇවිත්.'නැන්දට ඔතැනින් නැගලා ගියාම බස් එකට නගිනෑකි. පරෙස්සමෙන් යන්න.'
අමිත කිව්වා.

'මං කීයක් ගෙවන්න ඕනැද පුතා?' ඒ නැන්දෑ ඇහුවා.

'සල්ලි ඕනෑ නෑ නැන්දේ. නැන්දගේ ප්‍රශ්නෙ ඉක්මනට විසඳිලා හැම දෙයක්ම
හරියන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා.'

'අනේ වාසනාවන් දරුවෝ! එහෙම කිව්ව එකත් වටිනවා. මේ දරුවගෙත්
මොකක් හරි කරදරයක් තියේ නං ඒවත් විසඳෙන්න ඕනෑ දෙයියො බුදුන් පිහිටවෙලා.
මං යනවා පුතා. මගේ හිත හැදෙන්න කතා කළාටත් කරන්න ඕනෑ දේ ගැන කිව්වටත්
පුතාට බොහොම පින්.' එහෙම කියලා ඒ නැන්දෑ ආයිමත් ආ පිට හැරුණා.

'පුතාගෙන් මට තව එක ඉල්ලීමක් කරන්න තියෙනවා.'

'ඒ මොකක්ද නැන්දේ? පුළුවන් දෙයක් නම් කරලා දෙන්නම්.'

'අනේ පුතා මං අපේ දූ ගැන කිව්ව විස්තර කා එක්කවත් කියන්න එපා.
මේවා රටේ ලෝකේ ප්‍රසිද්ධ වෙන්න හොඳ කාරණා නෙවෙයි නේ.'

'මම දන්නවා නැන්දේ. ඒක නේ මම නැන්දගේ නම ගමවත් ඇහුවෙ නැත්තෙ.
හිතේ දුක නිවාගන්න කතා කළාට මේවා නිකරුණේ හැමෝටම දන්නන්න ඕනෑ
කාරණා නෙවෙයි නේ.'

ඒ නැන්දෑ සාරි පොටෙන් ආයිමත් දෑස් පිහිදගත්තා. 'පුතාට බොහොම පින්'
කියලා අඩි පාර දිගේ බෑවුම නැගලා උඩහ පාරට ගොඩ වුණා.

අමිත පාරුව පැදගෙන ටිකක් ඉහළට ගිහින් නැවතුණා. වෙන කෙනෙකුගේ

ප්‍රශ්නයක් කතා කළා වුණත් හිතට බරක් දැනෙනවා කියලා අමිතට හිතුණා. ඒ කතාවෙන් මල්ලි ගැන විස්තරය අලුතෙන් මතක් වුණු නිසා ඒකත් හිතට බරයි. අමිත ගඟට බැහැලා වතුර දෝතක් අරගෙන මූණ සෝදගත්තා. තවත් සැරයක් වතුර ගන්න ගඟට නැවෙනකොට තමයි දැක්කේ වතුරෙ යට ගිලිලා තියෙන ලස්සන දිලිසෙන භාජනයක්! අමිත ඒක අතට ගත්තා. හැබෑ ලස්සනයි. කාගෙද මේක? කොහෙන්ද මෙතැනට? කවුරුවත් හංගලද? පාවෙලා ඇවිල්ලද මෙතැන රැඳුණේ? මේක හරි වටින පාටයි. එහෙම හිතමින් අමිත වටපිට බැලුවට කවුරුවත්ම පේන්න නෑ.



'අයිතිකාරයෙක් නැති දෙයක් නං මම ගත්තට කමක් නැතුව ඇති.' අමිත හිතුවා. 'මේ ඇත්ත මුතුද? බොරු මුතු වෙන්නැති. ඇත්ත මුතු නං මේක ගඟට විසිකරයිද?' අමිත මුතු වට්ටියේ වතුර ගසලා ඇඳගෙන හිටි කමිසෙන්ම ඒක පිහිදැම්මා. 'මේක හෝටලේ තියෙන විසිතුරු භාණ්ඩ සාප්පුවට දුන්නොත් හොඳ ගාණක් ගන්න බැරි වෙන එකක් නෑ. අයිතිකාරයෙක් පේන්න නැති නිසා මං ගත්තට වරදක් නැතුව ඇති නේ.'

අමිතට ලෙඩ ඇඳේ ඉන්න තාත්තා මතක් වුණා. සල්ලි තියනවා නං තාත්තාව හොඳ දෙස්තර කෙනෙකුට පෙන්නලා පිළිවෙලකට බෙහෙත් කරන්න පුළුවන්. ඔක්කොටමත් වැඩිය මල්ලිට උදව් කරන්න පුළුවන්. මල්ලිව කොහොම හරි හොඳ කාර්මික විද්‍යාලයකටවත් දගන්න තිබුණොත් හොඳයි. 'අර නැන්දට උදව් කළ නිසා ද කොහෙද දෙන දෙයියො අතටම තෑගි ගෙනත් දීලා.' අමිතගෙ මූණොත් හිතෙත් ලොකුවට හිනාවක් ඇඳුණා.

අමිත ඉක්මනට මුතු වට්ටිය පාරුව කොනේ තිබුණු ගෝනියක ඔතලා හැංගුවා. ඊළඟට දිගටම උඩහට පාරුව පදින්න ගත්තා. 'හෝටලේට නෙවෙයි පහළතැන්නේ රත්තරන් බඩු සාප්පුවට ගිහින් දීලා බලනවා.'

ගං ඉවුරේ ඉඳගෙන කෑ ගහමින් දෑත වනමින් පාරුව ගොඩට ගේන්න කියන කාසුව අමිත දැක්කේ එතකොටමයි. 'මම හදිසි ගමනක් යන්නේ කාසු. ඇයි?' පාරුව ගං ඉවුර ළඟට ගන්නේ නැතුවම අමිත ඇහුවා.

පාරුව නවත්තන තුරු බලා නොඉඳ කාසු වතුර බැහැලා ජස බස ජස බස ගාමින් පීනගෙන ඇවිත් පාරුවට ගොඩ වෙන්න හැදුවා.

'මොකද කාසු මල්ලි මේ? මොකද කලබලේ?'

'මුතු වට්ටිය ඇහින්ද නේ? මම ඈත එනකොට දැක්කා. ඒක අපේ. දෙන්න ඒක.' කාසු කිව්වා.

අමිතට එක සැරේටම ගෝනිය දිහා බැලුණා. එයා කාසුට පාරුවට නගින්න නොදීම ගොනිය කකුලෙන් ඈතට තල්ලු කළා. කාසුගෙ වෑයම කොහොම හරි ගෝනිය ගන්න. දැන් දෙන්නා පොර බදනවා. එක්කෙනෙක් වතුරේ අනෙක් එක්කෙනා පාරුවේ. පාරුව ඒ පැත්තට මේ පැත්තට හෙළවෙනවා. මේ කරන වැඩේ වැරදියි ද? පොර බදන ගමන් අමිතට හිතුණත් මුතු වට්ටිය තමන් අතට ගන්න තියෙන වුවමනාව නිසා එයා රණ්ඩුව නැවැත්තුවේ නැහැ.

එක සැරේම ගෝනිය ලිස්සලා ගිහින් ගඟට වැටුණා. දෙන්නම ඒක ගන්න පොර බදිමින් වතුරට පනිනකොට කාසුගෙ ඔලුව තදින් පාරුවේ වැදුණා. පොරය ඉබේම නැවතුණා. දෙන්නම ගෝනිය උඩට ඇදලා ගත්තේ එකට එකතුවෙලා. අමිත කාසුටත් පාරුවට නැගගන්න උදව් කළේ ඊට පස්සේ. අමිත පාරුව ගං ඉවුර කිට්ටුවට ගෙනැල්ලා කඹේ ගැට ගැහුවා ගඟට නැමුණු අත්තක. දැන් දෙන්නම පාරුවේ ඉඳගෙන එකිනෙකා දිහා සැකෙන් බලා ඉන්නවා.

'තරහ වෙන්න එපා අයියේ. ඔය මුතු වට්ටිය අපේ. ඒක මට ඕනෑ.' කාසු ආයිමත් පටන්ගත්තා.

'බොරු නොකියා ඇත්ත කියනවා බලන්න. මේක ඔයාලගේ නෙවෙයි කියලා මට ටක්කෙටම කියන්න පුළුවන්. ඔයා කොහොමද මේක මෙතැන තියෙනවා කියලා දන්නේ? ඔයාද හැංගුවේ?' අමිතත් තදින්ම ප්‍රශ්න කරන්න ගත්තා.

ඔන්න ඉතින් කාසු ඇත්තටම සිද්ධ වුණු දේ කිව්වා. 'මට අපේ මල්ලිව බේරාගන්න පුළුවන් මේක ආපහු ගිහින් දුන්නොත් විතරයි. නැත්නං අරගොල්ලෝ අනුමානයක් නෑ මල්ලිව පොලිසි ගෙනියනවා. ඔයාට මේකෙ බරපතලකම දැනෙනන්නේ නැද්ද අමිත අයියේ?'

අමිත මොකුත් කිව්වෙ නෑ. හැබැයි මුතු වට්ටිය දෑලා තියෙන ගෝනිය කාසු අතට දුන්නෙත් නෑ.

විනාඩි කීපයකට කලින් අමිතගේ හිතේ ඇඳුණු ලස්සනම හීනය, තාත්තා සනීප කරගෙන මල්ලිත් කාර්මික විද්‍යාලයකට යවලා උගන්නලා පීවිතේ ලස්සන

කරගන්න මැව්ව හිනය අඳුරු වෙලා හිතෙන් මැකිලා යනවා අමිතට දැනුණා. 'මටත් ඕක ඕන කළේ මල්ලිට දියුණුවක් හදලා දෙන්න, තාත්තා සනීප කරගන්න. නැතුව සල්ලි කෑදරකමට නෙවෙයි.' අමිත කිව්වා. කාසු මොකුත් කිව්වේ නෑ.

'මම මේ කතාව කියන්නේ කාසු විශ්වාස කරලා. ඔයා අතන මෙතන කියවන්නේ නැති බව මම දන්න නිසා.' ඔහොම කියලා කතාව පටන්ගත්තේ අමිත. 'ඔයා දන්නව ද අපේ මල්ලි පුනරුත්ථාපන ළමා නිවාසෙක හිටිය කියලා?'

'නෑ. ඒ මොකක්ද?'



'ඒකට කියන හරිම නම මම දන්නෙ නැහැ. හැබැයි ඒ වාගේ ළමා නිවාසවල තමයි තමන් කළ වැරදි හඳගන්න උසාවියෙන් එවන ළමයින් රඳවලා තියන්නේ.'

'හෝ හෝ. අද කෝලිත ඔහොම නිවාසයක් ගැන සුරේන්ලා එක්ක කියනවා මට ඇහුණා. එයා ගියා කියලා කිව්වෙ නැහැ. ඇයි කෝලිතට එහෙම තැනකට යන්න වුණේ.'

'ඇයි එහෙම වුණේ කියන එකට දෙන්න සරල උත්තරයක් නැහැ කාසු. අපට සල්ලි නෑ. අපි පොඩි කාලෙම අම්මා නැති වුණා. ඒත් අපේ ගෙදර ආදරේ කරුණාව අඩුවක් වුණේ නෑ. අපට අපේ වැඩ තනියම කරගන්න පුළුවන් වෙනකම් ගෙදර උයල පිහල හැම වැඩක්ම කළේ තාත්තා. මට තේරෙන වයසට ආවාම මම තාත්තගේ වැඩ කොටසෙන් සෑහෙන කොටසක් මගේ කරට ගත්තත් අපි මල්ලිට ලොකු බරක් දැනෙන්න තිබ්බෙ නැහැ. අපේ අගහිඟකම් මල්ලිට දැනුණාට එයා සැහැල්ලුවෙන් හිටිය ළමයෙක්.'

'ඉතින් මොකක්ද කෝලිතට වුණේ?'

'තාත්තා ඒ කාලේ උඩහතැන්නෙ වත්තක කුලී වැඩ කළේ. හැබැයි තාත්තා වැඩ ඇරිලා ආවාම අහක දැන ලී කෑලි ගෙනත් ඒවායින් පුංචි සෙල්ලම් බඩු හදනවා. දැන් වාගේ අසනීප නැති නිසා තාත්තා උදේ රෑ නැතුව වැඩ කළා ඒ කාලේ. තාත්තා හදන සෙල්ලම් බඩු උඩහතැන්නේ කඩේකට යවනවා මල්ලි අතේ. මල්ලි එතකොට

පහේ පන්තියේ විතර ඇති. මම සාමාන්‍ය පෙළට පාඩම් කරන නිසා තාත්තා මට කරදර කරන්නේ නැතුව මල්ලිව යැව්වා... මුලින් මුලින් තාත්තගේ ඉල්ලීමට ඒ කඩේ අයිතිකාරයා මල්ලිව ආපහු බස් එකට නග්ගනවා ගෙදර එන්න. ඒත් පුරුදු වුණාට පස්සේ මල්ලි තනියම එන්න ගත්තා. එතකොට මිනිහා ටවුමේ ටිකක් ඇවිදලා ඔය කඩ සාප්පුවල සෙල්ලම් බඩු එහෙම බල බලා ඉන්නවලු'.

'ඉතින්?'

ඔහොම ඉන්නකොට බස් ස්ටෑන්ඩ් එකේ ඉන්න නැන්දෑ කෙනෙක් මල්ලිට දවසක් පුංචි කාර් එකක් තෑගි දීලා. මම දැක්කා පුතා හැමදාම ඔය සෙල්ලම් කාර් දිහා බලනවා. මටත් ඉන්නවා ඔයා වාගේ පුංචි පුතෙක්. ඒකයි මම මේක දෙන්න හිතුවේ කියලා කිව්වලු. මල්ලි කාර්වලට හරි ආස නේ. ඉතින් අරගෙන. හැබැයි එයා දන්නවා තාත්තා බනී කියලා අඳුනන්නේ නැති අයගෙන් තෑගි ගත්තොත්. ඒ නිසා අපට පෙන්නන්නේ නැතුව මිදුලෙ කොනක පරණ වළඳක දාලා හංගලා. මේ විදිහට අර ගෑනු එක්කෙනා නිතර නිතර අපේ මල්ලිට සෙල්ලම් කාර් තෑගි දීලා. සමහර දාට එක්කගෙන ගිහින් කේක් අයිස්ක්‍රීම් එහෙමත් අරගෙන දීලා. අම්මත් නැති පොඩි එකා නේ. අම්මා කෙනෙකුට වාගේ කිට්ටුවෙන්න ඇති.' අමිතගේ කටහඬ වෙව්ලුවා. ඒත් එයා ඇඬුවේ නෑ.

කාසුත් කලබල නොකර බලාගෙන හිටියා.

'ටික දවසක් ගියාට පස්සේ ඒ මනුස්සයා මල්ලිට පොඩි පොඩි පාර්සල් දෙනවලු මේක අන්න අතන අර බස් ස්ටෑන්ඩ් එකේ ඉන්න අයියට දෙන්න, මේ සාප්පුවේ ඉන්න මාමාට දෙන්න ඔහොම කිය කියා. මල්ලිත් දෙසැරයක් නොහිතා කරලා දීලා. ඊට පස්සේ දවසක ඔය පාර්සල් බාරගන්න අපේ වයසේ කොල්ලො කට්ටියක් ඇවිත් තියෙනවා. එයාලා තමයි මල්ලිටත් බොන්න දීලා තියෙන්නෙ මේකෙ තියන ඒවා.[24]'

'මත් ද්‍රව්‍ය ජාතියක්?' කාසු ඇහුවා.

'ඔව්. මත්ද්‍රව්‍ය ජාතියක්. මල්ලි ඊට පස්සේ අපිට හොරෙන් ඒවා ගෙනිහින් දෙන්න විතරක් නෙවෙයි පාවිච්චි කරන්නත් පටන් අරගෙන. වැඩි දවසක් නොගිහින් තාත්තට තේරුණා මල්ලි දැන් හරි අමුතුයි කියලා. හැම වෙලාවෙම නිදාවැටෙනවා, හරියට තරහා යනවා, සෙල්ලම් කරන්නෙවත් නෑ. පාඩමක් කරගන්නත් බෑ වාගේ වෙනස්කම් පේන්න ගත්තා. දවසක් තාත්තා මල්ලිත් එක්ක පහළතැන්නට ගිය වෙලාවක ඉස්පිරිතාලෙට ගිහින් දෙස්තරට කියලා ඒ ගැන. ඔන්න එතැනින් තමයි එළි වුණේ කාරණාව. ඔහොම දෙයක් දැනගත්තාම රෝහල් පොලිසියට කියන නිසා එතැනින් පොලිසියටයි, පරිවාස නිලධාරිටයි, ඊළඟට උසාවියටයි ඔහොම ගිහින්

24 කිසියම් සීමිත භාණ්ඩයක්, එනම් තහනම් මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා දැන දැනම ළමයකු කුලියට ගැනීම/ සේවයේ යෙදවීම/ කැමති කරවාගැනීම/ පෙළඹවීම /බලකිරීම වරදකි. ඒ සඳහා වසර 5 සිට 7 දක්වා සිර දඬුවමක් හා දඩයක් ගෙවීමට සිදු වේ

ගිහින් අන්තිමට මල්ලි නොදැන කළ දෙයක් නිසාත්, අවුරුදු දොළහට අඩු නිසාත් දඩුවම් දුන්නේ නැහැ. හැබැයි පුනරුත්ථාපනය වෙන්න කියලා අර ළමා නිවාසෙට ඇරියා. අවුරුද්දකට කිට්ටුවෙන්න එතැන හිටියා...'

'අපේ අක්කත් ඉස්සර නිතර මට කියනවා ඔහොම මත්ද්‍රව්‍ය විකුණාන්න, ඒවා පාවිච්චි කරන්න ළමයින් අල්ලගන්න මාන බලන මිනිස්සු ටවුන්වල විතරක් නෙවෙයි අහල පහළත් ඉන්න පුළුවන් ඒ නිසා පරෙස්සම් වෙන්න කියලා[25]. ඉතින් මල්ලිව ඒ ජාවාරමට හවුල් කරගත්තු අයව පොලිසියෙන් අල්ලගත්තද?'

'කොහෙ අල්ලන්නද? මල්ලි මුලින් බයටම ඒ මිනිස්සු ගැන මොකුත්ම කිව්වෙ නෑ. මල්ලිව ඒගොල්ල බය කරලා තිබුණා මේ ගැන කාට හරි කිව්වොත් මල්ලිට කරදර වෙයි කියලා.'

'අර මල්ලිට මුලින් කාර් තෑගි දීලා කරුණාවෙන් කතා කළ ගෑනු එක්කෙනත් එහෙම කියලද?'

'මල්ලිව මත්දුව්‍ය කල්ලියට අඳුන්නලා දුන්නට පස්සේ ඒ මනුස්සයා පේන්නවත් ආවේ නැතිලු. ඒකෙන් මල්ලි හරියට මානසිකව වැටුණා. එයාට අපේ අම්මව හරියට මතක නැහැ නේ. මල්ලිට අවුරුදු තුනක් විතර ඇති නේ අම්මා නැති වෙනකොට. ඉතින් මං හිතන්නේ මල්ලි ඒ මනුස්සයාව දැක්කේ අම්මා කෙනෙක් වාගේ. මල්ලි මුලින් විශ්වාස කළේම නෑ එයා මේ ජාවාරමට මල්ලිව රවටලා හවුල්කරගත්තා, මත්ද්‍රව්‍යවලට පුරුදු කරගත්තා කියලා. පස්සේ ඒක තේරුම් ගියාම මල්ලි කා එක්කවත් කතා නොකර ඇරියා. බලාගත්ත අතේ බලා ඉන්න ගත්තා. ලොකු කම්පනයකට මුණ දුන්නාම ඔහොම වෙනවා කියලා අපිටත් තේරුම් කරලා දීලා, මල්ලි එක්ක දවස් ගණන් කතා කරලා, කරලා, එයාට ආයිත් ජීවිතේ හදාගන්න උදව් කළේ පහළතැන්න ඉස්පිරිතාලේ මානසික සෞඛ්‍ය ඒකකයේ දෙස්තර.[26]'

'අයියලගේ තාත්තා ලෙඩ වුණේ ඔය ප්‍රශ්නෙ නිසා ද?'

'නෑ. නෑ. තාත්තට තරුණ කාලේ හිටන් ඇදුම තිබිලා තියෙනවා නේ. පස්සේ පස්සේ හරියකට බෙහෙත් ගන්න එක ගැන තාත්තා කරදර වුණේ නෑ අපි ගැනම මහන්සි වෙනවා මිසක්. ඒකෙන් ලෙඩේ වැඩි වුණා. දැන් නම් ඇඳෙන් නැගිටලා පොඩි වැඩක් කළත් හතිය හැදිලා හුස්ම ගන්න අමාරු වෙනවා. ඒකයි මට හිතුණේ ඔය මුතු වට්ටිය විකුණලා සල්ලි අරගෙන තාත්තට පිළිවෙලකට බෙහෙතක් කරන්න. මල්ලි ආපහු ඉස්කෝලේ යන්න බෑ කියන නිසා එයාට කාර්මික අතේ වැඩක් ඉගෙනගන්න තැනකට සල්ලි ගෙවලා හරි දැන්න.'

25 මෙවැනි තත්ත්වයකදී ළමයින්ට උපකාර ලබා ගැනීම සඳහා 1927 කෙටි දුරකතන අංකය ඔස්සේ අන්තරායකාර ඖෂධ පාලක මණ්ඩලය අමතන්න.

26 එවැනි මානසික ගැටලුකාර තත්ත්වයකදි පළාතේ රෝහලේ මානසික වෛද්‍ය ඒකකයෙන් හෝ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙන් හෝ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මනෝ උපදේශන නිලධාරිගේ හෝ සහය ලබාගත හැකි වේ.

කාසු ලොකු හුස්මක් හෙළුවා. 'මං බැනුම් අහන එක විතර නම් ප්‍රශ්නේ මං අයියට ඕක දෙනවා. ඒත් මටත් අපේ මල්ලි බේරගන්න ඔය මුතු වට්ටිය ඕනෑ වෙනවා. අනිත් එක ආච්චි අම්මා ලෙඩ වුණාට පස්සේ අම්මා තාත්තා වාගේ අපිව බලාගන්නේ අපේ අක්කා. මට හරි මල්ලිට හරි කරදරයක් වුණොත් අපේ අක්කට ඒක නම් දරාගන්න අමාරු වෙනවා.'

දෙන්නම කතා නැතුව නිසංසලව ගලාගෙන යන ගඟ දිහා බලාගෙන හිටියා. ගඟේ වතුර පාරට පාරුව යන්තම් සෙලවෙනවා. ඒත් කඹෙන් ගැටගහලා තියෙන නිසා ගහගෙන යන්නෙ නැහැ. 'අපේ ජීවිතවලටත් ඒ වාගේ දිය පාරට ගහගෙන නොයන්න උදව් කරන රැහැනක්, ශක්තියක් ඕනෑ.' අමිතට කල්පනා වුණා. 'මොකක්ද මගේ ජීවිතේ ගහගෙන යන්න නොදී අල්ලගෙන ඉන්න රැහැන?

'මොකක්ද මගේ ශක්තිය? තාත්තාගෙයි මල්ලිගෙයි ආදරේ, ඒගොල්ලන් ගැන මට තියෙන වගකීම්, මං ඉගෙනගත්තු දේ, මගේ දැනුම, හොඳ නරක තෝරා බේරා ගෙන වැඩ කරන්න මට කල්පනාවක් ඉවසීමක් තියෙන එක... නරකම නැහැ නේ! සමහර දේවල් වැරදුණාට, තවත් ගොඩක් දේවල් තියෙනවනේ මගේ ජීවිතේට හයියක් දෙන!' එහෙම කල්පනා වුණාම අමිතගෙ මූණට එළිය වැටුණා. හීන් හිනාවක් මූණේ ඇඳුණා.

'ඇයි අමිත අයියේ?'

අමිත තමන්ට හිතුණු දේ කාසු එක්ක බෙදාගත්තා. කාසුගේ මූණත් එළිය වැටුණා. 'ඇත්ත නේන්නං. එහෙම බැලවාම මගේ ජීවිතෙත් මට වටින, මගේ හිතට හයියක් දෙන ගොඩක් දේවල් තියෙනවා.' කාසුත් කිව්වෙ යන්තම් සිනාවෙන්.

'යමු නේ ද දැන් අපි උඩහට. අනිත් කට්ටිය උඩහ ගං ඉවුරේ බලාගෙන ඇති.' අමිත කිව්වේ මුතු වට්ටිය හැංගුව ගෝනිය කාසු අතට දෙන ගමන්.

9
මුතු වට්ටිය ගෙනාවෝ!

මුතු වට්ටියත් අරගෙන කාසුයි අමිතයි ආවාම ගං ඉවුරේ කතා ගොඩයි. හිනා වැස්සයි. හැමෝටම මුතු වට්ටිය බලන්න ඕනෑ වුණා. හැමෝටම කියන්න දේවල් ගොඩයි. හඳ මාමාත් ආපහු ඇවිත් බලාහිටියේ මුතු වට්ටිය සොයාගනිද කියලා දැනගන්න. මුතු වට්ටිය සොයාගත්ත නිසා ඇති වුණු සන්තෝසය හිතෙන් හිතට ගලාගෙන ගිහින් ගං ඉවුරේ සුළඟත් නැටුවා.... ගඟේ සිලි සිලි ගාන වතුරත්, ගස්වල සිරි සිරියෙන් සෙලවෙන කොළ මල් අතු ඉතිත් නැටුවා. ළමයින්ගේ හිනා හඬ ගං ඉවුරේ පැතිරුණා.

'අපි ඉක්මන් කරලා යන්න ඕනෑ දැන් ඔයාලගේ ගෙදරට.' කාසුට පොඩ්ඩායි අක්කයි මතක් වෙලා ගෙදර යන්න හදිසියි. 'දැන් සෑහෙන වෙලාවක් ගිහින් නේ. ඒගොල්ලො මොනවා කරගත්ත ද දන්නේ නැහැ. යමු. යමු.' කාසු එහෙම කිව්වාම තමයි කාටත් කල්පනා වුණේ ප්‍රශ්නෙ තව ඉවර නෑ නේ ද කියලා.

'අපට තව ප්‍රශ්නයක් තියෙනවා නේ. මේ සඳුනි නංගිව පාලම්ගොඩ ගමට එක්කගෙන යන්න ඕනෑ. තවත් දවල් වුණොත් එයාගේ ආච්චියි සීයයි බය වෙයි නේ.' සුභානි මතක් කළා. ඔන්න කට්ටිය කතා වෙලා වැඩ බෙදගත්තා.

'මමයි කෝලිතයි සඳුනි නංගිව ගෙදර එක්කගෙන යන්නම්.' අමිත බාරගත්තා.

'අපි තුන්දෙනා මුතු වට්ටිය අරගෙන ගෙදර යන්න එපැයි.' සුභානි කිව්වා.

'මම ගොහින් පාරුව බාර දෙන්නම්. පුතාට ඒකෙන් ප්‍රශ්නයක් වෙයි ද?' ඇහුවේ හඳ මාමා.

'නෑ. නෑ. මැනේජර් මහත්තයා හඳ මාමාව හොඳින් දන්නවා නේ.'

ඉතින් හඳ මාමා පාරුවෙන් ගඟ පහළට ගියා. ළමයිනුයි අමිතයි උඩහට ඇවිදගෙන ගියා හිනාවෙවී කතා කරමින්.

'මගේ ඇත්ත නම සඳුනි නෙවෙයි!' එක පාරට ම සඳුනි හයියෙන්ම කිව්වා. ඔක්කොම හිටි තැනම නැවතුණා.

'එහෙනං ඔයා කවුද?..... ඇයි බොරු කිව්වේ? ..... ඔයාගේ ඇත්ත නම මොකක්ද? ..... නම ඇහුවම නිකං එහෙම බොරු කියන්නේ ඇයි?' ප්‍රශ්න ගොඩයි.





ඉතින් සඳුනි විස්තර කළා ඉස්කෝලෙ ගිය මුල් දවසේ නම කිව්වාම ළමයි 'සඳුන් කැටේ! සබන් කැටේ!' කිය කියා හිනා වුණ හැටි. 'ඉතින් මගේ නම සඳුනි නෙවෙයි සඳුන් කැටේ!' කියලා සඳුනි ලැප්ජාවෙන් බිම බලාගෙන හිටියා.... ඒත් කවුරුවත් හිනා වුණේ නෑ.

'ඔයාගේ දක්ෂකම් බැලුවාම නං ඔයාට මැණික් කැටේ කියලයි කියන්න ඕනෑ.' සුරේන් කිව්වා.

'ඒක හරියට හරි.' කියලා අනිත් අයත් පිළිගත්තා.

'මම නං කැමති සඳුන් කැටේ කියන නමට' කිව්වේ කෝලිත. 'දිලිසෙන මැණික් කැටයකටත් වඩා සුවඳ හමන, බෙහෙතටත් ගන්න පුළුවන් සඳුන් කැටයක් හරි වටිනවා නේ.' ඒ කතාවටත් කට්ටියම එකඟයි.

ඉතින් කට්ටියම සඳුනිව ඉස්සර කරගෙන 'සඳුන් කැටේ, මැණික් කැටේ!' 'සඳුන් කැටේ, මැණික් කැටේ!' කිය කියා හිනාවෙවී යන්න ගත්තා.

'අයියේ. අපි ඇත්ත කියන්නේ නැද්ද?' සුභානි වෙන කාටත් නෑහෙන්න සුරේන්ගෙන් ඇහුවා.

'දැන් ආයෙමත් මොකටද මම මුතු වට්ටිය වීසි කළ කතාව ඇදල ගන්නේ? මුතු වට්ටිය හම්බවුණා නේ. ඉතින් පොඩ්ඩවත් කාසු අයියවත් පොලිසි ගෙනියන්න ඕනෑ වෙන්නෙ නැහැ නේ.' සුරේනුත් කසුකුසුවෙන් උත්තර දුන්නා.

'ඒ වුණාට අයියට තේරෙන්නේ නැද්ද? මුතු වට්ටිය හම්බවුණාට කාසු අයිය ඒක හොරකම් කළා කියලා අපේ අම්මලා හිතන එක නවත්තන්නේ නැති බව. මුතු වට්ටිය හොයාගෙන ආවෙත් කාසු අයිය නිසා කියයි එයා හංගලා තියලා ගෙනාවා කියලා. එයාට ගැවුණු නරක නාමේ නැතිවෙන්නේ නෑ මුතු වට්ටිය ආපහු ලැබුණාට.' සුභානි තේරුම් කරලා දුන්නාම සුරේන්ගේ මූණ මැලවුණා. 'ෂිහ්! මං හිතුවෙ ඒ අවුල ඉවරයක් වුණා කියලා.'

'මොකද මේ අයියයි නංගියි රණ්ඩුවක් ද හොරෙන් කසුකුසු ගාන්නේ?' ඇහුවේ කාසු අයියා.



ඒකට උත්තරයක් දෙන්න කලින් ක්‍රාස්!!! කියාගෙන උඩ පාරේ වාහන නවත්තන සද්දයක් ඇහුණා. ඉස්සරහින් තිබුණේ පොලිස් ජීප් රියක්. ටක් ටක් ටක් ගාලා ඒකේ දොරවල් ඇරුණා. පොලිස් නිලධාරින් දෙන්නෙක් බැහැලා කන්ද පහළට එන්න ගත්තා. ඊට පිටිපස්සෙන් ආ කාර් එකත් නැවැත්තුවා. දොරවල් ඇරුණා. සුභානිලාගේ අම්මයි තාත්තයි මුලින් බැස්සා. ඊළඟට බැස්සේ මාලිකා ටීචර්!

'මගේ ටීචර්!' කියාගෙන සඳුනි ඉගිල්ලිලා වාගේ දුවගෙන ආවාම මාලිකා ටීචර් දෑතම දික්කරලා සඳුනිව තුරුළු කරගත්තා. 'කොහෙද ගියේ චූටි දූ!'

පොඩ්ඩා තුරුළු කරගෙන බයෙන් බයෙන් අන්තිමට කාර් එකෙන් බැස්සෙ සේපාලිකා අක්කා. ඒ දෙන්නා කන්ද පහළට ආවේ ගාට ගාට, බයෙන් බයෙන්. අක්කයි මල්ලියි දැකලා කාසුගේ ඇස් කඳුළෙන් පිරුණා.

කාසු ඉක්මනටම ගෝනියෙන් මුතු වට්ටිය එළියට අරගෙන ඒක දෑතින්ම ඔලුවට ඉහළින් ඔසවගෙන ඉස්සරහට දුවගෙන දුවගෙන ආවා. සුභානිලාගේ අම්මා මුතු වට්ටිය ගන්න දෑත දික් කළත් කාසු එයාවත් පහු කරගෙන දිව්වේ අක්කා ළඟට.

'මල්ලියි මායි බේරුණා අක්කේ! මුතු වට්ටිය හම්බවුණා!'

ඒක බලාගෙන හිටිය කාගේ කාගෙත් දෑස් තෙත් වුණා.

'මං කොහොමත් ඔය පොඩි ළමයා පොලිසි ගෙනියන්න හිටියේ නෑ. කාසුගේ හොරකම අල්ලන්න එහෙම කිව්වා මිසක්.' සුභානිලාගේ අම්මා කිව්වා. අම්මා පොලිස් නිලධාරිනි දිහාට හැරුණා. 'මගේ දරුවෝ දෙන්නා ආගිය අතක් නැති එක ගැන නේ අපි බය වුණේ දැන් එයාලත් ඉන්නවා. මුතු වට්ටියත් තියෙනවා. ඉතින් පොලිසි නොයා මේ ප්‍රශ්නේ මෙතනින් ඉවරයක් කරගනිමු. හැබැයි මතක තියාගන්න. මෙතැන සිද්ධ වුණේ හොරකමක්.'

'හොරකමක් නෙවෙයි ඒක මෝඩකමක්' සුරේන් කිව්වෙ කාටත් ඇහෙන්න තරම් සද්දෙන් කැගහලා. සුභානියි සඳුනියි ඇරෙන්න අනෙක් කවුරුත් පුදුමවෙලා සුරේන් දිහා බැලුවා.

'මුතු වට්ටිය හොරකම් කළේ කාසු අයියා නෙවෙයි. ඒක කන්දෙන් පහළට වීසි කළේ මම!'

මොකද එහෙම කළේ කියලා අහන්නත් අමතක වුණා කාටත් පුදුමය වැඩිකමටම. කාසුගේ මූණ රතු වුණා තරහින්. මෙච්චර බොරුවක් කළේ කොහොමද!'

'කාසු අයිය තරහා වෙන්න එපා. ඔයාව හොරකමකට අල්ලන්න හිතාගෙන කළේ නෑ. ඒත් මට ඔය මුතු වට්ටිය පේන්න බෑ! ඒකයි කන්දෙන් පහළට වීසි කළේ.

මුතු වට්ටිය හොරකම් කළා කියලා ඔයාට බනින්න ගත්තට පස්සේ තමයි නංගියි මායි දුවගෙන පහළට ආවෙ ඒක සොයන්න.'

'මොකද පුතා ඔච්චර ලස්සන දෙයකට අකැමැති?' පුදුමයෙන් ඇහුවේ සුභානිලාගේ තාත්තා. අම්මට නම් කතා කරන්නත් අමතක වෙලා.

'මොන ලස්සනක් ද? ඔය මුතු වට්ටිය නිසා අම්මයි තාත්තයි හැමදාම රණ්ඩු වෙනවා. අපිට ඒක එපා වෙලා හිටියේ. දැන් ඕක ගෙදර අරගෙන ගියත් ආපහු ඒකට රණ්ඩු වෙනවා. ඔන්න ඕක වීසි කරලා දාන්නයි තියෙන්නේ කැලේටවත්' සුරේන්ට තරහටම ඇඬෙන්නත් ආවා.

'මුතු වට්ටියේ අලංකාරෙයි වටිනාකමයි ඉස්සරහ අපට අපේ දරුවෝ පේන්නේ නැතුව ගියා. දරුවෝ අසතුටෙන් කියලා අපි දැක්කෙ නෑ.' සුභානිලාගේ තාත්ත කිව්වේ තමන් මෙහෙම දෙයක් කළාද කියලා අදහාගන්න බැරි පුදුමයෙන්.

'ඒක නේන්නං. අපි දරුවන්ට කන්න බොන්න දීලා ඉස්කෝලේ ඇරියට අඩු පාඩු පිරිමැහුවට ගෙදර ඇතුළේ දරුවෝ ඉන්නේ දුකෙන් කියලා අපි දැක්කෙ නෑ.' අම්මාත් කිව්වා.

'ඒ විතරක් ද, උදේ හවා ඕනෑ දේකට අපට උදව් කරන්න එන මේ දරුවො තුන්දෙනාගේ බයත් හිතේ වේදනාවත් මම දැක්කෙ නෑ...' අම්මා කිව්වේ සේපාලි අක්කා දිහා බලලා. 'බලාගෙන ගියාම අපි දෙන්නා මේ මුතු වට්ටියට නේ අපේ ජීවිතේ ලොකුම තැන දීලා තියෙන්නේ' අම්මා ඒ ටික කිව්වේ තාත්තට. වචනෙන් නොකිව්වට අම්මගෙ කටහඬේ තිබුණේ 'දරුවන්ට මීට වඩා කිට්ටු වෙන විදිහට අපි දෙන්නා වෙනස් වෙන්න ඕනෑ නේ ද' කියන අදහස.

'දැන් එතකොට මේක ගෙදර ගෙනිච්චාම මුතු වට්ටිය තියන්නේ සාලෙද? අල්මාරියෙද? මෙතැනින්ම මේක බේරගෙන ගියොත් හොඳයි නේ ද?' ඇහුවේ සුභානි. අම්මයි තාත්තයි මූණෙන් මූණ බලාගත්තා. මුතු වට්ටිය තියන්නේ සාලෙද? අල්මාරියෙද? ප්‍රශ්නෙ ආපහු මුලට ඇවිත්!

ඔය කතාවෙ අග මුල සඳුනිගෙන් දැනගත්ත මාලිකා ටීචර් ඉස්සරහට ආවේ සඳුනිවත් වඩාගෙනමයි. 'ඕකට හරි සරල විසඳුමක් නේ තියෙන්නේ.' මාලිකා ටීචර් කිව්වා. 'වීදුරු කබඩ් එකක් අරගෙන මුතු වට්ටිය ඒකෙ දාලා යතුරු දාලා කබඩ් එක සාලෙ තියන්න!'

ඒක කොපමණ ලේසි විසඳුමක් ද කියනවා නම් කාටවත් ඒක කල්පනා නොවුණු එක ගැන හැමෝටම පුදුමයි!

10
සඳුන් කැටේ - මැණික් කැටේ

මාලිකා ටීචර් එක්ක සඳුනි ගෙදර ආවේ බස් එකේ. ලොකු ගෙදර පුංචි අක්ක මාලිකා ටීචර් මුණගැහෙන්න ඇවිත් අද සඳුනි පාසල් එන්නේ නෑ කිව්ව වෙලාවේ ඉඳන් වුණු දේවල් සඳුනි දැනගත්තේ මාලිකා ටීචර් එක්ක බස් එකෙන් ගෙදර එන අතරෙදියි.



සඳුනි පාසල් නොඑන්නේ ළමයි නමට හිනා වුණු නිසා වෙන්න ඇති කියලා අනුමාන කළ මාලිකා ටීචර් බාලාංශ පන්ති ඉවරවුණු හැටියෙම සඳුනි බලන්න ගියා පාලම්ගොඩට. ලොකු ගෙදර පුංචි අක්කගෙන් තමයි පාර අහගත්තේ. සඳුනි පාසල් ගියා කියලා ආච්චි අම්මා කිව්වාම මාලිකා ටීචර්ට හොඳටම බය හිතුණා. ඒත් ආච්චි අම්මා බය නොකර කිව්වා උප්පැන්න සහතිකයේ තියෙන නම හරිද කියලා දැනගන්නයි ආවේ කියලා. සඳුනි ලොකු ඉස්කෝලෙ ඇරුණාම පුංචි අක්කා එක්ක එයි කියලා ආච්චි අම්මට මතක් කරලා දීලා මාලිකා ටීචර් එතැනින් පිටත් වෙලා කෙලින්ම ආවේ පාසලට. ඇවිත් කෙලින්ම ගියේ විදුහල්පතිනි මුණගැහෙන්න.

විදුහල්පතිනියගේ උපදෙස් පිට මාලිකා ටීචර් ගියා දෙළේතැන්නේ පොලිසියේ ළමා හා කාන්තා ඒකකයට. එතැන නිලධාරිනියට කිව්වාම ඔන්න සඳුනි ගැන විපරම් කරන්න ගත්තා. දවල් වෙනකොට ආරංචියක් ලැබුණා උඩහතැන්නෙත් ළමයි දෙන්නෙක් නැතිවෙලා සොයනවා කියලා. ඉතින් මාලිකා ටීචර් ගියා උඩහතැන්නේ පොලිසියට. සුහානියි සුරේනුයි හොයාගන්න නෑ කියාගෙන ඒගොල්ලන්ගේ අම්මයි තාත්තයි පොලිසියට ඇවිත් හිටියා.

ළමයි කාණ්ඩයක් උඩහතැන්න ගං ඉවුරේ ඉන්නවා එක ළමයෙක් පාසල් ඇඳුමෙන් ඉන්නේ කියලා පොලිසියට දැනගන්න ලැබුණා. ඉතින් එහෙම තමයි මාලිකා ටීචර් අනිත් අයත් එක්ක ගං ඉවුරට ආවෙ.



ඔය විස්තරේ කියලා මාලිකා ටීචර් මෙහෙමත් කිව්වා, 'චූටි දූ ඔයා අද කළේ හරිම අවදානම් වැඩක්. හොඳ වෙලාවට ඔයාට වගකීමෙන් වැඩ කරන ළමයි ටිකක් මුණගැහුණේ. බැරි වෙලාවත් නරක නපුරු වැඩ කරන මිනිස්සු ටිකක් නැත්තං වැරදි පාරේ යන ළමයි ටිකක් මුණගැහුණාන් ඔයාට ගෙදර එන්න පාර හොයාගන්න බැරි වෙන්නත් තිබුණා. කවදාවත් මේ වාගේ වැඩ ආපහු කරන්න එපා.'

'ඔව් ටීචර්. ඒ අක්කලා අයියලා කොච්චර හොඳ වුණත් එක වෙලාවක මට අම්මයි තාත්තයි මතක්වෙලා ගොඩක් දුක හිතුණා. හුස්ම ගන්නත් බැරි වුණා. ආච්චි අම්මටයි සීයා තාත්තටයි නොකියා කොහෙවත්ම යන්නේ නැ නෑමයි කියලා මම එතකොටත් හිතාගත්තා.' සඳුනි කිව්වා.

බස් එක පාලම්ගොඩට හැරෙන තැනට ආවා. බස් එකෙන් බැස්සට පස්සේ මාලිකා ටීචර් ඇහුවා, 'දුව අද වුණු දේවල් ඔක්කොම ආච්චි අම්මටයි සීයා තාත්තටයි කියනවද?'

සඳුනි පාරේ හිටි අඩියේ නැවතිලා කල්පනා කළා. ආච්චි අම්මයි සීයා තාත්තයි තාම දන්නෙත් නෑ සඳුනි අද ඉස්කෝලෙ ගියේ නෑ කියලා. ඉතින් ඒ ගැන කියන්න ඕනෙද? නැද්ද?

සඳුනි මාලිකා ටීචර් දිහා බැලුවා. දූ තමයි ඒක තීරණය කරන්න ඕනෑ කියන්නා වාගේ මාලිකා ටීචර් මොනවත්ම නොකියා බලා හිටියා. මොකද කරන්නේ කියලා සඳුනිට හිතාගන්නත් අමාරුයි. කිව්වොත් බනීද? සඳුනිගේ පපුව ඩිග් ඩිග් ඩිග් ගෑවා බයට. අද වුණු දේ නොකිව්වොත්..? නොකිව්වොත් ආච්චි අම්මගෙනුයි සීයා තාත්තාගෙනුයි හැමදම බොරුවක් හංගගෙන ඉන්න වෙනවා. කොහොමද එහෙම කරන්නේ?

'මම කියනවා ඔක්කොම. ටිකක් බනී... ටිකක් නෙවෙයි ගොඩක් බනී ද දන්නෙත් නෑ. වෙච්චි දේ ගැන ඇත්තම කියන එක අමාරුයි තමයි. ඒත් ඇත්ත කියන එක තමයි අමාරු වුණාත් ලේසි.' සඳුනි කිව්වා.

'ඒක හරියටම හරි. අමාරු වුණාත් හරි දේ කළොත් තමයි ලේසි.' මාලිකා ටීචර් එකඟ වුණා.

ඊට පස්සේ මාලිකා ටීචර් එහෙම ඇත්ත කියන එක වඩා හොඳ ඇයි කියන කාරණේ ගැන සඳුනිත් එක්ක කතා කළා. 'චූටි දූ, ඔයාට ප්‍රශ්නයක් කරදරයක් වුණොත් උදව් කරන්න නං අම්මා තාත්තා වාගෙම ඔයා ළඟින්ම ඉන්න, ඔයාට විශ්වාස ආච්චි අම්මායි සීයායි ඔයා ගැන දැනගෙන ඉන්න ඕනෑ. ඔයාට දුක හිතෙන වෙලාවල්, බය හිතෙන වෙලාවල්, ඔයාගේ හිතට කරදරයක් ප්‍රශ්නයක් වුණොත් එහෙම නැත්තං ඔයා මොනවා හරි වැරැද්දක් කරලා ඒ නිසා කරදරයක් වෙන්න යනවා නම්, කවුරු හරි ඔයාව බය කරලා අකැමැති දේ කරන්න කියනවා නම් ඒ වාගේ දේවල් අම්මා තාත්තාට හරි සීයාට ආච්චි අම්මට කියන එක තමයි හොඳම. එතකොට ටිකක් බැන්නත් ඒගොල්ලන්ට පුළුවන් ඔයාට උදව් කරන්න. එහෙම කියන්න බැරි වෙලාවකදී ඉස්කෝලේ ඔයාට විශ්වාස ටීචර් කෙනෙකුට වුණත් කියන්න පුළුවන්.'

'මාලිකා මිස් වාගේ ටීචර් කෙනෙකුට!' සඳුනි කිව්වෙ මූණ එළිය කරන පුංචි හිනාවක් එක්ක.

ඔන්න කතාවෙන් කතාවෙන් ලොකු ගෙදර ළඟටම ඇවිල්ලා. ආච්චි අම්මා ලොකු ගෙදර කිට්ටුව බලාගෙන ඉන්නවා සඳුනි ගෙදර එනතුරු. සඳුනි මාලිකා ටීචර් දිහා හැරිලා බැලුවේ මාත් එක්ක එන්න කියන්න වාගේ. ඊළඟට එයා දුවගෙන ගිහින් ආච්චි අම්මගේ අතේ එල්ලුණා.

'මේ ගෙදර පුංචි දූ කිව්වා මාලිකා ටීචර් අපේ චූටි දූ එක්කගෙන එයි කියලා. යමු මිස් ගෙදරට ගොඩවෙලා තියෙන හැටියට බත් කටක් කාලාම යන්න.' ආච්චි අම්මා මාලිකා ටීචර්ට ආරාධනා කළා.

'යමු. යමු. බත් කන අතරේ සඳුනි දුවට කියන්න ලොකු විස්තරයකුත් තියෙනවා.' මාලිකා ටීචර් ආරාධනය පිළිගත්තා. අද දවසේ වුණු දේවල් ආච්චි අම්මටයි සීයා තාත්තටයි කියද්දී මාලිකා ටීචර් ළඟ ඉන්න එක ගැන සඳුනිට සන්තෝසයි. බයෙන් සැකෙන්, කියන්න අමාරු කතාවක් කාට හරි කියනකොට කරුණාවෙන් උදව් කරන කෙනෙක් ළඟින් ඉන්න එක ලේසියි නේ. මාලිකා ටීචර් ඉන්න වෙලාවේ අද වුණු දේ ගැන කියන්න ලැබෙන එක ගැන දැනුණු සැනසීමෙන් සඳුනි මාලිකා ටීචර්ගෙත් අතක් අල්ලාගත්තේ ආච්චි අම්මාගේ අත අත්නොහැරමයි.

ඒ දෙන්නට මැදිවෙලා සඳුනි ගෙදර ආවේ පුංචි සිංදුවක් හිතෙන් ගයමින්.



මැණික් කැටේ වගේ ළමයෙක්

සඳුන් කැටේ වගේ ළමයෙක්

සබන් කැටේ වගේ නෙවෙයි

හරිම වටින - සඳුන් කැටේ වගේ ළමයෙක් වෙනවාමයි මං!


ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை
National Child Protection Authority
9 786246 237011
Childline Sri Lanka
1929